කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

# Ministry of Industries



# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# Progress Report 2022

# ප්‍රගති වාර්තාව - 2022

**මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.**

# නායකත්වය සහ මග පෙන්වීම



**ගරු වෛද්‍ය රමේෂ් පතිරණ**

**අමාත්‍ය, කර්මාන්ත අමාත්‍යාංශය**



**ගරු ප්‍රසන්න රණවීර**
රාජ්‍ය අමාත්‍ය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන



**ගරු චාමර සම්පත් දසනායක**
රාජ්‍ය අමාත්‍ය, ප්‍රාථමික කර්මාන්ත



**ජේ.එම්. තිලකා ජයසුන්දර**
ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය

# දැක්ම

“ගෝලීයව තරඟකාරී, තිරසර සහ සුවිශේෂී ශ්‍රී ලාංකීය නිෂ්පාදන කර්මාන්ත අංශයක්”

# මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය ඉහළ වෙළඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් තහවුරු කිරීම"

# අරමුණු

- නිෂ්පාදන කර්මාන්ත අංශයේ සියළුම පාර්ශවකරුවන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම උදෙසා හිතකර ව්‍යුහයක් ගොඩනැගීම.

- නිෂ්පාදන කර්මාන්ත අංශයේ තාක්ෂණ භාවිතාවන්, අගය එකතු කිරීම, නිෂ්පාදන විවිධාංගීකරණය, දේශීය සම්පත් භාවිතය සහ තිරසර බව ඉහළ නැංවීම.

- සැමට ප්‍රතිලාභ සලසන කාර්මික සංවර්ධනයක් සහතික කිරීම සඳහා ප්‍රාදේශීය කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය සහ ආයෝජන අවස්ථා පුළුල් කිරීම.

- කර්මාන්ත අංශයේ දේශීය සහ ගෝලීය වෙළෙඳපොල ප්‍රවේශය ඉහළ නැංවීම.

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ

- ප්‍රතිපත්ති සංවර්ධන අංශය
- කර්මාන්ත සංවර්ධන අංශය
- සංවර්ධන අංශ 1
- සංවර්ධන අංශ 2
- සංවර්ධන අංශ 3
- කර්මාන්ත ලියාපදිංචි අංශය
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
- පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
- පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත අංශය
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය

## අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
- ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
- පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ් (PCCL)
- ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
- ජාතික ලුණු සමාගම (NSL)
- ජාතික කඩදාසි සමාගම (NPCL)
- බි සී සී ලංකා ලිමිටඩ් (BCC)
- ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)
- සී/ස ලංකා සිමෙන්ති සමාගම
- සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL)
- ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
- පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
- ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
- ජාතික ශිල්ප සභාව (NCC)
- සීමාසහිත ලංකා සළුසල (LSL)
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

# පටුන


| | |
|---|---|
| පෙරවදන | |
| කර්මාන්ත අමාත්‍යාංශය මඟින් සම්මත කරගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණ | 1-8 |
| **ප්‍රධාන අංශ** | **9-10** |
| ප්‍රතිපත්ති සංවර්ධන අංශය | 11-13 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 14-18 |
| සංවර්ධන අංශ 1 | 19-23 |
| සංවර්ධන අංශ 2 | 24-26 |
| සංවර්ධන අංශ 3 | 27-30 |
| කර්මාන්ත ලියාපදිංචි අංශය | 31-33 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය | 34-35 |
| පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය | 36-39 |
| පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය | 40-42 |
| මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත අංශය | 43-46 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය | 47-52 |

| | |
|---|---|
| **දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා** | 53-54 |
| ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) | **55-60** |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) | **61-68** |
| පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් (PCCL) | **69-73** |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL) | **74-77** |
| ජාතික ලුණු සමාගම (NSL) | **78-79** |
| ජාතික කඩදාසි සමාගම (NPCL) | **80-81** |
| ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් (LMSL) | **82-84** |
| ලංකා පිගන් සංස්ථාව (CCC) | **85-88** |
| බි සී සී ලංකා ලිමිටඩ් (BCC) | 89-95 |
| ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC) | **96-97** |
| සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL) | **98-99** |
| ලංකා ලේලන්ඩ් සමාගම (LLL) | **100-101** |
| පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI) | **102-104** |
| ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA) | **105-107** |
| ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC) | **108-110** |
| ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB) | **111-112** |
| ජාතික ශිල්ප සභාව (NCC) | **113-114** |
| සීමා සහිත ලංකා සළුසල (LSL) | **115-117** |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) | **118-121** |
| මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI) | **122-124** |
| **මූල්‍ය ප්‍රගතිය** | 125-126 |
| කර්මාන්ත අමාත්‍යාංශය | **127-131** |
| පේෂ කර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය | **132-135** |
| මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත අංශය | **136-137** |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය | **138-142** |

# පෙරවදන

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේදී කර්මාන්ත අමාත්‍යාංශයට විශාල කාරයයභාරයක් පැවරී ඇත. අමාත්‍යාංශයේ විෂය පථයට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් දේශීය ආර්ථික සංවර්ධනයට කර්මාන්ත අංශයේ දායකත්වය ඉහලම මට්ටමින් ලබාදිම අමාත්‍යාංශයේ ප්‍රමුඛ අපේක්ෂාවයි.

පැවති කොවිඩ් වසංගත තත්වය සහ පවත්නා ආර්ථික අවපාතය වැනි බාධක හමුවේ වුවද කර්මාන්ත සංවර්ධනය සඳහා විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය මැදිහත් වීම තුලින් නිෂ්පාදන කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය සඳහා විවිධ අයුරින් දායක වී ඇත. මේ සඳහා අමාත්‍යාංශය සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විශාල කාරයභාරයක් ඉටු කරනු ලබයි.

නිෂ්පාදන කර්මාන්ත සඳහා හිතකර නෛතික හා නියාමන රාමුවක් සකස් කිරීමට පියවර ගෙන ඇති අතර කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කර්මාන්ත සංවර්ධනය වඩාත් කාර්යක්ෂමව කිරීම සඳහා කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය කිරිම මේ අතර ප්‍රමුඛ ස්ථානයක් ගනි.

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් කේන්ද්‍රගත වී ඇති කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ආයෝජන දිරි ගැන්වීමට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීම සඳහා වූ වැඩසටහන් ගණනාවක් අමාත්‍යාංශය ක්‍රියාත්මක කර ඇත.

දේශීය ආර්ථිකයේ කොඳු නාරටිය බඳු ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රය ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය වැඩසටහන් හා ව්‍යාපෘති රැසක්ද අමාත්‍යංශය මඟින් ක්‍රියාවට නංවා ඇත.

දේශීය කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් මුහුණ දෙන අමුද්‍රව්‍ය, බලශක්තිය සහ ඉන්ධන ආශ්‍රිත ගැටළු නිරාකරණයට අවශ්‍ය මැදිහත්වීම තුලින් තිරසර කාර්මික සංවර්ධනයක් ලඟා කර ගැනීමට අවශ්‍ය දායකත්වය අමාත්‍යාංශය විසින් ලබා දී ඇත.

ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතය, අගය එකතු කිරිම මෙන්ම අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායන් ලාභ ලබන සහ වානිජමය ශක්‍යතාවයකින් හෙබි ව්‍යවසායන් ලෙස ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර රාශියක් අමාත්‍යාංශය මඟින් හඳුන්වා ඇත.

විනිවිද බවින් යුත් නව විකුණුම් ක්‍රමවේද හඳුන්වාදීම තුලින් ඛනිජවැලි සඳහා උපරිම ආදායමක් ලබා ගනිමින් රටෙහි පවතින විදේශ විනිමය අර්බුදය විසඳීමට යම් ආකාරයෙන් හෝ දායකවීමට ලැබීම අමාත්‍යාංශය ලද ජයග්‍රහනයකි.

# දේශීය නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණ

## 1.නිෂ්පාදන කර්මාන්ත සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම

### 1.1 කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම

කර්මාන්ත ක්ෂේත්‍රයට අවශ්‍ය සහතිකවීමක් හා මඟපෙන්වීමක් ලබා දෙන්නා වූ හිතකර ව්‍යාපාරික පරිසරයක් බිහිකරලීම මඟින් සියලු ජනතාවට ප්‍රතිලාභ අත්වන කර්මාන්ත අංශයක් බිහිකිරීම තුලින් රටේ ආර්ථිකය, කාර්මික අංශයේ 4.0 මට්ටමට ඉහළ නංවාලීම අරමුණු කර ගනිමින් කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමට මූලික කෙටුම්පත මේ වන විටත් සකස් කොට අවසන් කර ඇති අතර, ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගෙන් අදහස් ලබා ගන්නා ලදී. එම සංශෝධිත කෙටුම්පත සඳහා මහජන අදහස් විමසීමෙන් පසු අවසන් කෙටුම්පත, අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇති අතර මේ වන විට පහත සඳහන් අංග ඇතුලත් කර්මාන්ත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුමෙහි කෙටුම්පත, සකස් කර ඇත:

- උපායමාර්ග, ක්‍රියා පටිපාටි, කාල රාමුව, හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල හා බලපෑම්ද, කාර්ය සාධන දර්ශකද වගකීම් ද ඇතුලත් ක්‍රියාකාරී සැලසුම් රාමුව
- ඇගයීම හා නියාමනය පිළිබඳ ක්‍රමවේදය
- කලින් කල ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය පිළිබඳව පසු විපරම් කිරීමේ ක්‍රමවේදය

### 1.2 ශ්‍රී ලංකාවේ වාහන නිෂ්පාදනය, එකළස් කිරීම සහ වාහන උපාංග නිපදවීම පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP)

SOP යනු දේශීයව වාහන එකලස් කිරීම සඳහා වන සියලුම මාර්ගෝපදේශ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි ඇතුලත්, 'දේශීය අගය එකතු කිරීමේ න්‍යායය' අන්තර්ගත කොට කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් සකස් කරන ලද අත්පොතකි. මෝටර් රථ කර්මාන්තය දියුණු කිරීම සහ රට තුළ නව රැකියා අවස්ථා ඇති කිරීම සඳහා දේශීයව නිෂ්පාදිත උපාංග සහිත වාහන දේශීයව එකලස් කිරීම ප්‍රවර්ධනය කිරීමට කර්මාන්ත අමාත්‍යාංශය SOP හරහා විශාල උත්සාහයක් දරයි.

2022 වසර තුළ සැප්තැම්බර් මස දක්වා නව වාහන මාදිලි දාහතරක් (14) ක් ඇතුළුව වාහන මාදිලි හතලිස් පහක් (45) ක් එකලස් කිරීම සඳහා ආයතන දහ අටක් (18) අනුමැතිය ලබාගෙන ඇති අතර 2022 වසර සඳහා ලියාපදිංචි නව ආයතන සංඛ්‍යාව දහයකි (10).

ඒ අනුව, 2022 ජනවාරි මස සිට සැප්තැම්බර් 30 දක්වා මෝටර් වාහන 7,739 ක් (සිව්රෝද රථ 1,957ක් සහ ද්වීරෝද රථ 5,782කි) එකලස් කර ඇත. රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ සහ වාහන ආනයනය කිරීමේ සීමාවන් තිබියදී, සම්මත මෙහෙයුම් පටිපාටිය මඟින් මෙරට මෝටර් රථ කර්මාන්තයේ උන්නතිය සඳහා නව දොරටු විවර කර තිබේ.

## 1.3 දේශීය තුනී ලෑලි කර්මාන්තය ආරක්ෂා කිරීම සුදුසු සෙස් බද්දක් පැනවීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම

අගය එකතු කිරීමකින් තොරව තුනී ලෑලි පතුරු (Veneer) වශයෙන් අපනයනය කිරීම තුළින්, දේශීය තුනී ලෑලි නිෂ්පාදනයට අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය වන රබර් දැව හිඟයක් ඇති වී තිබීමත් මේ හේතුවෙන් දේශීය තුනී ලෑලි මිල ඉහළ යෑමත් සිදු වී ඇත. එසේම දැනට කර්මාන්තකරුවන් 27 ක් පමණ දේශීය තුනී ලෑලි නිෂ්පාදනය කරන අතර මෙම කර්මාන්තකරුවන් ද තුනී ලෑලි නිෂ්පාදනය කිරීමකින් තොරව තුනී ලෑලි පතුරු (Veneer) වශයෙන් අපනයනය කිරීමට පෙළඹුනහොත් දේශීය තුනී ලෑලි කර්මාන්තය කඩා වැටීමේ තර්ජනයක් ඇතිවිය හැකි බවත් හඳුනාගෙන ඇත. එමඟින් දේශීය තුනී ලෑලි කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා කිසිදු කර්මාන්ත ආයතනයක් සඳහා අගය එකතු කිරීමකින් තොරව, රබර් දැවයෙන් නිෂ්පාදිත තුනී ලෑලි පතුරු (Veneer) වශයෙන් අපනයනය කිරීම තහනම් කිරීම හා දැනට අගය එකතු කිරීමකින් තොරව තුනී ලෑලි පතුරු (Veneer) වශයෙන් අපනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගතව ඇති ආයතන සඳහා සුදුසු සෙස් බද්දක් පැනවීම සඳහා යෝජනා කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතීත්වය යටතේ පත් කරන ලද කමිටුව විසින් තීරණය කර ඇත.

## 1.4 දේශීය නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා වූ උපදේශක සභා පිහිටුවීම

පෙර පැවති කර්මාන්ත උපදේශක සභාවල ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් දේශීය කර්මාන්ත ශක්තිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව සපුරාලීම මත කර්මාන්ත අංශ සඳහා නව උපදේශක සභා 20ක් පිහිටුවීමට පියවර ගන්නා ලදී.මේ වන විටත් බොහෝ අංශ සඳහා උපදේශක සභා පිහිටුවා ඇති අතර, උදාහරණ වශයෙන් ඇඟලුම්,රෙදිපිළි සහ ඒ ආශ්‍රිත කර්මාන්ත, ස්වර්ණාභරණ සහ මැණික් ආශ්‍රිතකර්මාන්ත, ලෝහ, ඩයි, අච්චු යන්ත්‍රෝපකරණ හා උපාංග සහ අදාළ කර්මාන්ත, කිරි සහ කිරි ආශ්‍රිත කර්මාන්ත සහ තීන්ත සහ මුද්‍රණ ආශ්‍රිත කර්මාන්ත ආදිය දැක්විය හැකිය.

## 1.5 ආනයන සීමා කිරීම තුළින් දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සපයා ගැනීමේදී සිදුවූ බාධාවන් ඉවත් කිරීම

රටේ පැවති කොවිඩ් හා ආශ්‍රිත අගුළු දැමීම් (Lock down) හේතුවෙන් රට තුළ විනිමය අනුපාතිකය ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා රජය විසින් විටින් විට ආනයන සීමා පනවන ලදී. කෙසේ වෙතත් මෙසේ සීමා පනවන ලද ඇතැම් ද්‍රව්‍ය දේශීය කර්මාන්තකරුවන් විසින් අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන ඒවා බැවින් ඍජුවම දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයට බලපෑමක් ඇති විය. එම ගැටලුව නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශය මැදිහත් වූ අතර අමුද්‍රව්‍ය බාධාවකින් තොරව කර්මාන්තකරුවන්ට ලබා ගත හැකි වන පරිදි ආනයන සීමා ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලදී. ඒ අනුව ලෝහ, ඇසුරුම් හා රූපලාවන්‍ය කර්මාන්ත වැනි ක්ෂේත්‍රයන්ට මෙමඟින් සහන සැලසිනි.

## 1.6 ලෝහ ආශ්‍රිත කර්මාන්තවල නිෂ්පාදනයෙන් ඉවත් කරනු ලබන අබලි ලෝහ අපනයනය තහනම් කිරීම

දේශීය නිෂ්පාදකයා දිරිගන්වා නව කර්මාන්තශාලා පිහිටුවීමට දේශීය කර්මාන්තකරුවන් පෙළඹවීමේ අරමුණින්යකඩ, තඹ, ඇලුමිනියම්, සුදු යකඩ, අධි කාබන් යකඩ, විනච්චට්ටි යන ලෝහ වල අබලි ලෝහත් ඇලුමිනියම් කුට්ටි සහ සින්ක් කුට්ටි හා තඹ කම්බි අපනයනය 2020.07.09 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවීම නිසා දේශීය නිෂ්පාදකයන්ට අවශ්‍ය ලෝහ වර්ග රට තුළින්ම සපයාගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.මේ වන විට අමාත්‍ය මණ්ඩල

තීරණයෙහි අනුමැතිය ලබා දි ඇතිඅබලි ලෝහ වර්ග හැර අනෙක් අබලි ලෝහ අපනයනය තහනම් කර ඇත.ඒ අනුව මේ වන විටත් මල නොබැදෙන වානේ හා ඇලුමිනියම් වැනි අමුද්‍රව්‍ය සකස් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන්හි පිබිදීමක් සිදුවී ඇත. එමෙන්ම ඉහත ලෝහ අමුද්‍රව්‍ය ලෙස ආනයනය කර නිෂ්පාදනය සිදුකරන ආයතන වලින් ඉවත් කරනු ලබන අබලි අපනයනය කිරීමෙන් ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමට හැකියාවක් ඇති බවට අමුද්‍රව්‍ය ආනයනය කරන නිෂ්පාදනකරුවන්ගෙන් ඉල්ලීම් ලැබී ඇත.

## 1.7 පිටරටින් ආනයනය කරමින් පැවති හඳුන්කූරු නිෂ්පාදන සඳහා යොදා ගන්නා කූරු සහ අමුද්‍රව්‍ය දේශීයව නිපදවීම

හඳුන්කූරු නිෂ්පාදනය සඳහා යොදාගන්නා විශේෂිත උණබට කූරු අවශ්‍යතාවය රට තුළින්ම සපයා ගැනීම අරමුණු කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.මෙම විශේෂිත උණශාක පවතින ප්‍රදේශ හඳුනා ගැනීම හා ඒවා වගාකළ හැකි ඉඩම් හඳුනා ගෙන ඒ සඳහා අවශ්‍ය උපදෙස් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය වෙත මේ වන විටත් ලබා දී ඇත.

මෙහිදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මොරටුව විශ්වවිද්‍යාලය හා එක්ව ගංගා ආශ්‍රිතව උණ වගා කර ඇති ස්ථාන සඳහා ඩෝන තාක්ෂණය ඔස්සේ සංගණනයක් සිදු කර වාර්තාවක් ලබා දී ඇත. දේශියව පවතින උණ ශාක ප්‍රමාණය දේශිය හඳුන්කූරු නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් වන තෙක් ආනයනයට අවසර ලබා දී ඇත. එමෙන්ම දැනට ලංකාව තුල පවතින උණ ශාක අතරින් කුමන උණ විශේෂය මෙම හඳුන්කූරු නිෂ්පාදනයට සාර්ථකව යොදා ගත හැකිද යන්න පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් වාර්තාවක් සැකසීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත යොමු කර ඇත.

## 1.8 පේෂකර්ම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමට අවශ්‍ය තීරුබදු සහන ලබා ගැනීම.

ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබාදෙන ප්‍රධාන එක් මාර්ගයක් වනුයේ ඇඟළුම් ක්ෂේත්‍රයයි. ඇඟළුම් නිෂ්පාදකයන් මුහුණ පෑ ආර්ථික අර්බුදය හමුවේ ඇඟලුම් නිෂ්පාදකයින්ට ආනයන සීමා නිසා මුහුණ පෑ දුෂ්කරතා සඳහා පිළියම් ලෙස දේශීයව නිෂ්පාදනය නොවන, ඇඟළුම් නිෂ්පාදනයේදී අගය එකතු කිරීමට අවශ්‍ය උපාංග අතුරින් තෝරා ගත් පහත සඳහන් උපාංග වර්ග 17 ක් ආනයනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත තීරුබදු සහන ලබා දීමට කටයුතු කර ඇත. තරඟකාරී මිලට ඇඟළුම් නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොල වෙත ලබාදීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

1. ලෝහ බොත්තම්
2. ලෝහ රිවට්ස්
3. ලෙදර් පැචස් 01වන වර්ගය
4. ලෝහ බැජස්
5. ප්ලාස්ටික් බොත්තම්
6. කෆ්ලින්ක්ස්
7. ලෝහ සිපර්
8. නයිලෝන් සිපර්
9. පිත්තල වලින් සෑදු පින්
10. පිත්තල වලින් සෑදු කොකු සහ බාර්
11. ලෙදර් පැචස් 02 වන වර්ගය
12. ගාංචු (බකල්)
13. කොලර්ස් සහ කෆ්ස්
14. ලෙදර් බෙල්ට්
15. ප්ලාස්ටික් කවර් ස්ට්‍රින්ග් කොඩ්ස්
16. ඇප්ලික්ස්
17. රේන්ද (ලේස්)

## 2. බිඳ වැටී ඇති රාජ්‍ය ව්‍යවසාය යලි නඟා සිටුවීම, ඛනිජ සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතය සහ දේශීය අගය එකතු කිරීම

### 2.1 ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම.

ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම ට අදාල ගිවිසුම 2022.03.09 දින සී/ස ජාතික කඩදාසි සමාගම හා ඊට අදාල ආයෝජක

සමාගම වන KSPA Embilipitiya Paper Mills (Pvt) Ltd. අත්සන් තබා ඇත. කම්හලෙහි අළුත්වැඩියා කටයුතු සහ විදුලි සබඳතාවය ලබා ගැනීමෙන් මාස 18 කට පසුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය. ආයෝජනය කරන මුදල රු.බිලියන 3.5 කි. අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 74250 කි.

### 2.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව පවතින ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත සී/ස ජාතික කඩදාසි සමාගම වෙත පවරා ගැනීම.

ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම ( අක්කර 111 රූඩ් 02 පර්චස් 33) 2021.10.13 දින සිට වසර 30 කාලසීමාවක් සඳහා සී/ස ජාතික කඩදාසි සමාගම වෙත දීර්ඝ කාලීන බදු පදනම මත පවරා දීමට අදාල බදු ඔප්පු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 2022.03.08 දින සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දී ඇත.

### 2.3 කුරුන්වන්තිවු (අලිමංකඩ - උතුර) ලුණු ලේවාය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ නැවත ආරම්භ කිරීමේ ව්‍යාපෘතිය.

මෙම ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් වූ විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා ව්‍යාපෘති කමිටුව විසින් ඇගයීම් කර තෝරා ගැනීමට නිර්දේශ කරන ආයෝජක සමාගම පිළිබඳ තොරතුරු, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

### 2.4 කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය මඟින් කැණීම් කිරීමෙන් ලබා ගන්නා මිනිරන් සඳහා රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය මත පදනම්ව අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම.

ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ තිරීමට පෙර කහටගහ පතලෙහි පවතින මිනිරන් සංචිතය පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට තීරණය කර ඇත.මීට අදාල ව සිතියම්ගත කිරීමේ පළමු අදියර භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අවසන් කර ඇති අතර දෙවන අදියර වන විදුම් අදියර එම කාර්යාංශය සතු අරමුදල් වලින් මාස 03 ක කාලසීමාවක් තුළ අවසන් කර ඊට අදාල වාර්තාව ඉදිරිපත් කරන ලෙස 2022.09.13 දිනැති තීරණය ට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.

**2.5 සී/ස ජාතික කඩදාසි සමාගම සතු වාලච්චේන කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු විවිධාංගීකරණ ව්‍යාපෘතියක් වශයෙන් නැවත ආරම්භ කිරීම.**

වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු සී/ස ජාතික කඩදාසි සමාගම විසින් 2020.07.01 දින සිට ආරම්භ කර ඇත. 2021 වර්ෂයේ දී මෙම කම්හලෙහි සාමාන්‍ය මාසික කඩදාසි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 100 ක් පමණ වන අතර සහ 2022 වර්ෂයේ දී එය මෙට්‍රික් ටොන් 117 ක් පමණ වේ.

**2.6 යූරියා පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් සිදු කිරීමට අදාළව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.**

යූරියා නිෂ්පාදනය සිදු කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගමේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික (පුද්ගලික) සමාගම වෙතින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. කෙසේ වෙතත්,මේ සම්බන්ධයෙන් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම වඩාත් සුදුසු බව මුදල් අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇති අතර ඒ පිළිබඳව අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම් දීම සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයට අදාළව වියදම් ඇස්තමේන්තුව සකස් කර ඉදිරිපත් කරන ලෙස සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම වෙත දැනුම් දී ඇත.

**2.7 කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලා පරිශ්‍රයෙහි ඇති ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ඉවත් කර කර්මාන්ත ශාලා පරිශ්‍රය පිරිසිදු කිරීම.**

මීට අදාලව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කෙරෙන ටෙන්ඩර් කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කර ඇති අතර මෙම පරිශ්‍රයෙහි පවතින ඉවත් කිරීමට නිර්දේශිත ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ,ව්‍යුහයන් හා අබලි ලෝහ අනුමත ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ අපහරණය කිරීම සඳහා වන තාක්ෂණ කමිටු වාර්තාව සකස් කර ඇත.

**2.8 පරන්තන්හි පැරණි රසායනික කම්හල පිහිටි ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම වෙත පවරා ගැනීම.**

කිළිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන්හි පැරණි රසායනික කම්හල පිහිටි ඉඩම සී/ස පරන්තන් කෙමිකල්ස් කම්පැණි ලිමිටඩ් වෙත දීර්ඝ කාලීන බදු පදනම යටතේ පවරා දීම සඳහා කටයුතු කිරීම ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ආරම්භ කර ඇත.

**2.9 ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය මඟින් කැණීම් කර සපයනු ලබන ඛණිජ වැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම.**

චීනය, ඉන්දියාව, ඒක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕස්ට්‍රේලියාව ඇතුළු රටවල් 13 ක ආයෝජකයින් විසින් අභිලාෂය පළ කිරීමේ යෝජනා ඉදිරිපත් කර ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත ත්‍රිකුණාමලය දිසිත්‍රික්කයේ කප්පල්තුරෙයි ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු අක්කර 125 ක පමණ විශාලත්වයෙන් යුතු ඉඩම ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී.

### 2.10 හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරින්ද මාගම වෙරළ තීරයේ පවතින ඛණිජ වැලි ග්‍රිඩ් ඒකක හත ගවේශණ හා කැණීම් කටයුතු වෙනුවෙන් ලංකා ඛණිජ වැලි සමාගම වෙත වෙන් කර ගැනීම.

යෝජිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රදේශයේ ආගමික නායකයින්, දේශපාලන අධිකාරිය සහ එම ප්‍රදේශයේ ජනතාව සමඟ සාකච්ඡා පවත්වා ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි මීට අදාල ශක්‍යතා අධ්‍යනය සිදු කිරීමට කටයුතු කරන ලෙස ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් ආයතනය වෙත දැනුම් දී ඇත.

### 2.11 ලංකා ඛණිජ වැලි සමාගමේ ඛණිජ වැලි විකිණීම සඳහා නව විකිණුම් ක්‍රමවේදයක් සකස් කිරීම.

නව විකුණුම් ක්‍රමවේදය සකස් කර අවසන් කර ඇති අතර 2022.08.03 දින එම ක්‍රමවේදය අනුව ඛනිජ වැලි විකිණීමේ පළමු ටෙන්ඩරය ක්‍රියාත්මක කිරීම සඳහා ලංසු කැඳවීමේ නිවේදන නිකුත් කර ඇත. 2022.08.23 දින ලංසු විවෘත කිරීම සිදු කරන ලද අතර ටෙන්ඩරය සඳහා ලංසුකරුවන් දොළොස් දෙනෙකු (12) ඉදිරිපත් වූහ. ඉල්මනයිට් මෙට්‍රික් ටොන් එකක් සඳහා ඉදිරිපත් වූ වැඩිම මිල ඇ. ඩොලර් 285 කි. හයිටයි ඉල්මනයිට් හා රූටයිල් සඳහා මෙට්‍රික් ටොන් එකක් වෙනුවෙන් ඉදිරිපත් වූ වැඩිම මිල පිළිවෙළින් ඇ. ඩොලර් 404 හා ඇ. ඩොලර් 2,005 වේ. මෙම ටෙන්ඩරය යටතේ ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 60,000 ක්ද ඇතුළුව ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 62,150 ක් අලෙවි කරන ලද අතර උපයන ලද මුළු ආදායම ඇ. ඩොලර් මිලියන 20.33 කි.

---

## 3.නිෂ්පාදන කර්මාන්ත නඟා සිටුවීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය

### 3.1 රෙදිපිළි නිෂ්පාදන ආශ්‍රිත ව්‍යවසායකයන් සඳහා වූ සුවිශේෂිත කර්මාන්ත කලාපයක් එරාවූර් ප්‍රදේශයේ ආරම්භ කිරිම

මෙම කර්මාන්තපුරය සඳහා මාර්ග සංවර්ධනය, විදුලි පහසුකම් ලබාදීම, ජල පහසුකම් ලබාදිම හා අපජලය මුහුදට බැහැර කිරීමේ පද්ධතිය සකස් කිරීම හා වාලච්චේන කඩදාසි කම්හලේ ඇති ජල පිරිපහදුව පිළිසකර කර ජලය ලබාදීමේ ධාරිතාව ඉහළ නැංවීම යන කාර්යයන් ප්‍රධාන සංවර්ධන කාර්යයන් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව විදුලිය, ජලය, මාර්ග ඇතුළු යටිතල පහසුකම් සැපයීමේ වැඩ කටයුතු 75%කින් අවසන් කර ඇත.ජලනල එළීම, ජලනල පද්ධතිය සකස් කිරීමේ කටයුතු 80%කින් අවසන් කර ඇත.

### 3.2 කටුනායක කර්මාන්තපුරය ස්ථාපිත කිරිම

මෙම කර්මාන්තපුරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරිම සඳහා ඉඩම් කොටස නිශ්චය කරගැනීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එකඟතාවයකට පත්වී ඇති අතර මැනුම් කටයුතු 2022.08.10 වන විට ආරම්භ කර ඇත.

### 3.3 වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කර්මාන්ත කලාපයක් ස්ථාපනය කිරිම

මෙම ඉඩම අත්පත් කරගැනීමට සඳහා එම ඉඩම අයත් වැව්ලි සමාගම වෙත වන්දි මුදල ගෙවීම සිදුකල යුතු බැවින් එයට අදාළව ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් අනුමැතිය ලබාගැනිම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනිමට යොමු කර ඇත.

## 3.4. 2022 වර්ෂය සඳහා වන අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිම

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ස්ථානගත කිරීම සහ නව ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් ආයොජන අවස්ථා ලබා දීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මෙහි පළමු අදියර යටතේ දිවයින පුරා කර්මාන්තපුර 10ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මෙහි මූලික කටයුතු ලෙස ඉඩම මැනීම් කටයුතු සහ මයිම් වැට සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. එම කර්මාන්තපුර 10 ලෙස දිවුලපිටිය, බුලත්සිංහල, දඹුල්ල, දිඹුලාගල, රඹෑව, මහව, මහවැව, දික්වැල්ල, සූරියවැව, ත්‍රිකුණාමලය නගර හා කඩවත් හා වැල්ලවාය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල මෙම ඉඩම් හඳුනාගෙන ඇත.

## 3.5 දකුණු පළතේ කර්මාන්ත සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් වරාය ආශ්‍රිත කර්මාන්ත කලාපයේ සංවර්ධනය සඳහා පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් (OneStop Shop) පිහිටුවීම.

මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ සියළු ක්‍රියාමාර්ග ගෙන අවසන් වන අතර මෙම මධ්‍යස්ථානය මේ වන විට ආරම්භ කර කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවත්වාගෙන යනු ලබයි.

## 3.6 ශ්‍රී ලංකාවේ වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම.

කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය තුල වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. මෙම මධ්‍යස්ථානය ස්ථාපිත කර වාෂ්ප ජනක යන්ත්‍ර සඳහා අනුමැතිය ලබා දීම, තාක්ෂණය ලබා දීම, පුහුණු කිරීම් සහ නියාමන කටයුතු සිදු කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබේ.මේ වන විට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අදාල පාර්ශවකරුවන් සමඟ පැවති සාකච්ඡා වලින් පසුව වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා අනුමැතිය ලැබී ඇත.. වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සම්මත මිනුම් පටිපාටිය (SOP) මේ වන විට සැකසෙමින් පවතී.

## 3.7 රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීම.

මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා ඉහළ දායකත්වයක් සැපයිය හැකි අංශයක් ලෙස හඳුනාගෙන ඇත. විදේශීය ගැනුම්කරුවන් ආකර්ෂණය කර ගත හැකි වන පරිදි මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළ සියලුම සේවාවන් එනම්, මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ සැල් වලට අමතරව මැණික් සහතික පත්‍ර නිකුත් කිරීම, රන් ප්‍රමාණය නිශ්චය කිරීම හා මුද්‍රා තැබීම, ව්‍යාපාරික බලපත්‍ර නිකුත් කිරීම, අපනයන සේවා පහසුකම් සැලසීම, බැංකු පහසුකම්, ආරක්ෂිත තාවකාලික නවාතැන් පහසුකම් වැනි දෑ එකම වහලක් යට දී සැපයීම අවශ්‍ය වන අතර දේශීය හා විදේශීය ගැනුම්කරුවන්ට මිල දී ගැනීමේ කාර්යාල පවත්වාගෙන යාමටද පහසුකම් සලසා දිය යුතු වේ.

මෙම සියලු පහසුකම් වලින් සමන්විත රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අධීක්ෂණය යටතේ මේ වන විට සිදු වේ. එහි ඉදිකිරීම් කටයුතු වලින් 80% ක් පමණ අවසන් ඇති අතර, 2022 දෙසැම්බර් මස අවසන් වන විට කටයුතු නිමවා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් අතට පත් කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තු ගත මුදල රු.මිලියන 365 ක් වේ.

# ප්‍රධාන අංශ



# 01

# ප්‍රතිපත්ති සංවර්ධන අංශය

## 1.0 හැඳින්වීම

දේශීය කර්මාන්ත සඳහා හිතකර වාතාවරණයක් නිර්මාණය කළ හැකි වන්නේ රටක දිගු කාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීමට දායක වන විචක්ෂණශීලී හා කාලෝචිත ප්‍රතිපත්තිමය පියවරයන් තුළින් පමණි. රටක් තුළ ක්‍රියාත්මක වන විවිධ ප්‍රතිපත්ති මෙන්ම එහි භූගෝලීය සීමාවන්ගෙන් ඔබ්බට වූ, විශේෂයෙන් වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති මඟින්, කර්මාන්ත අංශයට ධනාත්මක මෙන්ම ඍණාත්මකව ද බලපෑම් ඇති කෙරේ. මේ අනුව, දේශීය කර්මාන්ත අංශය කෙරෙහි බලපාන ප්‍රතිපත්තින්හි හිතකරබව මෙන්ම, උත්ප්‍රේරකකාරකභාවය පිළිබඳව සහතික කිරීම උදෙසා, කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

### කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම

මෙරට දීර්ඝ කාලයක් තිස්සේ පැවති අවශ්‍යතාවයක් සපුරාලීම උදෙසා, දේශීය නිෂ්පාදන කර්මාන්ත අංශයේ සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සංවර්ධන අංශය පියවර ගෙන ඇති අතර එමඟින් ගෝලීය වශයෙන් තරඟකාරී කාර්මික පදනමක් නිර්මාණය කිරීම හා තිරසාර සහ සාධාරණ ආර්ථික වර්ධනයක් අපේක්ෂා කෙරේ.

එකී කර්මාන්ත ප්‍රතිපත්තිය සහ එය ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම, ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව වන 'සෞභාග්‍යයේ දැක්මෙහි' දක්වා ඇති අරමුණු වලට හා එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු 17ට අනුකූලව සකස් කරනුයේ, ඉහළ ස්ථරවල ක්‍රියාත්මක වන කර්මාන්ත, කාර්මික අංශයේ 4.0 වන මට්ටම කරා ළඟා වීමට අවශ්‍ය පහසුකම් සැලසීමටය.

### තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම හා කර්මාන්ත සංවර්ධනයට අදාළ කාර්යයන්

ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින්, තීරුබදු ව්‍යුහයේ පවතින විෂමතා ඉවත් කිරීම මඟින් දේශීය කර්මාන්ත වලට පහසුකම් සැලසීම සහ වර්ෂය පුරා තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම සහ තීරු බදු ප්‍රතිපත්ති සම්බන්ධ

ක්‍රියාකාරකම්ද, ආනයන සීමා කිරීම් සම්බන්ධ කටයුතුද මෙහෙයවනු ලබයි.

තීරුබදු ප්‍රතිපත්තිවලට අදාල අවශ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධව වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය සහ එකී දෙපාර්තමේන්තු ද, ශ්‍රී ලංකා රේගුව සහ මුදල් අමාත්‍යාංශය වැනි ආයතන වෙත කර්මාන්ත අමාත්‍යාංශයේ නිර්දේශ ලබා දීම වැනි කාර්යයන් මෙම අංශය විසින් සිදු කෙරේ.

## 1.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දිනට)

### කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම

කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම, ප්‍රතිපත්ති සංවර්ධන අංශය සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා තෝරාගත් උපදේශක කණ්ඩායමක් අතර ඒකාබද්ධව සිදු කෙරේ.

කර්මාන්ත අංශයට අදාල පාර්ශ්වකරුවන්ගේ අදහස් ඇතුළත්ව කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීමෙන් පසුව, එය ක්‍රියාවට නැංවීම සඳහා වන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්මෙහි කෙටුම්පත උපදේශක කණ්ඩායම විසින් සකස් කරන ලද අතර ඊට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- උපායමාර්ග, ක්‍රියා පටිපාටි, කාල රාමුව, හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රතිඵල හා බලපෑම්ද, කාර්ය සාධන දර්ශකද වගකීම් ද ඇතුලත් ක්‍රියාකාරී සැලසුම් රාමුව
- ඇගයීම හා නියාමනය පිළිබඳ ක්‍රමවේදය
- කලින් කල ප්‍රතිපත්තියෙහි සාර්ථකත්වය පිළිබඳව පසු විපරම් කිරීමේ ක්‍රමවේදය

උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රායෝගික භාවිතය වැඩිදියුණු කිරීමේ අදහසින් ඒ සඳහා පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබා ගැනීමට 2022 සැප්තැම්බර් 23 සහ 24 යන දිනවල වැඩමුළුවක් පවත්වන ලදී. දැනට ලැබී ඇති අදහස් මත පදනම්ව මේ වන විට එය උපදේශන කණ්ඩායම විසින් සංශෝධනය කෙරෙමින් පවතී.

### තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම හා කර්මාන්ත සංවර්ධනයට අදාළ කාර්යයන්

2022 වසරේ පවතින ආර්ථික අර්බුදය සැලකිල්ලට ගනිමින් අත්‍යවශ්‍ය නොවන ආනයන අඩු කිරීම හා තීරුබදු ගැටළු විසඳීමට සහය වීමෙන් දේශීය නිෂ්පාදන දිරි ගැන්වීම තුලින් රටේ කාර්මික දියුණුවට හිතකර පරිසර තත්ත්වයක් ඇති කිරීමට ප්‍රතිපත්ති සංවර්ධන අංශය දායක විය. මෙම අංශය මඟින් දේශීය කර්මාන්ත සංවර්ධනයට අදාලව දේශීය කර්මාන්තකරුවන් සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වා තිබේ. ඊට අමතරව, තීරුබදු ප්‍රතිපත්තිය හරහා පරිසර හිතකාමී නොවන නිෂ්පාදන අඩු කිරීමට පරිසර අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කරනු ලබයි.

දේශීයව එකලස් කරන ලද / නිෂ්පාදනය කරන ලද එච් එස් කේත 84 සහ 85 යටතේ වර්ගීකරණය කර ඇති විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සඳහා වන නිෂ්පාදන බද්ද නිදහස් කිරීමට වසර පුරාම නිර්දේශ ලබා දීම සිදු කරනු ලැබීය.

දේශීය වශයෙන් 30% කට වඩා වැඩි වටිනාකමක් සහිතව එකලස් කර ඇති ශීතකරණ හා රෙදි සෝදන යන්ත්‍ර වැනි විද්‍යුත් උපකරණ නව මාදිලි කිහිපයක් මේ වසර තුළ බිහිවිය. විදුලි අයිතමවල නිශ්චිත අගයන් ගණනය කරනු ලැබේ. කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලද සහයෝගය තුළින් දේශීය කර්මාන්ත මඟින් සැලකිය යුතු දේශීය රැකියා අවස්ථා ප්‍රමාණයක් රටතුළ බිහිවිය.

### වාහන නිෂ්පාදන / වාහන එකලස් කිරීම සහ වාහන උපාංග නිෂ්පාදනය සඳහා වූ සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP)

මෝටර් රථ අංශය සඳහා නිෂ්පාදන බදු සහනය ලබා දීම නිර්දේශ කිරීම ප්‍රතිපත්ති සංවර්ධන අංශයේ තවත් ප්‍රධාන කාර්යභාරයකි. SOP යනු දේශීයව වාහන එකලස් කිරීම සඳහා වන සියලුම මාර්ගෝපදේශ, රෙගුලාසි සහ ක්‍රියා පටිපාටි ඇතුළත්, 'දේශීය අගය එකතු කිරීමේ න්‍යායය' අන්තර්ගත කොට කර්මාන්ත අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අත්පොතකි.

ඒ අනුව, මෝටර් රථ කර්මාන්තය දියුණු කිරීම සහ රට තුළ නව රැකියා අවස්ථා ඇති කිරීම සඳහා දේශීයව නිෂ්පාදිත උපාංග සහිත වාහන දේශීයව එකලස් කිරීම ප්‍රවර්ධනය කිරීමට කර්මාන්ත අමාත්‍යාංශය SOP හරහා විශාල උත්සාහයක් දරයි.

SOP ක්‍රියාත්මක කිරීමෙන් පසු, 2022 වසර තුළ සැප්තැම්බර් මස දක්වා නව වාහන මාදිලි දාහතරක් (14) ක් ඇතුළුව වාහන මාදිලි හතලිස් පහක් (45) ක් එකලස් කිරීම සඳහා ආයතන දහ අටක් (18) අනුමැතිය

ලබාගෙන ඇති අතර 2022 වසර සඳහා ලියාපදිංචි නව ආයතන සංඛ්‍යාව දහයකි (10).

ඒ අනුව, 2022 ජනවාරි මස සිට සැප්තැම්බර් 30 දක්වා මෝටර් වාහන 7,739 ක් (සිව්රෝද රථ 1,957ක් සහ ද්විරෝද රථ 5,782ක්) එකලස් කර ඇත. රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ සහ වාහන ආනයනය කිරීමේ සීමාවන් තිබියදී, සම්මත මෙහෙයුම් පටිපාටිය මඟින් මෙරට මෝටර් රථ කර්මාන්තයේ උන්නතිය සඳහා නව දොරටු විවර කර තිබේ.

## 1.3 ඉදිරි සැලසුම් - 2023

### කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම

2023 ආරම්භයේ සිට, උපායමාර්ගික ක්‍රියාකාරී සැලැසුම තුළින් කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, එහි එක් එක් ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු පාර්ශ්වයන් සමඟ කාර්ය සාධන ගිවිසුමක් ඊට ප්‍රථම අත්සන් කිරීමට අපේක්ෂිත ය.

### තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම හා කර්මාන්ත සංවර්ධනයට අදාළ කාර්යයන්

පවතින ආර්ථික අර්බුදය හමුවේ දේශීය කර්මාන්ත සහ රටේ ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීම හෝ ස්ථාවරව පවත්වාගෙන යාම තුළින් 2023 දී ස්ථාවර තීරුබදු ව්‍යුහයක් සැකසීම සඳහා දායකත්වය අඛණ්ඩව ලබා දීමට අපේක්ෂා කෙරේ.

ඒ අනුව, ප්‍රතිපත්ති සංවර්ධන අංශය විසින් දේශීයව අගය එකතු කළ කර්මාන්ත සහ පරිසර හිතකාමී නිෂ්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත.

වාහන නිෂ්පාදකයන් 2022 දී දේශීයව මෝටර් වාහන එකලස් කිරීමේදී මුහුණ දුන් ගැටළු සහ ප්‍රායෝගික අත්දැකීම් හා මෝටර් රථ නිෂ්පාදකයන්ගේ අදහස් සමඟ වර්ෂ 2023 දී, සම්මත මෙහෙයුම් පටිපාටිය සමාලෝචනය කිරීමට සැලසුම් කර ඇත.

නුදුරු අනාගතයේදී දේශීය වශයෙන් මෝටර් වාහන එකලස් කිරීම වැඩි දියුණු කිරීම සහ මෝටර් රථ කර්මාන්තයේ නියැලීමට දේශීය සමාගම් සමඟ හවුල් ව්‍යාපාර පිහිටුවීම සඳහා විදේශ ආයෝජකයින් ගෙන්වා ගැනීමට අපේක්ෂා කෙරේ.

# 02

# කර්මාන්ත සංවර්ධන අංශය

## 2.1. හැඳින්වීම

### ප්‍රධාන අරමුණු / පරමාර්ථ

සංවර්ධිත ප්‍රදේශ වලට පමණක් සීමා වී ඇති කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීමටත්, එමඟින් ජාතික ආදායමට කර්මාන්ත ක්ෂේත්‍රයෙන් වන දායකත්වය ඉහළ නැංවීමටත්,නව කර්මාන්තපුර ඇති කිරිම සහ පවතින කර්මාන්තපුර සංවර්ධනය කරමින් ප්‍රාදේශීය රැකියා නියුක්තිය වර්ධනය කිරිමට දායක විම, කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන අංශයේ මූලික කාර්යභාරයයි. මෙම කර්තව්‍යයේ දී ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජන දිරිගැන්වීම, නව ආයෝජන අවස්ථා ඇති කිරීම, අවශ්‍ය වන යටිතල පහසුකම් සලසා දීම සහ අයෝජක ඉල්ලීම් මත තාක්ෂණික පහසුකම් හා උපදේශන සේවා ලබාදීම මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.

### නව කර්මාන්තපුර ඇති කිරීම හා පවතින කර්මාන්තපුර වල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම

ආයෝජකයන් හට ආයෝජන අවස්ථා පුළුල් කිරීම, රැකියා උත්පාදනය, අපනයන වටිනාකම ඉහළ නැංවීම සහ ආනයන ආදේශන ප්‍රවර්ධනය යන කරුණු මූලික කොට ගනිමින් කර්මාන්ත සංවර්ධන අංශය විසින් උක්ත කර්මාන්තපුරයන්හී සංවර්ධන කටයුතු සාර්ථක ලෙස සිදු කරමින් පවතී. 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 200ක් වෙන්කර ඇත.

2022 වර්ෂය සඳහා සංවර්ධන ව්‍යාපෘති යෝජනා 06ක් ලැබී ඇති අතර එමඟින් ව්‍යාපාති 04ක් අවසන් කර ඇත. අනෙක් ව්‍යාපෘති ක්‍රියාකාරි මට්ටමේ පවතින අතර 2022 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘති නිමකිරිමට අපේක්ෂිත වේ.

## ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ සෑම පළාතක් සඳහාම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම කමිටුවේ කාර්යභාරය ලෙස පළාත් තුල කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන සැලසුම් සහ ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය වන පහසුකම් සැලසීම සහ කර්මාන්ත සම්බන්ධ ආයෝජන තීරණයන් ක්‍රියාත්මක කිරීමට ආයෝජකයන්ට සහාය වීම සිදු කෙරේ.

එම කමිටුවේ සභාපති ලෙස අදාල පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාගේ එකඟත්වය සහිතව කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝජිතයකු පත් කරනු ලබන අතර පළාත නියෝජනය කරන කර්මාන්තකරුවන් කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි සෘජු දායකත්වයක් සපයන ආයතන නියෝජනය කරනු ලබන නිලධාරින්ගෙන් (මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය වැනි ආයතන) මෙම කමිටුව සමන්විත වේ.

## ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන

මෙම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ කාර්යභාරය ඉටු කිරීම පිණිස පළාත් මට්ටමින් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන 09 ක් ආරම්භ කර ඇති අතර ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ ලේකම් ලෙස අදාළ පළාතේ ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා පත් කරනු ලබයි. එම තනතුරේ කාර්යයට සහාය වීම සඳහා කාර්ය මණ්ඩලයක් ද පළාත් මට්ටමෙන් පත් කර ඇත.

කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉඩම් ලබා ගැනීමට ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වෙත ඉදිරිපත් වන නව ව්‍යාපෘති යෝජනා ඇගයීම 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ පිහිටුවා ඇති ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු මඟින් සිදු කරනු ලබයි. මෙමඟින් ප්‍රාදේශීය මට්ටමින් නව ආයෝජකයින් තෝරා ගැනීමට අවස්ථාව උදා වේ. කමිටුව මඟින් නිර්දේශ කරනු ලබන ව්‍යාපෘති තවදුරටත් ඇගයීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන, ව්‍යාපෘති ඇගයීම් කමිටුව වෙත යොමු කරනු ලබයි. මෙම කමිටුව මඟින් ව්‍යාපෘති අනුමත කිරීමේ දී නිෂ්පාදන ක්‍රියාවලිය, අගය එකතු කිරීමේ ප්‍රතිශතය, පාරිසරික බලපෑම, මූල්‍ය ශක්‍යතාවය සහ රැකියා උත්පාදනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

මීට අමතරව, මෙම ව්‍යාපෘති යෝජනා අතුරෙන් පාරිසරික වශයෙන් සංවේදී ව්‍යාපෘති යෝජනා පිළිබඳව කාර්මික තාක්ෂණික ආයතනය වැනි තාක්ෂණික ආයතන වෙතින් නිර්දේශ ලබාගෙන, තාක්ෂණික වශයෙන් වැඩි දියුණු කිරීම් සිදු කර පරිසරයට අවම හානියක් සිදු වන අයුරින් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් මඟ පෙන්වීමට කටයුතු කරනු ලබයි. ඇගයීම් කමිටු අනුමැතිය ලද ව්‍යාපෘති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මඟින් සංවර්ධනය කරන ලද කර්මාන්තපුරවලින් වසර 35 ක් සඳහා වූ දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉඩම් කොටස් වෙන්කර දෙනු ලබයි.

## ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ස්ථානගත කිරීමේ ජාතික වැඩසටහන

නව ආයෝජනයන්, අපනයනය ඉලක්ක කර ගත් කර්මාන්ත හෝ ආනයන ආදේශන කර්මාන්ත, ඒ ඒ ප්‍රදේශවල දැනටමත් පවත්වාගෙන යන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය ව්‍යවසායකයින්ගේ හා නව ව්‍යවසායකයින්ගේ ආයෝජනයන්, ඒ ඒ ප්‍රදේශවලට ආවේණික සම්ප්‍රදායික කර්මාන්තකරුවන් මෙන්ම ප්‍රාදේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිෂ්පාදනයන් සිදු කරන ව්‍යවසායකයින්ගේ ආයෝජනයන් සහ ප්‍රාදේශීය ආර්ථිකයට බලපෑමක් සිදු කළ හැකි තාක්ෂණය පදනම් කරගත් ආයෝජනයන් සඳහා ඉඩම් ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහනකි.

මෙම ව්‍යාපෘතිය යටතේ කර්මාන්තපුර ආරම්භ කිරීම සඳහා විවිධ ප්‍රදේශවලින් සුදුසු ඉඩම් 15ක් හඳුනා ගෙන ඇති අතර උපදේශක සභා 2023 වර්ෂයේදී ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

ඒ අනුව මෙම කර්මාන්තපුර 10 ස්ථාපිත කිරීම තුළින් කර්මාන්ත 20ක් පමණ ප්‍රමාණයක් ආරම්භ කළ හැකි අතර එමගින් රු.මි. 3000 ක පමණ ආයෝජනයක් ද රැකියා අවස්ථා 800 ක් සහ අපනයන ආදායම වශයෙන් රු. මි. 8000ක් ද ආර්ථිකයට එක් කිරීමට හැකි වේයැයි අදහස් කරයි.

## 2.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

මෙම අමාත්‍යාංශය විසින් දිවයින පුරා ස්ථාපිත කර ඇති කර්මාන්තපුර 33හි විදුලිය, ජලය, මාර්ග වැනි යටිතල පහසුකම් සහිත අක්කර 1024.25ක ඉඩම් ප්‍රමාණයක් සංවර්ධනය කර ඇත. රජය විසින් එම කර්මාන්තපුර 33හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි. **3980.05**කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත. එයට අමතරව උක්ත කර්මාන්තපුරයන්හි කර්මාන්ත ආරම්භ කිරීම සඳහා පෞද්ගලික අංශය විසින් රු.මි. **56,480.70** කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇත.

### කර්මාන්තපුර

| සමුච්චිත ප්‍රගතිය 2022 සැප්තැම්බර් 30 දක්වා | |
|---|---|
| කර්මාන්තපුර සංඛ්‍යාව | 33 |
| සංවර්ධිත භූමි ප්‍රමාණය (අක්කර) (විදුලිය, ජලය හා මාර්ග පද්ධතිය සමඟ) | 1,024 |
| මුළු ආයෝජනය (ආසන්න වශයෙන්) රු .මි | 52,826 |
| රජයේ ආයෝජනය(ආසන්න වශයෙන්) රු .මි | 3,980 |
| පෞද්ගලික ආයෝජනය (ආසන්න වශයෙන්) රු .මි | 56,480 |
| වාණිජ නිෂ්පාදනයෙහි යෙදෙන කර්මාන්ත සංඛ්‍යාව | 469 |
| ඉදිකිරීම් අවස්ථාවේ ඇති කර්මාන්ත සංඛ්‍යාව | 32 |
| රැකියා අවස්ථා | 22,818 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

### නව කර්මාන්ත සඳහා ඉඩම් වෙන්කිරීම

2021 වර්ෂයේ අවසන් කාර්තුව තුළ ආයෝජකයන් 60ක් සඳහා ඉඩම් වෙන්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර එම ආයෝජකයන් 60 සඳහා 2022 ජනවාරි මාසයේදී ඉඩම් වෙන්කිරීමේ ලිපි නිකුත් කරන ලදි.

| 2022 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය | |
|---|---|
| ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුව විසින් අනුමත කර ඇති නව ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 48 |
| අමාත්‍යාංශ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද නව ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව | 42 |
| අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද සහ ඒ අනුව කර්මාන්තපුර වලින් ඉඩම් වෙන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | 41 |
| ව්‍යාපාර නාමය වෙනස් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | 8 |
| නිෂ්පාදනය වෙනස් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව | 2 |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

### රයිගම කර්මාන්තපුරය ඉදිකිරීම





රයිගම කර්මාන්තපුරයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.මි 346 ක් වෙන්කර ඇත. නමුත් මෙම වර්තමාන අමුද්‍රව්‍ය මිලගණන් හා අනෙකුත් වියදම් ඉහළයාම හේතුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නැවත රුපියල් මිලියන 400ක ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට නියමිතයි. පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 95% ක් පමණ අවසන් කර ඇති අතර අභ්‍යන්තර මාර්ග වල මූලික සංවර්ධන කටයුතු අවසන් කර ඇත කර්මාන්තපුරය සඳහා ජලය ලබාදීමට හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සඳහා මේ වන විට රු.මිලියන 318ක් පමණ වැයවී ඇත. 2022 වර්ෂය සඳහා රු.මිලියන 120 ක් වෙන් කර ඇත.

**උලපනේ කර්මාන්තපුරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

**ගේට්ටුව සවි කිරීම**



**බාධකය අළුත්වැඩියා කිරිම**



බාධකය අළුත්වැඩියා කිරිම උලපනේ කර්මාන්තපුරයේ කර්මාන්තපුරයේ වැට, බාධකය අළුත්වැඩියා කිරිම සහ ප්‍රධාන ගේට්ටුව සකස් කිරීම යන කාර්යයන් මෙම වර්ෂය ආරම්භයේදී සිදුකර අවසන් කරන ලදී. ඒ සඳහා වූ සම්පූර්ණ වියදම රු.මිලියන 2.69කි.

## 2.3. අනාගත සැලැසුම් - 2023

ප්‍රාදේශිය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන යටතේ නව කර්මාන්තපුර 02ක් ඉදිකිරීම් කටයුතු ආරම් කිරීමට අපේක්ෂිතයි.

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ස්ථානගත කිරිමේ ජාතික වැඩසටහන යටතේ තෝරාගත් ඉඩම් කොටස් 10ක යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් කර සුදුසු ආයෝජකයන් වෙත ලබා දීමට නියමිතයි.

## කර්මාන්තපුර තොරතුරු සාරාංශය (2022.09.30 දක්වා සමුච්චිත ප්‍රගතිය)

| දිස්ත්‍රික්කය | කර්මාන්තපුරය | භූමි ප්‍රමාණය (අක්කර) | රජයේ ආයෝජනය (සමුච්චිත) (රු. මි.) | පෞද්ගලික ආයෝජනය සමුච්චිත (රු. මි.) | කර්මාන්ත සංඛ්‍යාව | සෘජු රැකියා | වාර්ෂික පිරිවැටුම (රු. මි.) |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | කොලොන්නාව | 7 | 36.17 | 636.8 | 13 | 618 | 612.80 |
| | රත්මලාන අදියර I & II | 17 | 89.78 | 2,617.4 | 21 | 1526 | 2750.00 |
| | ටෙම්පල්බර්ග් අදියර I & II | 48 | 180.58 | 4,820.0 | 37 | 1798 | 6072.00 |
| කළුතර | කළුතර | 50 | 118.54 | 5,006.0 | 38 | 909 | 1209.00 |
| | මතුගම | 50 | 174.43 | 3,155.0 | 14 | 462 | 3549.00 |
| | මිල්ලෑව | 11 | 76.13 | 738.5 | 15 | 437 | 2228.90 |
| | රයිගම්පුර * | 24 | 318.78 | ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතී. | | | |
| ගම්පහ | මිනුවන්ගොඩ | 15 | 44.12 | 1,747.5 | 14 | 699 | 1805.00 |
| | මහර | 2.5 | 14.05 | 636.8 | 7 | 104 | 263.00 |
| පුත්තලම | පුත්තලම | 40 | 124.19 | 768.5 | 17 | 132 | 50.26 |
| | දංකොටුව | 53 | 109.74 | 5,065.0 | 36 | 1552 | 12947.50 |
| | නුරාණි | 15.84 | 12.579 | 2000.0 | 16 | 374 | 120.00 |
| කුරුණෑගල | මාකඳුර - නැගෙනහිර | 27.19 | 35.79 | 5120.0 | 2 | 735 | 8511.89 |
| | මාකඳුර - බටහිර | 65.56 | 95.94 | 3,657.0 | 15 | 1131 | 18343 |
| | දඹදෙණිය | 10.15 | 38.36 | 663.0 | 3 | 1024 | 389.13 |
| | නිකවැරටිය | 2.55 | 6.12 | 413.0 | 1 | 747 | 662.97 |
| පොලොන්නරුව | ලක්ෂඋයන අදියර I & II | 63.9 | 176.04 | 3,070.0 | 22 | 1152 | |
| මාතලේ | නාලන්ද | 24.7 | 77.28 | 2616.0 | 16 | 1158 | 4931.00 |
| මහනුවර | උලපනේ | 25 | 135.43 | 2431.0 | 18 | 587 | 686.50 |
| ගාල්ල | කරන්දෙණිය | 40 | 64.28 | 704.2 | 19 | 491 | 602.01 |
| මාතර | උඩුකාව | 21.13 | 50.93 | 870.8 | 3 | 1102 | 3422.50 |
| හම්බන්තොට | බට අත | 105 | 320.08 | 2,031.4 | 16 | 621 | 3345.04 |
| අම්පාර | නවගම්පුර | 20 | 45.83 | 215.2 | 11 | 56 | |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය අදියර I & II | 50 | 511.07 | 919.9 | 10 | 984 | 6420.00 |
| මඩකළපුව | තිරයිමඩු | 24.3 | 8.35 | 241.0 | ඉදිකිරීම් කටයුතු සිදුකෙරෙමින් පවතී. | | |
| | නාලන්ද එල්ලාවල I | 36.38 | 66.1 | 1375.5 | 29 | 307 | 1525.37 |
| රත්නපුර | නාලන්ද එල්ලාවල II | 45 | 112.54 | 950.5 | 37 | 729 | 515.36 |
| | ඇඹිලිපිටිය | 22.81 | 98.98 | 1060.2 | 3 | 180 | 1060.00 |
| කෑගල්ල | ගලිගමුව | 21.59 | 168.49 | 2141.1 | 9 | 341 | 1141.00 |
| මොණරාගල | බුත්තල | 18.35 | 118.76 | 480.0 | 21 | 900 | 1300.00 |
| බදුල්ල | ඌව පරණගම | 3.3 | 0.81 | 50.0 | 2 | 20 | 729.00 |
| මන්නාරම | මන්නාරම | 24 | 351.775 | 1.4 | 1 | 415 | 83.75 |
| මුලතිව් | වැලිඔය | 40 | 198.01 | 278.0 | 3 | 1527 | 314.50 |
| | **එකතුව** | **1024.25** | **3980.05** | **56,480.70** | **469** | **22,818** | **85,590.48** |

*මූලාශ්‍රය: කර්මාන්ත සංවර්ධන අංශය*

# 03

# සංවර්ධන අංශ 01

## 3.1 හැඳින්වීම

අමාත්‍යාංශය යටතේ සේවා පහසුකම් සපයන ප්‍රධාන නිෂ්පාදන අංශ 20 අතරින් කෘෂිකාර්මික කර්මාන්ත සංවර්ධන කටයුතු සංවර්ධන අංශ 1 යටතේ පවතී. මෙම අංශය යටතේ සැකසූ ආහාර, තේ, කුළුබඩු, කොහු ආශ්‍රිත නිෂ්පාදන, ඇසුරුම් කර්මාන්ත, කිරි හා කිරි ආශ්‍රිත කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයන්ට අදාල සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### ප්‍රධාන අරමුණු

1. ජාත්‍යන්තර වෙළඳපොලේ තරඟකාරිත්වයට මුහුණදිය හැකි ගුණාත්මක තත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශිය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
2. දේශිය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.

### ක්‍රියාකාරකම්

- ඉදිරි වර්ෂයන් සඳහා සැලසුම්කර ඇති සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දැක්වෙන අදාල ක්ෂේත්‍රයන් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ විද්වත් මණ්ඩල වලින් සැදුම්ලත් උපදේශක කමිටුවල උපදේශකත්වයෙන් සංවර්ධන සැලසුම් හා උපාය මාර්ග පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.

- අදාළ අංශයන්හි නිෂ්පාදන හා අලෙවිය ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ඒවායෙහි උපයෝගීත්වයෙන් සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.

- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදේශක කමිටු හා අදාල ආයතනවල උපදේශකත්වය ලබා ගැනීම.

- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එමගින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.

- දේශීය සහ විදේශීය කාර්මික ආයතන මගින් කර්මාන්ත සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ පුහුණුව සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.

- කර්මාන්තකරුවන් හා විශ්ව විද්‍යාල / පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම සහ ඒ තුළින් භාණ්ඩ විවිධාංගීකරණය සඳහා පහසුකම් සැලසීම.

- දේශිය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස්කර ගැනීමට සහය වීම.

- භාණ්ඩ අපනයනය දිරිමත් කිරීමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.

- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය තත්ව සහතික, කර්මාන්ත සඳහා හඳුන්වාදීම හා ඒවා ලබාගැනීමට උපකාර කිරීම.

## ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්

### ආහාර රසායනාගාරයක් ස්ථාපිත කිරීමේ හතරවන අදියර (Accredited Food Laboratory)

- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට රසායනාගාර පරීක්ෂණ සේවාවන් සහ පර්යේෂණ හා සංවර්ධන පහසුකම් සැපයීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය තුල ප්‍රතීතකරණය කරන ලද ආහාර රසායනාගාරයක් (Accredited Food Laboratory) ස්ථාපිත කිරීමේ හතරවන අදියර ආරම්භ කර ඇත. මෙම අදියරේදී රසායනාගාර ගොඩනැගිල්ලේ පළමු හා දෙවන මහළ සඳහා රසායනාගාර ගෘහ උපකරණ මිල දී ගැනීම හා සවි කිරීම මගින් ඉඩපහසුකම් පුළුල් කරනු ලබන අතර කර්මාන්ත සඳහා තරඟකාරී මිල ගණන් යටතේ රසායනාගාර පහසුකම් සැපයීම ආරම්භ කර ඇත. ඒ අනුව රසායනාගාරයේ රසායනික විද්‍යාගාරය (Chemical Lab) 2022 වර්ෂය සඳහා ආහාර නිෂ්පාදන 206 කට වඩා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර වාර්ථා ලබා දීම SLS/ISO ප්‍රමිතීන් ලේබල් කිරීමේ අවශ්‍යතා අනුව පරීක්ෂා කිරීම, පෝෂණ සංයුතිය පරීක්ෂා කිරීම ආදිය ක්ෂුද්‍රජීවී විද්‍යාගාර පිහිටුවීම ආරම්භ කර ඇත. ප්‍රතිපාදනය රු. මිලියන 1.2

- තීරුබදු රහිතව අමුද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම (අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP)) මගින් කර්මාන්තවල අපනයන දිරිගන්වනු ලැබේ. මේ වන විට ඇසුරුම් අංශය, සැකසූ ආහාර, කුළුබඩු අංශය, කොහු ආශ්‍රිත නිෂ්පාදන අංශය, තේ අංශය, මැණික් හා ස්වර්ණාභරණ අංශය හා කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය වැනි නිෂ්පාදන වල අගය එකතු

කිරීමේ නියුක්ත වෙමින් සෘජු හා වක්‍ර වශයෙන් අපනයනයට සම්බන්ධ කර්මාන්ත 59 ක් සඳහා 2022 වසර තුල මෙම පහසුකම් ලබා දී ඇත.

- ඒ අනුව කර්මාන්ත අංශයේ අගය එකතු කිරීම ඉහළ නැංවීම පිණිස භාවිතා කරනු ලබන අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී තීරුබදු සහන සැපයීම සඳහා අමාත්‍යාංශය සහය ලබාදෙනු ලැබේ. මෙමගින් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොල තුළ තරඟකාරීත්වය වැඩි කිරීම මෙයින් සිදු කරයි.

## තත්ත්වය/ ගුණත්වය ඉහල නැංවීමේ වැඩසටහන

- කර්මාන්ත සඳහා තත්ත්ව සහතික, සුරක්ෂිතතා සහ ක්‍රමවේද සම්බන්ධව සහතික ලබා ගැනීම සඳහා (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) අමාත්‍යාංශය විසින් තත්ත්ව හා ඵලදායිතාවය ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සාර්ථකව නිම කරන කර්මාන්ත වෙනුවෙන් අදාල සහතික පත්‍ර සහ ගෙවීම් බිල්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව රු.300,000/- (උපදේශන ගාස්තු ද ඇතුළුව) උපරිමයකට යටත්ව අදාල සහතික පත්‍ර ගාස්තු ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙම වැඩසටහන සඳහා සැකසූ ආහාර කර්මාන්ත අංශය, ඇසුරුම්කරණ කර්මාන්ත අංශය, අගය එකතු කළ තේ කර්මාන්ත අංශය, අගය එකතුකළ කුළුබඩු අංශය සහ කොහු කර්මාන්තය නියෝජනය වන පරිදි 2022 වර්ෂය සඳහා කර්මාන්ත 58 ක් වෙනුවෙන් පහසුකම් ලබා දීමට අවස්ථාව සලසා ඇත.
- කර්මාන්ත 58ක් සාර්ථකව ISO සහතිකකරණය නිමකරන ලද අතර එම කර්මාන්ත සඳහා මූල්‍යමය පහසුකම් සපයන ලදී.

ප්‍රතිපාදනය : රු. මිලියන 16 කි.

## නිපුණතා සංවර්ධන වැඩසටහන්

- ඇසුරුම්කරණ තාක්ෂණය ඉහළ නැංවීමේ පුහුණු වැඩසටහන සති අන්ත දින දොළහක කාල සීමාව තුළ සහතික පත්‍ර පාඨමාලාවක් වශයෙන් පැවැත්වීමට සැලසුම් කර ඇත. අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා ඇසුරුම් කර්මාන්තයේ නියැළී සිටින තාක්ෂණික ශිල්පීන් 25 දෙනෙකු සඳහා අවස්ථාව ලබා දීමට බලාපොරොත්තු වේ.

ප්‍රතිපාදනය - රු. මි. 6.75

## අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

- දේශීය හා විදේශීය ප්‍රදර්ශකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය සමග ඒකාබද්ධව Profoods/ Propack ප්‍රදර්ශනය 19 වැනි වරටත් 2022 නොවැම්බර් මාසයේදී බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට සංවිධානය කර ඇත.

- මෙම ප්‍රදර්ශනය තුළින් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වෙන් කරන ලද විශේෂිත මණ්ඩපය මගින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා විශේෂ සහන මත ප්‍රදර්ශන කුටි ලබාදීමට කටයුතු කර ඇත. එසේම, මෙම ප්‍රදර්ශනයේ දී විශ්ව විද්‍යාල සහ කර්මාන්ත අතර සම්බන්ධතා ඇති කිරීමට සහ ඔවුන්ගේ පර්යේෂණ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ලබාදීමේ අභිප්‍රායෙන් අමාත්‍යාංශය විසින් විශේෂ අවධානයක් යොමු කරමින් ඔවුන් සහභාගී කරවීමට ද කටයුතු කරන ලදී.

ප්‍රතිපාදන:රු.මිලියන 2.0කි.

- ඇසුරුම් සඳහා දේශීය කර්මාන්ත වලට විදේශීය වෙළඳපොළ අවස්ථා වැඩිකර ගැනීමට “ලංකා පැක් -2022” ප්‍රදර්ශනය 2022 පෙබරවාරි මාසයේ 12,13 හා 14 යන දිනයන්හිදී බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලවේදී සාර්ථකව පවත්වන ලදී. මෙම ප්‍රදර්ශනය සඳහා මධ්‍ය පරිමාණ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත සහභාගී වූ අතර ඒ තුළින් ඔවුන්ගේ නිර්මාණශීලී නිෂ්පාදනයන් සඳහා උප කොන්ත්‍රාත් ලබා ගැනීමට අවශ්‍ය මූලික පසුබිම සැකසීම සහ නිෂ්පාදන ඇනවුම් වැඩිකර ගැනීමට හැකියාව ලැබී ඇත.

- දේශීය කර්මාන්තකරුවන්ට ඇසුරුම්කරණය පිළිබඳ නව තාක්ෂණික දැනුම, අත්දැකීම් ලබාගැනීමේ අවස්ථා ඇති කිරීමත්, ශ්‍රී ලංකාවේ ඇසුරුම් කර්මාන්තය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම ප්‍රදර්ශනය පැවැත්වේ. ප්‍රදර්ශනය ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනයේ (SLIP) සහයෝගය ඇතිව අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලැබීය. මේ හා සමගාමීව ඇසුරුම් සම්මේලනයද පවත්වන ලදී.

  ලදී. (ප්‍රතිපාදන:රු. මිලියන 2.0 කි.)

## 3.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

### 1 ආහාර රසායනාගාරයක් ස්ථාපිත කිරීමේ හතරවන අදියර

**(වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු. මි 1.2 )**

**අදියර 4 ලෙස රසායනාගාරයට අවශ්‍ය පහසුකම් සැපයීම ආරම්භ කර ඇත .**

- ආහාර නිෂ්පාදන 206 කට වඩා ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර වාර්තා ලබා දීම.
- 
- අගය එකතු කිරීම් ඉහල නැංවීම සඳහා ආනයන තීරුබදු සහන ලබාදීමට අමාත්‍යාංශ සහය ලබා දීම.

### 2.තත්ත්වය/ ගුණත්වය ඉහල නැංවීමේ වැඩසටහන්

(වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු.මි 16)

- ISO සහතිකකරණය සාර්ථකව නිමකරන ලද කර්මාන්ත 58ක් සඳහා මූල්‍ය පහසුකම් සපයා ඇත.

### 3.නිපුණතා සංවර්ධන වැඩසටහන්

**(වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු.මි 6.75)**

- ඇසුරුම්කරණ තාක්ෂනය ඉහල නැංවීමේ පුහුණු වැඩසටහන් මගින් ක්ෂේත්‍රයේ තාක්ෂණික ශිල්පීන් 25කට අවස්ථාව ලබා දීම.
- ආහාර නිෂ්පාදන සහ අපනයන කර්මාන්ත 25ක් සඳහා කාබනික සහතිකකරණය සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම.

### 3. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්

**(වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල රු.මි 2.0)**

- Propack ප්‍රදර්ශනය 2022 නොවැම්බර් මස පැවැත්වීමට සැලසුම් කර ඇත.
- Lankapack ප්‍රදර්ශනය 2022 පෙබරවාරි පවත්වා ඇත.

## 3.3 අනාගත සැලැසුම් - 2023

1. කර්මාන්ත අංශවල උපදේශක කමිටු යෝජනා හා අදහස් පදනම් කරගනිමින් ඒ ඒ අංශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

2. සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්තයේ සහ ඇසුරුම් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා අලෙවි ප්‍රදර්ශන වැඩසටහන් සහ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශන වලට සහය සැපයීම.

3. සැකසූ ආහාර අංශය, ඇසුරුම් කර්මාන්ත අංශය, තේ, කොහු, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන හා කුළුබඩු කර්මාන්ත අංශයේ තත්ත්ව සහතික ලබා ගැනීම ඵලදායීතාවය සහ වෙළෙඳපොල තරඟකාරිත්වය වැඩිදියුණු කිරීමේ (ISO 9001, ISO 14001, ISO 22000, ISO 50001) වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

4. සුළු පරිමාණ කර්මාන්තවල ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (GMP) වැඩසටහන ක්‍රියාවට නැංවීම.

5. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආරම්භ කරනු ලබන ප්‍රතීතනකරණය කරන ලද ආහාර පරීක්ෂණාගාරය තවදුරටත් වැඩිදියුණු කිරීම සහ අවශ්‍ය සේවාවන් සැපයීමට කටයුතු කිරීම.

6. අගය එකතු කරන ලද නිෂ්පාදන වල අපනයන වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

7. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා නූතන තාක්ෂණික ක්‍රම අත්පත්කර ගැනීම පිළිබඳව සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

8. “Sri Lankan Cuisine” පාඨය යටතේ ශ්‍රී ලංකාවට අවේණික වූ ආහාර වර්ග වල එහි අනන්‍යතාවය රැකෙන පරිදි දේශීය ආහාර ලෝක වෙළඳ පොලට හඳුන්වා දීම සඳහා ආහාර සැකසුම්කරුවන්ගේ සංගමය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සමග එක්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. ආහාර නිෂ්පාදනයේ යෙදී සිටින සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඇසුරුම් තාක්ෂණය ඉහළ නංවා ගැනීම සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය.

# 04

# සංවර්ධන අංශ 02

## 4.1හැඳින්වීම

### ප්‍රධාන අරමුණ

දේශීය කර්මාන්ත උප අංශයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, එමගින් උසස් නිමැවුමෙන් හා ගුණාත්මක භාවයෙන් යුක්ත වූ භාණ්ඩ බිහිකරමින් ජාත්‍යන්තර වෙළෙඳපොල ජය ගැනීමට හැකි වටපිටාවක් නිර්මාණය කිරීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ

- රබර්, ප්ලාස්ටික් ආශ්‍රිත කර්මාන්ත
- සෙරමික්, ටයිල්, ග්‍රැනයිට්, උළු නිෂ්පාදන කර්මාන්ත
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත
- මෝටර් රථ උපාංග නිෂ්පාදන හා එකලස් කිරීම ආශ්‍රිත කර්මාන්ත
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත
- තීන්ත, මුද්‍රණ ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත
- ඛනිජ හා ඛනිජ ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත

### කාර්යයභාරය

- කර්මාන්ත උප අංශ සංවර්ධනයට අවශ්‍ය සැලසුම් සකස් කිරීමේදී රාජ්‍ය අංශය, කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, අධ්‍යාපනඥයින් සහ කර්මාන්තකරුවන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.

- තාක්ෂණික කළමනාකරණ හා නිෂ්පාදනයට අදාල ගැටළු අවබෝධ කර ගැනිම සඳහා අවශ්‍ය උපදෙස් හා පහසුකම් සැපයීම.
- දේශීය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීමේදී දේශීය හා විදේශීය වාණිජ මණ්ඩල, රාජ්‍ය අංශයට අයත් ආයතන, සමාගම් හා කර්මාන්ත සංවර්ධනයට ආධාර ලබාදෙන වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය.
- ඵලදායිතාවය නැංවීම හා එකතු කල අගය වැඩි කිරීම සඳහා උසස් තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුන්වා දීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සේවා නියුක්තව සිටින ශ්‍රමිකයන්ගේ හැකියාවන් සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණුව ලබාදීමට අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- මෙරට කර්මාන්තශාලාවල සේවය කරන විදේශ ශ්‍රමිකයන් සඳහා (දේශීයව සපුරාගත නොහැකි පුහුණු ශ්‍රමිකයින්,විශේෂඥයන් හා ආයෝජකයින් හට) වීසා නිර්දේශ ලබා දීම.
- අමු ද්‍රව්‍ය ආනයනය කර දේශීය වටිනාකම් එකතු කර නැවත අපනයනය කිරීම (TIEP) සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- දැනට තාවකාලිකව ආනයනය සීමා කර ඇති කර්මාන්ත වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා නිර්දේශ ලබා දීම වැනි කාර්යයන් හරහා කර්මාන්ත කරුවන්ට තම කර්මාන්ත පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැපයීම.

## 4.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දිනට)

### ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනය

2022 වර්ෂය ආරම්භයත් සමඟ රට තුළ උත්ගත වූ තත්වයත්, ඉන්ධන හිඟය හා විදුලි කප්පාදුව වැනි හේතූන් නිසා බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත අංශය මඟින් සංවිධානය කරනු ලැබූ ජාත්‍යන්තර බෝට්ටු ප්‍රදර්ශනය අවලංගු කිරීමට සිදු විය.

### රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය එකතුකල අගය වැඩි නිෂ්පාදන කර්මාන්ත අංශයක් වශයෙන් එහි ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන එම කර්මාන්ත අංශයේ නියුතු තාක්ෂණික ශිල්පීන් සඳහා වූ නිපුණතා සංවර්ධන වැඩසටහන මේ වසර තුළ අවසන් කිරීමට නියමිතය. ඒ යටතේ ශ්‍රී ලංකා රබර් ප්ලාස්ටික් ආයතනයේ පුහුණු පාඨමාලා 4ක් මේ වසර තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත අතර එ සඳහා රු. මි. 1.6ක් අමාත්‍යාංශය විසින් දැරීමට නියමිතය.

### වාහන නිෂ්පාදන හා වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය

වර්තමානයේ රට තුළ උද්ගත වී ඇති මූල්‍ය අර්බුදය නිසා වාහන ආනයනය තාවකාලිකව තහනම් කිරීමට රජය කටයුතු කළ පසුබිම තුළ දේශීය වාහන එකලස් කිරීමේ කර්මාන්තය කැපී පෙනෙන ප්‍රගතියක් මේ වන විට අත්පත් කරගෙන ඇත.

### සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) එළිදැක්වීම

2021 වසරේදී හඳුන්වා දුන් සම්මත මෙහෙයුම් පටිපාටියේ ප්‍රතිලාභයන් සැලකිල්ලට ගෙන කර්මාන්ත 18 ක් මේ වන විට මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයට ඇතුළත් වී ඇත.

මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තයට සමගාමීව දේශීය මෝටර් රථ උපාංග කර්මාන්තයෙහි ද කැපි පෙනෙන වර්ධනයක් සිදු වී ඇත. මෙම අංශයේ නිෂ්පාදනයන්හි ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා ජාත්‍යාන්තර පිළිගත් තත්ව සහතිකයක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී. මේ අනුව IATF 16949 (International Automotive Task Force) තත්ව සහතිකය ලබා ගැනීම සඳහා දේශීය වාහන උපාංග නිෂ්පාදන කර්මාන්තකරුවන් 7 දෙනෙකු සඳහා පහසුකම් සැපයීමට අමාත්‍යාංශය කටයුතු කරමින් ඇති අතර ඒ සඳහා රු.මි. 4.2ක් අමාත්‍යාංශය විසින් වැය කිරීමට නියමිතය.

## 4.3 අනාගත සැලසුම් - 2023

- වාහන උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා හඳුන්වා දෙන IATF 16949 (International Automotive Task Force) තත්ව සහතිනය 2023 වසර තුළ කර්මාන්ත ආයතන 15ක් සඳහා හඳුන්වා දීමට නියමිතය.

- රතු මැටි සෙවිලි උළු සඳහා SLSI ප්‍රමිති සහතික ලබා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඇගයීම් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියුතු තාක්ශණ ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- රබර් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා Polymer Technology සම්බන්ධ උපාධි මට්ටමේ පාඨමාලාවක් පැවැත්වීම.

- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නියුතු තාක්ෂණ ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- බෝට්ටු නිෂ්පාදන අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම.

- විදුලි හා විද්‍යුත් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත සඳහා අන්තර්ජාතික ප්‍රමිති සහතික ලබා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- මාලදිවයින/ඉන්දියාව/සීෂෙල්ස් සමඟ කලාපීය වෙළෙඳ පොළෙන් බෝට්ටු සඳහා ඇති ඉල්ලුම ඉහළ නැංවීම සඳහා ඒකාබද්ධ නාවික සංචාරක වැඩසටහන ප්‍රවර්ධනය කිරීමේ අවස්ථා පිළිබඳ කලාපීය සමුළුවක් සංවිධානය කිරීම.

# 05

# සංවර්ධන අංශ 03

## 5.1 හැඳින්වීම

### මූලික අරමුණු

ජාත්‍යාන්තර වෙළෙඳපොල තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහත සඳහන් කර්මාන්ත, උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

- පාවහන්, සම් හා සම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තය
- ඖෂධ කර්මාන්තය
- රූපලාවන්‍ය කර්මාන්තය
- ලෝහ ආශ්‍රිත කර්මාන්තය
- ඇඟළුම්, රෙදි පිළි හා ආශ්‍රිත කර්මාන්ත

### ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශ උපදේශක සභා රැස්වීම් කැඳවීම, සංවර්ධන උපාය මාර්ග සාකච්ඡා කිරීම හා ඒවාට අවශ්‍ය උපදෙස් ලබාදීම හා ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්ත උපඅංශ සඳහා සංවර්ධන සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- රේඛීය අමාත්‍යාංශ, වෙළඳ සංගම්, සම්මේලන හා විශ්වවිද්‍යාල සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ක්ෂේත්‍රවල උන්නතියට කටයුතු කිරීම.
- තෝරා ගනු ලැබූ කර්මාන්ත අංශයන්හි කුසලතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.
- නිදහස් වෙළෙඳ ගිවිසුම් තුළින් තම වෙළෙඳපොල කොටස ඉහළ නංවා ගැනීමට කර්මාන්තකරුවන් දැනුවත් කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන හා අළෙවිකරණ කටයුතු සඳහා පහසුකම් සැපයීම.
- අපනයන දිරිගැන්වීම සඳහා තාවකාලික ආනයන, අපනයන ක්‍රියාවලිය (TIEP) මගින් පහසුකම් සැලසීම හා කර්මාන්ත සඳහා අවශ්‍ය

විදේශීය විශේෂඥයින් වෙනුවෙන් වීසා නිර්දේශ කිරීම.

- දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනයේදී බදු සහන ලබා දීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ජාත්‍යන්තර වෙළෙඳපොල තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා දේශීය නිෂ්පාදන කර්මාන්ත වලට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- අබලි ලෝහ අපනයනය සඳහා නිර්දේශ ලබා දීම.
- ලෝහ ආශ්‍රිත කර්මාන්තවල අගය එකතු කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ලෝහ ආශ්‍රිත කර්මාන්තකරුවන් හට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය සහයෝගය ලබා දීම.
- උක්ත කර්මාන්ත උප අංශවල කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය විදේශීය ශ්‍රමිකයන් සඳහා වීසා නිර්දේශ ලබා දීම.
- නිෂ්පාදන කර්මාන්ත සඳහා අවශ්‍ය වන කාර්මික අමුද්‍රව්‍ය ඉන්දියානු ණය සහනාධාර (Indian Credit Line) යටතේ ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- ඉන්ධන අර්බුදයේදී කර්මාන්තකරුවා මුහුණ දෙන ගැටලු විසඳමින් ඉන්ධන ලබා ගැනීමේ ප්‍රමුඛතාවය ලබා ගැනීමට නිර්දේශ ලිපි නිකුත් කිරීම.
- විවෘත ගිණුම් (Open Account) යටතේ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දීම.

## 5.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දක්වා)

- අබලි ලෝහ සහ අගය එකතු කළ ලෝහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සඳහා නිර්දේශ ලබා දීමේදී අගය එකතු කිරීම ගණනය කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සමග එක්වී අගය එකතු කිරීම සඳහා සූත්‍රයක් සකස් කර ඇත.
- ශ්‍රී ලංකාවේ වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ සංවර්ධන සහ නියාමන මධ්‍යස්ථානයක් පිහිටුවීම සම්බන්ධයෙන් අනුමැතිය ලැබී ඇති අතර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
- කොළඹ දිස්ත්‍රික්කය තුල පාවහන් නිෂ්පාදනය ආශ්‍රිත කුසලතා ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇගලුම් ආයතනය සමඟ එක්ව තාක්ෂණ දැනුම හා උපකරණ ලබා දී එම ක්ෂේත්‍රය තුල 100කට වඩා ප්‍රතිලාභීන් පිරිසක් සවිබල ගැන්වීමේ කටයුතු ක්‍රියාත්මක කර අවසන් කරන ලදී.

**තාක්ෂණ හුවමාරුව හා දැනුම ලබා දෙමින්**





- ශ්‍රී ලංකාවේ සමස්ථ හදුන්කූරු නිෂ්පාදනයට අවශ්‍ය විශේෂිත උණ බට කූරු සපයා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයන් මත ව්‍යාපෘතියක් ආරම්භ වූ ව්‍යාපෘතියේ මේ වන විට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා පේරාදෙනිය විශ්වවිද්‍යාලය සමග එක්ව ගංගා ආශ්‍රිතව උණ වගා කර ඇති ස්ථාන GIS තාක්ෂණය ඔස්සේ හදුනා ගෙන අවසන් කර ඇත.

- ශ්‍රී ලංකා කර්මාන්ත ප්‍රදර්ශනය සහ සම්මාන ප්‍රධානෝත්සවය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හා එක්ව 2022 පෙබරවාරි මස 3, 4, 5 හා 6 යන දින වල දී බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සාර්ථකව පවත්වන ලදී.

- මෙයට අමතරව සංවර්ධන අංශ 3 මගින් කර්මාන්තකරුවන් වෙත තම නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ලබාදුන් නිර්දේශ, පවත්වන ලද කමිටු පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත පහත වට ප්‍රස්ථාර මගින් ඉදිරිපත් කර ඇත.













*මූලාශ්‍රය: සංවර්ධන අංශ 03*

**නිර්දේශ ලබා දීම**

| විස්තරය | උප අංශය | ප්‍රමාණය |
|---|---|---|
| 1.Raw Hide නිර්දේශ | පාවහන් අංශය | 7 |
| 2.බදු සහන නිර්දේශ | පාවහන් අංශය | 19 |
| 3.මිල කමිටු | ලෝහ අංශය | 11 |
| 4.උපදේශන කමිටු | පාවහන් අංශය/ රූපලාවන්‍ය | 4 |
| 5.Chamber කමිටු | සියලු අංශ | 1 |
| 6.ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටත් නිර්දේශ | | 250 |
| 7.ඉන්ධන සඳහා නිර්දේශ | | 77 |
| **ආයතන සංඛ්‍යාව** | | **369** |

*මූලාශ්‍රය: සංවර්ධන අංශ 03*

## 5.3 අනාගත සැලසුම්- 2023

- තරුණයන් හා කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා SLITA ආයතනය මගින් දිවයින පුරා සිටින රැකියා විරහිත නුපුහුණු තරුණ ප්‍රජාව සහ කාන්තා පාර්ශවය වෙනුවෙන් පාවහන් නිෂ්පාදනය ආශ්‍රිත කුසලතා වර්ධන වෙනුවෙන් මූලික පුහුණු පාඨමාලා පැවැත්වීම සිදු කරයි. පුහුණුලාභීන් පාවහන් නිෂ්පාදකර්මාන්ත ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙන්ම ඒ සඳහා මූලික උපකරණ ලබාදෙමින්, මූල්‍ය පහසුකම් ලබා ගැනීමට සම්බන්ධීකරණ සිදු කිරීමට අපේක්ෂිතය.

- සම් හා පාවහන් අංශයේ නිපුණතා සංවර්ධනය සම්බන්ධයෙන් පසුගිය වසරවල පවත්වනු ලැබූ කුසලතා සංවර්ධන පුහුණු පාඨමාලා මගින් පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදනයට පිවිසී සිටින්නන් වෙනුවෙන් උසස් පුහුණු පාඨමාලා පැවැත්වීමට සැලසුම් කර ඇත. සම් සහ පාවහන් අංශය අපනයන වෙළඳපොළට ලඟා වීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි දැනට සිටින සේවකයන්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීමට අපේෂිතයි.

- රූපලාවන්‍ය නිෂ්පාදන අංශය වැඩි දියුණු කිරීම - (තත්වය වැඩි දියුණු කිරීම) වෙනුවෙන් රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා පරීක්ෂණ වාර්තා ලබා ගැනීමට සහ රූපලාවන්‍ය නිෂ්පාදකයින් අපනයන සිදුකිරීම දක්වා ඔවුන්ට අවශ්‍ය ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීමට අපේකෂිතය.

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2023 වර්ෂයේ ද පැවැත්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය අනුග්‍රහය දැක්වීමට අපේක්ෂිතය.

- සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ සම් හා පාවහන් පර්යේෂණය හා සංවර්ධනය පුළුල් කිරීම සඳහා වන නවෝත්පාදන සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂිතය.

# 06

# කර්මාන්ත ලියාපදිංචි අංශය

## 6.1 හැඳින්වීම

1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ ශ්‍රී ලංකාව තුල පවතින සියලුම නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචි කිරීම කර්මාන්ත ලියාපදිංචි අංශයේ ප්‍රධානතම ඉලක්කයයි. ඒ අනුව නිෂ්පාදන කර්මාන්තයක් සිදුකරන සෑම පුද්ගලයෙකුම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ සිය කර්මාන්තශාලා ලියාපදිංචි කළ යුතු අතර අදාළ අවශ්‍යතාවයන් සපුරාලන කර්මාන්ත සඳහා අමාත්‍යාංශය විසින් සහතිකයක් නිකුත් කරනු ලබයි. එමගින් කර්මාන්තකරුවන් විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරාලනු ඇත.

ලියාපදිංචි කර්මාන්ත පහත සඳහන් ප්‍රධාන කාණ්ඩ 09 යටතේ වර්ගීකරණය කර ඇත.

- 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන
- 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන
- 33-දැව සහ දැවමය නිෂ්පාදන
- 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු
- 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන
- 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන
- 37-මූලික ලෝහ නිෂ්පාදන
- 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ
- 39-අනෙකුත් නිෂ්පාදන

අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වීමෙන් සිය කර්මාන්ත සඳහා අනගි රාමුවක් සංවර්ධනය කර ගැනීමට කර්මාන්තකරුවන්ට අවස්ථාව හිමි වන අතර එමඟින් ඒ ඒ කර්මාන්ත අංශයන්හි වර්තමාන තත්ත්වයන්ද අධ්‍යනය කල හැකිය. තවද, අනාගතයේ දී නව උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට අදාලව නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සඳහා කර්මාන්ත පිළිබඳ සවිස්තරාත්මක දත්ත සමුදායක් පවත්වා ගැනීමටද හැකි වනු ඇත.

වර්තමානයේදී, ලියාපදිංචි කර්මාන්ත පිළිබඳ සියලු විස්තර dBase III (දත්තපාද කළමනාකරණ පද්ධතිය) තුළ පවත්වා ගෙන යනු ලබන අතර එයට ආරම්භයේ සිට කර්මාන්ත 3380 ක් පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇති අතර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අතින් (manually) සිදු වෙමින් පවතී.

ඒ අනුව, 2022 සැප්තැම්බර් 30 වන දින දක්වා නිෂ්පාදන කර්මාන්ත 3380 ක ප්‍රමාණයක් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇත.




මූලාශ්‍රය : *කර්මාන්ත ලියාපදිංචි අංශය*

**මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ කර්මාන්ත වල ව්‍යාප්තිය**




මූලාශ්‍රය : *කර්මාන්ත ලියාපදිංචි අංශය*

## 6.2. ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දිනට)

2022 ජනවාරි 01 සිට 2022 සැප්තැම්බර් **30** වන දින දක්වා මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත් 157ක් ලැබී ඇති අතර, ඒ අතරින් කර්මාන්ත 121ක් මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇත.

**කර්මාන්ත ලියාපදිංචිය සඳහා ලබා දී ඇති නිර්දේශ පිළිබඳ විස්තර -2022**

| අංශය | කර්මාන්ත ගණන |
|---|---|
| 31-ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන | 29 |
| 32-රෙදිපිළි, ඇඟලුම් සහ සම් නිෂ්පාදන | 15 |
| 33-දැව සහ දැවමය නිෂ්පාදන | 4 |
| 34-කඩදාසි නිෂ්පාදන, ප්‍රකාශන සහ මුද්‍රණය කටයුතු | 7 |
| 35-රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 26 |
| 36-ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන | 4 |
| 37-මූලික ලෝහ නිෂ්පාදන | 5 |
| 38-පිරිසැකසුම් කරන ලද ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ | 29 |
| 39-අනෙකුත් නිෂ්පාදන | 2 |
| **මුළු එකතුව** | **121** |

මූලාශ්‍රය : *කර්මාන්ත ලියාපදිංචි අංශය*

2022 වර්ෂය තුල මේ දක්වා ලියාපදිංචි කොට ඇති කර්මාන්ත සංඛ්‍යාව තරමක් දුරට පහල ගොස් ඇති ඇති අතර එම අගය 2021 වර්ෂයට සාපේක්ෂව පහල අගයක් පෙන්නුම් කරනු ලබයි.

මෙම වසර වන විට Manual ක්‍රමය ඔන්ලයින් පද්ධතියක් බවට පත් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.
1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ සංශෝධන තුළ කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා නීතිමය ප්‍රතිපත්ති සම්පාදනය කර ඇත.




*මූලාශ්‍රය : කර්මාන්ත ලියාපදිංචි අංශය*

## 6.3 ඉදිරි සැලසුම් - 2023

නුදුරු අනාගතයේ දී මාර්ගගත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක් සිදුවෙමින් පවතී. ඊට අමතරව සමස්ථ රටම සඳහා විස්තීර්ණ ජාතික දත්ත සමුදායක් නිර්මාණය කිරීමේ පරම අවශ්‍යතාව කොතැනද යන්න අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. කිසිදු කාල පරතරයකින්, ප්‍රමාදයකින් හෝ නාස්තියකින් තොරව මිනිසුන්ට අදාළ තොරතුරු රැස් කළ හැකිය.
මෙම ක්‍රියාවලියේ සමස්ත කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කරනු ඇත. කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් මෙම රැස්වීම NEDA හිදී පැවැත්විණි. එම සාකච්ඡාවේදී ඉදිරියේදී නිශ්චිත එකඟතාවයකින් ඉදිරියට යාමට සැලසුම් කර ඇත.

# 07

# ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## 7.1 හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ණය යෝජනා ක්‍රම දෙකක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)
2. පරිසර හිතකාමී II (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)

### 1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III- චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මඟින් නව ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාර වල ඵලදායිතාවය වර්ධනය කිරීම හෝ එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණත්වය වර්ධනය කිරීම සඳහා අඩු පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. එසේම, සුළු හා කුඩා පරිමාණ ව්‍යාපාරවල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදනවල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2012 මැයි මස 01 වන දින සිට කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

### අරමුණු

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය කටයුතුවලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.

- අන්තර් මූල්‍ය ආයතනවල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන 10 ක් හරහා ණය ලබා දෙනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සි සී බැංකුව.

### 2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුලින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් නිකුත් කරනු ලැබේ, එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය සහභාගිත්ව ණය දෙන ආයතන 11 ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සි සී බැංකුව, ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ පීපල්ස් ලීසි සමාගම වේ. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2018 වර්ෂයේ සිට මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 7.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දිනට )

### (1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)

මෙම වර්ෂය සඳහා රු. මි. 600 ක් වෙන් කර දී ඇති අතර, සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතින් 33 ක් සඳහා රු. මි. 293.4 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇත.

### (2) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 400 ක් වෙන් කර දී ඇති අතර සමාලෝචනයට භාජනය වන , කාලසීමාවේ දී උප ව්‍යාපෘතින් 06 ක් සඳහා රුපියල් මිලියන 92.00 ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් නිදහස් කර ඇත.

## 7.3. අනාගත සැලැසුම් - 2023

### (1) කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)

2023 වර්ෂය සඳහා රු. මි. 2000 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් උප ව්‍යාපෘතින් 200 ක් සඳහා ලබා දීමටත් එමඟින් නව රැකියා අවස්ථා 700 ක් පමණ ජනිත කිරීමටත් අපේක්ෂා කරයි.

### (2) පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

2023 වර්ෂය සඳහා රු. මි. 1000 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් ව්‍යාපෘති 60 ක් සඳහා ලබා දීමට බලාපොරොත්තු වේ. එමඟින් සම්පත් ඉතිරි කිරීම, සම්පත් ප්‍රතිසාධනය, වෙනත් කර්මාන්ත සඳහා අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම, අප ජලය පිරිපහදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බලශක්ති ඉතිරි කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මඟින් මූල්‍ය සහාය ලබා දීම තුලින් පරිසර හිතකාමී කාර්මික පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

# 08

# පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය

## 8.1 හැඳින්වීම

### දැක්ම

2035 දී රාජ්‍ය ව්‍යවසායයන්හි තිරසර පැවැත්ම තහවුරු කිරීම.

### මෙහෙවර

රාජ්‍ය ව්‍යවසායයන්හි පරිපාලන ව්‍යුහය විධිමත් කිරීම, තරඟකාරී වාණිජමය පරිසරයට සරිලන පරිදි නිෂ්පාදන හා මෙහෙයුම් කටයුතු වල ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම, සම්බන්ධීකරණය හා පසු විපරම් සිදු කිරීම.

### අරමුණු

- ලාබ ලබන තත්ත්වයට පත් කිරීමට විභවතාව පවතින දැනට ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති රාජ්‍ය ව්‍යවසාය නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම.
- දැනට පාඩු ලබන සහ ලාබ ලබන තත්ත්වයට පත් කිරීමට විභවතාව නොමැති රාජ්‍ය ව්‍යවසාය ඈවර කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- රාජ්‍ය ව්‍යවසායවල නිෂ්පාදන කටයුතු සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම, නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සහ අගය එකතු කිරීම තුළින් නිෂ්පාදන ප්‍රමාණය සහ ගුණත්වය ඉහළ නැංවීම හරහා ලාභය උපරිම කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ රාජ්‍ය ව්‍යවසායවල කටයුතු සඳහා දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින්ගේ දායකත්වය ලබා ගැනීම.

- දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබා දීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් මෙහෙයවීම.

- රාජ්‍ය ව්‍යවසායයන්හි භෞතික හා මානව සම්පත ඵලදායී ලෙස මෙහෙයවීමට අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

## ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යවසාය වලට අදාළ පරිපාලන කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා මඟපෙන්වීම් සිදු කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය වලට අදාළ සංවර්ධන කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා මඟපෙන්වීම් සිදු කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය වලට අදාළ පරිපාලන කටයුතු

  - රාජ්‍ය ව්‍යවසාය වල සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සාමාජිකයන් පත්කිරීම සිදු කිරීම.
  - රාජ්‍ය ව්‍යවසාය වල අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් නිරීක්ෂක නිලධාරීන් පත් කිරීම.
  - රාජ්‍ය ව්‍යවසාය වල වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම හා ඉන්පසුව පාර්ලිමේන්තුව වෙත සභාගත කිරීම සඳහා යොමු කිරීම.
  - රාජ්‍ය ව්‍යවසාය වෙත කාර්ය මණ්ඩලය අනුමත කිරිම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
  - රාජ්‍ය ව්‍යවසාය වෙත අනුමත කරනු ලබන තනතුරු වලට අදාළව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කිරීම සඳහා එම ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීම.
  - අනුමත කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි සකස් කර අනුමත කර ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
  - අනුමත තනතුරු වලට අදාල බඳවා ගැනීමේ පටිපාටිවල සංශෝධන සිදු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
  - අනුමත තනතුරු වල ඇති වන පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන්/ සේවකයින් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාදීම.
  - ඇවර කිරීමට අනුමැතිය ලබාදී ඇති රාජ්‍ය ව්‍යවසාය ඇවර කිරීමට අදාළ කටයුතු සිදු කිරීම
  - රාජ්‍ය ව්‍යවසායට අයත් වාහන වල රු. **200,000/-**ට වැඩි අළුත්වැඩියා කිරීම් සඳහා අනුමැතිය ලබාදීම.
  - රාජ්‍ය ව්‍යවසායවල කාර්ය මණ්ඩලය සඳහා ගෙවීමට යෝජනා කරන නව දීමනා ගෙවීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
  - විධායක ශ්‍රේණියේ නිලධාරීන් සති අන්ත හා වෙළඳ නිවාඩු දිනවල සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබාදීම.
  - රාජ්‍ය ව්‍යවසාය වල සේවයේ යෙදී සිටින විදේශීය ජාතිකයින් වෙත නේවාසික වීසා නිකුත් කිරීම හා නිකුත් කර ඇති නේවාසික වීසා වල කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම
  - ස්වෙච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ව්‍යවසාය වෙත නැවත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කිරීම.

- රාජ්‍ය ව්‍යවසායවල සේවයේ යෙදී සිටින නිලධාරීන් විසින් පෞද්ගලික විදේශ සංචාර සිදු කිරීම සඳහා ඉල්ලුම් කරන අවස්ථාවලදී විදේශ නිවාඩු අනුමත කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය වෙත නව වාහන මිලදී ගැනීම් සිදු කිරීම සහ කොන්ත්‍රාත් පදනම මත වාහන ලබා ගැනීම සඳහා කරන ඉල්ලීම් වලට අදාළව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ව්‍යවසායවල සිදුවන බවට වාර්තා වන අක්‍රමිකතා සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී විමර්ශන සිදු කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ව්‍යවසායවල කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත්වන විගණන විමසුම් සම්බන්ධයෙන් අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් ලබා දීම සිදු කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය විසින් ඉදිරිපත් කරන අධක්ෂ මණ්ඩල තීරණ අධ්‍යයනය කර එහි ඇතුලත් වී ඇති වැදගත් තීරණ සහ ප්‍රශ්නගත තීරණ පිළිබඳව අමාත්‍යාංශ ලේකම් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය විසින් වාර්ෂිකව සකස් කළ යුතු ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, මූල්‍ය බලතල පැවරීමේ ලියවිලි, පුහුණු සැලැස්ම, අයවැය ලේඛණය සහ වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීම සඳහා එම ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, අමාත්‍යාංශ උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ව්‍යවසාය සම්බන්ධයෙන් විමසීම් සිදු කරනු ලබන සියළුම ආයතන වෙත තොරතුරු වාර්තා සකස්කර ඉදිරිපත් කිරීම.
- තොරතුරු දැනගැනීමේ පනතට අදාළව යොමු කරන අයදුම්පත් වලට අදාළ තොරතුරු සකස්කර අතිරේක ලේකම් (පාලන) වෙත ඉදිරිපත් කිරීම

- රාජ්‍ය ව්‍යවසාය වලට අදාළ සංවර්ධන කටයුතු

**මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වලට අදාල කටයුතු**

- ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම සඳහා අමාත්‍යාංශයේ සැලසුම් අංශය හා අදාළ රාජ්‍ය ව්‍යවසාය සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම.
- රාජ්‍ය ව්‍යවසාය විසින් ව්‍යාපෘති යෝජනාව සකස්කර ඉදිරිපත් කළ පසු එය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම නිර්දේශකර සැලසුම් අංශය වෙත යොමු කිරීම.
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය/එකඟතාව ලැබුණු පසුව ව්‍යාපෘති යෝජනාව අමාත්‍යාංශයීය වාර්ෂික අයවැය යෝජනා වලට ඉදිරිපත් කිරීම සඳහා සැලසුම් අංශය වෙත යොමු කිරීම.
- ජාතික අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනාව සඳහා අනුමැතිය ලැබුණු පසුව, ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යවසාය දැනුවත් කර එහි කටයුතු ආරම්භ කිරීමට දැනුම්දීම.
- ව්‍යාපෘතියට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු, ව්‍යාපෘති කමිටු, ශක්‍යතා

අධ්‍යයන කමිටු, උපදේශන කමිටු පත්කිරීම සඳහා අදාළ රාජ්‍ය ව්‍යවසාය හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන අංශය සම්බන්ධීකරණය කිරීම.

- ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය වෙත අවශ්‍ය මඟපෙන්වීම හා උපදෙස් ලබා දීම.
- ක්‍රියාකාරී සැලැස්ම අනුව ව්‍යාපෘතියේ කටයුතු අවසන් වන තෙක් සැලසුම් අංශය සමඟ එක්ව මාසිකව පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ප්‍රගතිය සමාලෝචනය කිරීම.

**රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති.**

- සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය, අදාළ රාජ්‍ය ව්‍යවසාය හා අනෙකුත් අදාළ සියළුම පාර්ශව සමඟ සාකච්ඡා කර තීරණ වලට එළඹීම.
- ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම අවශ්‍ය වන්නේ නම්, රාජ්‍ය ව්‍යවසාය සමඟ එක්ව ඊට අදාළ කටයුතු සිදු කිරීම.
- ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස්කර, අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා පාලන අංශය වෙත ඉදිරිපත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු පසුව ව්‍යාපෘතියට අදාළ ව්‍යාපෘති කමිටු පත්කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත නාම යෝජනා ඉදිරිපත් කිරීම.
- ව්‍යාපෘතියට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා කමිටුව පත් කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීම.
- ව්‍යාපෘති කමිටුව හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා කමිටු පත් කිරීමෙන් පසුව, ව්‍යාපෘති කමිටු රැස්වීම් හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන සාකච්ඡා කමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ සියළු කටයුතු සම්බන්ධිකරණය කිරීම.
- ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ව්‍යාපෘති කමිටුවේ නිර්දේශ අනුව අභිලාෂය කැඳවීමේ ලියවිලි හා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමේ ලියවිලි කැඳවීමට අදාළ පුවත්පත් දැන්වීම් සකස් කිරීම.
- අභිලාෂය පල කිරීමේ යෝජනා කැඳවීමේ ලියවිලි හා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමේ ලියවිලි කැඳවීමට අදාළ කටයුතු සිදු කිරීම.
- අභිලාෂය කැඳවීමේ ලියවිලි ඇගයීම් කටයුතු, විස්තරාත්මක ව්‍යාපෘති යෝජනා කැඳවීමේ ලියවිලි වලට අදාළ තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් කටයුතු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය කිරීම් සිදු කිරීම.
- පූර්ව ලංසු රැස්වීම පැවැත්වීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ඇගයීම් කටයුතු මඟින් තෝරා ගනු ලබන සුදුසුම ආයෝජක සමාගම හා රාජ්‍ය ව්‍යවසාය විසින් අත්සන් කළ යුතු ගිවිසුම සකස් කිරීම හා ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ කටයුතු නීති අංශය හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිදු කිරීම.
- ආයෝජක සමාගම තෝරා ගැනීමෙන් පසුව රාජ්‍ය ව්‍යවසාය හා ආයෝජක සමාගම අතර ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සංවිධානය හා සම්බන්ධීකරණය සිදු කිරීම.

# 09

# පේෂ කර්මාන්ත හා දේශීය ඇගළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය

## 9.1 හැඳින්වීම

පේෂ කර්මාන්ත හා දේශීය ඇගළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශය (2022 මැයි මාසයට පෙර බතික් අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇගැළුම් නිෂ්පාදන අංශය ) යටතේ පහත සඳහන් දෙපාර්තමේන්තු හා ආයතන සමග එක්ව අදාල කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කරගෙන යනු ලැබේ .

- පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- සී/ස සළුසල ආයතනය

## අරමුණු

1. 2025 වනවිට දේශීය ඇඟළුම් අපනයනය වැඩිකර ඇමරිකානු ඩොලර් බිලියන (USD) 1.5 ක අමතර ආදායම් උපයා ගැනීම.
2. 2025 වනවිට ග්‍රාමීය මට්ටමින් කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත 500 ක් ස්ථාපිත කර ඇඟළුම් කර්මාන්තයේ නියැලී සිට ඉන් ඉවත් වූ ඇඟළුම් සේවිකාවන් 9,000 ක් රැකියාවේ නිරත කරවීම.
3. ජාතික උරුමයන්ගෙන් සැදුම්ලත් ආකර්ෂණීය මෝස්තර භාවිතය මගින් සංචාරක ආකර්ෂණය ඇති කිරීම තුළින් බතික් නිෂ්පාදන 2025 වසර වන විට 50% කින් ඉහළ නංවා ගැනීම.
4. නව මෝස්තර හා වර්ණ භාවිතය මගින් සරල හා කල් පවත්නා ඇඳුම් නිර්මාණය කොට වර්ෂ 2025 වන විට පාරිභෝගික ආකර්ෂණය 40% ප්‍රතිශතයකින් ඉහළ නැංවීම.
5. 2025 වසර වන විට විශ්ව විද්‍යාල ඇතුළු කාර්මික වෘත්තීය හා තෘතීය අධ්‍යාපනය තුළින් දේශීය ඇඟළුම් සම්බන්ධ පුහුණු ශ්‍රමික වෙළඳපොළ 60% ප්‍රතිශතයකින් ඉහළ නැංවීම.

6. වසර 2023 වන විට ඩිජිටල් වේදිකාව (E-Platform) ස්ථාපිත කිරීම තුළින් බතික් අත්යන්ත්‍ර හා ඇඟළුම් කර්මාන්තයට හිතකර “ඊ පරිසරයක්” නිර්මාණය කිරීම.

7. 2025 දී බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් කර්මාන්තයේ නිෂ්පාදන ක්‍රියාවලියේ තාක්‍ෂණය 50% කින් වැඩි දියුණු කිරීම.

8. තාක්ෂණික හා වෘත්තීය කුසලතාවය ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ තරුණියන්ට හා වැඩිහිටියන්ට දේශීය ඇඟළුම් ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා 50,000 ක් 2025 වසර වන විට ඇති කිරීම තුළින් නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

9. 2025 වසර වන විට දේශීය ඇඟළුම් ක්ෂේත්‍රයේ නව ව්‍යවසායකයින් 5000 ක් බිහි කිරීම තුළින් තෘප්තිමත් හා සුවපහසු ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම.

## 9.2 කාර්ය සාධනය 2022 සැප්තැම්බර් 30 දක්වා

2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට අනුව රු.මිලි 50 ක් හා අයවැය යෝජනාව අනුව රු.මිලි.1000 ක් පේෂකර්මාන්ත හා දේශීය ඇඟළුම් නිෂ්පාදන ප්‍රවර්ධන අංශයේ සංවර්ධන කටයුතු සඳහා වෙන්කරනු ලැබිය.එසේම භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛන අනුව එම වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන වලින් රු.මිලියන 900 ක් කපා හැර රු.මි . 150 ක් පමණක් වෙන් කරනු ලැබිය. ඒ අනුව නැවත සැලසුම් සංශෝධනය කර පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

### 1.බතික් නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන

මේ වන විට දිස්ත්‍රික්ක 15 ක බතික් නිෂ්පාදන මධ්‍යස්ථාන 25ක පුහුණුවීම් කටයුතු ආරම්භ කර ඇත. ඒ සඳහා රු. මිලියන 20ක් වෙන්කර ඇත.

### 2.අත්යන්ත්‍ර පේෂ කර්ම ගම්මාන වැඩසටහන

මේ යටතේ පලාත් 08 ක පිහිටුවන ලද අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ගම්මාන 15ක් හා පොදු පහසුකම් වැඩි දියුණු කිරීමේ මධ්‍යස්ථාන සඳහා නවීන තාක්ෂණික මෙවලම් ලබාදීමට සැලසුම් කෙරිණ. මේ යටතේ එක් ගම්මානයකින් අත්යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදකයන් 10 දෙනෙකු තෝරා ගෙන අවශ්‍ය උපකරණ ලබා දීමත්, එම නිෂ්පාදන ගම්මාන ආශ්‍රිතව පිහිටි පේෂකර්මාන්ත නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා විදුලියෙන් ක්‍රියාත්මක වන වෝප් මැෂින් ඇතුළු අනෙක් උපාංග ලබාදීමට සැලසුම් කර ඇත.මෙම කටයුතු සඳහා වෙන්කර ඇති මුදල රු. මිලියන කි 27.

### 3.කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්ත ශාලා ස්ථාපිත කිරීමේ වැඩසටහන

දේශීය ඇඟළුම් නිෂ්පාදනය ඉහල නංවා අපනයන ආදායම වැඩිකිරීමට හා රෙදිපිලි ආනයනය සීමා කිරීමේ අරමුණින් කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා 40ක් ස්ථාපිත කිරීමට නියමිතව තිබූ අතර රාජ්‍ය වියදම් සීමා කිරීම හා රටේ පවතින ආර්ථික අර්බුදය හමුවේ විදේශ විනිමය හිඟකම නිසා අත්‍යවශ්‍ය මැෂින් වර්ග ආනයනය කිරීමට නොහැකි වීමෙන් එය ක්‍රියාත්මක කිරීම අත්හි ටුවන ලදී.ඒ සඳහා වෙන් කරන ලද මුදල රු.මිලි.98 කි.

### 4.අලෙවි ප්‍රවර්ධන වැඩසටහන

බතික් අත්යන්ත්‍ර හා දේශීය රෙදිපිලි නිෂ්පාදනකරුවන්ගේ අලෙවිය දිරිමත් කිරීම සඳහා අලෙවි ප්‍රවර්ධන වෙළඳ පොලවල් 02 ක් හා එක් රෙදිපිලි ප්‍රදර්ශනයක් සැලසුම් කර එම අලෙවි ප්‍රවර්ධන කටයුතු සම්පූර්ණයෙන් නිම කර ඇත. ඒ සඳහා වැය කල මුදල රු.මිලි.3.8 කි.

**2022.01.12 සහ 13 දිනයන්හි උතුරු පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව සමග පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශනය**




## 9.3 අනාගත සැලසුම් - 2023

1 දේශීය සන්නාම සහිත ඇඟළුම් කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලෙස භාවිත කරනු ලබන රෙදිපිළි හා උපාංග ආනයනය කිරීමට පනවා ඇති ආනයන සීමා ඉවත් කර බදු සහන ලබාදීම.

2.2025 වන විට අමතර විදේශ විනිමයක් උපයාගත හැකිවන පරිදි කුඩා පරිමාණ ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තශාලා ස්ථාපිත කිරීම.

3.2023 වර්ෂයේ කුඩා පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා 40 ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත. මෙමඟින් දේශීය ඇඟළුම් නිෂ්පාදනය ඉහල නංවා අපනයන ආදායම වැඩි කිරීම හා රෙදිපිළි ආනයනය සීමා කිරීමට හැකිවන අතර ග්‍රාමීය ප්‍රදේශවල රැකියා විරහිත කාන්තාවන් හට රැකියා අවස්ථා උදාවී ජීවනෝපාය උසස් වීමත් සිදුවේ.

4.බතික් නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන- දේශීය මෙන්ම විදේශීය ඉල්ලුමක් පවතින නවීන මෝස්තර සහිත බතික් රෙදිපිළි නිෂ්පාදනය ඉහල නැංවීම සඳහා බතික් නිෂ්පාදනකරුවන් 300 දෙනෙක් සඳහා උසස් නවීන මෝස්තර නිර්මාණ උසස් පුහුණුවක් ලබා දී නවීන විලාසිතා සහිත බතික් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම.

5. කෘත්‍රිම වර්ණක වර්ග භාවිතය වෙනුවට ශාක වර්ග සහ වෙනත් ස්වභාවික ද්‍රව්‍ය භාවිතයෙන් සකස් කර ගන්නා ලද ස්වභාවික වර්ණක වර්ග නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා මේ පිලිබඳව උනන්දුවක් දක්වන ආයතන සමඟ සම්බන්ධ වී පර්යේෂණ සිදු කිරීම හා නිෂ්පාදන හැකියාවන් සොයා බැලීම.

6..අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ යෙදී සිටින අය සඳහා නවීන පන්නයේ උපාංග ලබාදීම හා පොදුවේ පවත්වාගෙන යනු ලබන නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා නවීන පන්නයේ උපකරණ /උපාංග ලබාදීම.

7..දේශීය හා විදේශීය සංචාරකයින් ගැවසෙන ජනප්‍රිය ස්ථානවල හා නගර බතික් අත්යන්ත්‍ර හා දේශීය ඇඟළුම් නිෂ්පාදනය එකම ස්ථානයකින් ලබා ගැනීමට හැකිවන පරිදි රෙදිපිළි අලෙවි පුරවරයක් නිර්මාණය කිරීම.

**8.** තරුණ ප්‍රජාව අතර ඇති නව මෝස්තර හා විලාසිතා ප්‍රවණතාවයන් ඉල්ක්ක කර ගනිමින් දේශීය සහ විදේශීය වෙළඳපොල තුල බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා රෙදිපිළි නිෂ්පාදන විවිධාංගීකරණය සහ නව මොස්තර නිර්මාණ වෙළඳපොලට හඳුන්වා දීම.

8. ක්ෂේත්‍රයේ සැපයුම්දාම කලමණාකරණයේ නියැලෙන සියළු කොටස්කරුවන්, පාරිභෝගිකයන් මෙන්ම නිෂ්පාදකයන් අතර ගණාදෙනු හිතකර ඊ- පරිසරයක් තුල සිදු කිරීම සඳහා Digital Platform නිර්මාණය කිරීම.

මෙම වැඩසටහන් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම තුලින් පවතින ආර්ථික අර්බුදයට විසඳුමක් ලෙස අමතර විදේශ විනිමයක් උපයා ගැනීම හා රෙදිපිළි ආනයනය සීමා කිරීම තුලින් දේශීය රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

# 10

# මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත අංශය

## 10.1 හැදින්වීම

ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන අප රටේ මැණික් කර්මාන්තය ලෝකයේ අගනා හා දුර්ලභ මැණික් වලින් පරිපූර්ණ රටක් ලෙස ප්‍රසිද්ධියට පත් වී ඇත. එසේම ලංකාවේ ස්වර්ණාභරණ කර්මාන්තයද අතීතයේ සිට සම්ප්‍රදායක උරුමයන් රැක ගනිමින් දිනෙන් දින සංවර්ධනය වන කර්මාන්තයකි. ඒ අනුව, ශ්‍රී ලංකාව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තරඟකාරී ජාත්‍යන්තර මධ්‍යස්ථානය බවට පත් කිරීම උදෙසා අප කැප වී සිටිමු.

අප රට සතු මැණික් සම්පත, පරිසරයද උපරිමයෙන් ආරක්ෂා කරගනිමින් නවීන තාක්ෂණය ද මුසු කරගනිමින් සුරක්ෂිතව ගොඩගෙන පුද්ගලික අංශය ද එක්කර ගනිමින් අගය වැඩිකිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කරමින් මෙන්ම ස්වර්ණාභරණ කර්මාන්තය ද ප්‍රවර්ධන කරමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ තිරසර සංවර්ධනය වෙනුවෙන් අප පෙරමුණ ගෙන සිටී.

ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන වටිනාකමින් 3% කට ආසන්න ප්‍රමාණයකට දායකත්වයක් දක්වන මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ යෙදී සිටින කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය බදු සහනයන්, තාක්ෂණික සහායයන් ඇතුලු අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීමට කටයුතු කර ඇති අතර ඒ තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීම අරමුණ වේ.

සංචාරක කර්මාන්තය සමඟද අත්වැල් බැඳ ගනිමින් ලොව අංක එකේ මැණික් ගැනුම්කරුවන් ගේ ගමනාන්තය බවට අප රට පත් කිරීම මෙන්ම දේශීයව හා විදේශීය ඉල්ලුමට සරිලන නවීන තාක්ෂණයෙන්,ගුණාත්මකභාවයෙන් හා මනා නිමාවකින් යුතු ස්වර්ණාභරණ නිෂ්පාදනය කරන කර්මාන්තයක් බිහි කිරීම අපගේ තිර අධිෂ්ඨානයයි.

මෙම අංශය යටතේ ,

- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය යන ආයතන ක්‍රියාත්මක වේ.

## අරමුණු

01. භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් අධිතාක්ෂණය භාවිත කර ගවේෂණය කර නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනීම.

02. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ වෙළඳාම ප්‍රවර්ධනය හා නියාමනය

03. පුද්ගලික අංශය සමග තරඟකාරී මට්ටමින් මැණික් ආශ්‍රිත කර්මාන්ත නිර්මාණශීලී ප්‍රවේශයක් හරහා නව්‍යකරණයට ලක් කිරීම.

04. මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් ලබාගත යුතු අවසර පත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සරල කිරීමට කටයුතු කිරීම.

## 10.2 ප්‍රගතිය 2022 (2022.09.30 දිනට)

- **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ආර්ථික දායකත්වය**

2021 වර්ෂයේදී එකී වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 264.71 ක් පමණ වූ අතර, 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන විට උපයා ගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 294.92 ක් වේ.

| අපනයන වටිනාකම - 2022 සැප්. 30 දිනට | | |
|---|---|---|
| අපනයන නිෂ්පාදනය | අපනයන වටිනාකම (ඇ.ඩො. මිලියන) | % |
| මැණික් | 136.79 | 46% |
| ස්වර්ණාභරණ | 10.18 | 3% |
| දියමන්ති | 147.95 | 51% |
| මුලු වටිනාකම | 294.92 | 100% |

*මූලාශ්‍රය: මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත අංශය*

- **ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70% ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත් වලින් මේ වන විට 20% ක් පමණක් මේ දක්වා ගවේෂණය කර ඇත.

මෙය ප්‍රමුඛ කාර්යයක් සේ හඳුනා ගෙන ඇති අතර, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය විසින් නව තාක්ෂණය භාවිතා කරමින් නව මැණික් නිධි ගවේෂණය කිරීමට කටයුතු කරමින් පවතී. 2022 වර්ෂයේදී කිරිඇල්ල හා නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා මැණික් විභව සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

මෙම මැණික් නිධි ගවේෂණ ව්‍යාපෘතිය කඩිනම් කිරීම සඳහා සබරගමුව විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව මැණික් නිධි ගවේෂණය පිළිබඳ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙමඟින්, සබරගමුව විශ්ව විද්‍යාලයේ අදාළ වෘත්තීය දැනුම ඇති ආචාර්යවරුන් සහ උපාධි හා පශ්චාත් උපාධි අපේක්ෂකයින් ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කර ගැනීමටත්, පතල් කැණීම සම්බන්ධයෙන් වන විශේෂඥ දැනුම අවශ්‍ය කරන අවස්ථාවන් වලදී මොරටුව විශ්ව

විද්‍යාලය, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය හා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අදාළ වෘත්තිමය අංශයන් සම්බන්ධ කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

**නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**




- **මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුනතාවය ඉහළ නැංවීම**

2022 වර්ෂය සඳහා ඉලක්ක ගත සිසුන් සංඛ්‍යාව 555 ක් වු අතර, 2022 සැප්තැම්බර් මස 30 වන විට සිසුන් 570 ක් බඳවා ගෙන ඇත.. මෙම වර්ෂයේදී පාඨමාලා නිම කළ සිසුන් ප්‍රමාණය 214 ක් වේ.

- **වටිනාකම එකතු කිරීමෙන් තොරව අපනයනය කරන මැණික් සම්පත එසේ අපනයනය කිරීම සීමා කොට වටිනාකම් එකතු කළ ඉහළ අපනයන ආදායමක් ලබා ගත හැකි නිෂ්පාදන බවට පත් කර අපනයනය කිරීම සඳහා සහායවීම.**

**i. මැණික් තාපකරණය හා වර්ණ ගැන්වීම (Heat Treatment and Color Enhancing) සඳහා පහසුකම් ඇති කිරීම.**

මැණික් තාපකරණය හා වර්ණ ගැන්වීම පිළිබඳව පර්යේෂණ සිදුකිරීම හා අදාළ ව්‍යාපාරිකයින්ට සේවා ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සබරගමුව විශ්වවිද්‍යාලය සමඟ ඒකාබද්ධව වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් පවතී.

**ii. මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අවශ්‍ය ශිල්පීන්/වෘත්තිකයින් බිහිකිරීම සඳහා පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම.**

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) ලබාගැනීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කරමින් පවතී.

**iii. කපා ඔපදමන මැණික් අපනයනය වෙනුවට නිම කරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කිරීම අවශ්‍ය සහතික ලබා දීම.**

- **දැනට භූගතව ඇතැයි සැලකෙන මැණික් සම්පත් නූතන අධිතාක්ෂණ භාවිතයෙන් ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම.**

**i. විවිධ බලපත්‍ර හා අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම හා සේවා කඩිනම් කිරීම සඳහා සේවා පියස (One Stop Shop) ක්‍රමය ආරම්භ කිරීම.**

එක වහලක් යට නව බලපත්‍ර ලබාදීමට අදාළ චක්‍රලේඛය නිකුත්කොට, විවිධ බලපත්‍ර හා අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කර ඇති අතර, මේ වනවිට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. සති 3 ක් ඇතුලත බලපත්‍ර ලබාදීමට කටයුතු කෙරේ

**ii. කුඹුරු ඉඩම් වල මැණික් ගැරීම සඳහා තිබු සීමාවන් ලිහිල් කිරීමට කටයුතු කිරීම.**

- වරකට පර්චස් 20කට පමණක් සීමා කර තිබූ පතල් අවසරය පර්චස් 40 දක්වා වැඩි කිරිම.
- පර්චස් 20කට වැඩි වන විට පර්චස් 01කට රුපියල් 1,000 ලෙස පැවති අමතර සේවා ගාස්තුව පර්චස් 01කට රුපියල් 250 ක් දක්වා අඩු කිරිම.
- පතල් වලවල් වැසීම සඳහා අධිකාරිය විසින් අයකළ මුදලට අමතරව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ද අය කළ ඇප මුදල ඉවත් කිරිම.

- **සබරගමුව විශ්ව විද්‍යාලයේ මැණික් සහ ස්වර්ණාභරණ පාඨමාලාවන් නවීකරණය කිරීම සඳහා පවතින රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරිමට අවශ්‍ය සහයෝගය ලබාදීම.**

- මේ සඳහා මැණික් සහ ස්වර්ණාභරණ සංගම්වල මූල්‍ය දායකත්වයන් යටතේ රුපියල් මිලියන 10 ක් පමණ වටිනා රසායනාගාර උපකරණ හා අනෙකුත් ද්‍රව්‍ය ලබාදීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකර ඇත.

- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පනත සංශෝධනය කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මහජන පැමිණිලි විමර්ශනය කිරීම.

මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත ක්ෂේත්‍රයට 2022 වර්ෂයේ පැමිණිලි 28 ක් ලැබී ඇති අතර, ඉන් 18 ක් සඳහා මේ වන විට පිළිතුරු යවා ඇත.

## 10.3 අනාගත සැලසුම් - 2023

මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම් 2023 වර්ෂයේදී ඇ.ඩො. බිලියනය දක්වා වැඩි කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම.

ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

මැඩගස්කරය, ටැන්සානියාව, නයිජීරියාව, මොසැම්බික් වැනි විදේශීය රටවල රළු මැණික් මෙරටට ගෙන්වා අගය වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම

- මැණික් තාපකරණය, අගය වැඩි කිරීම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම
- ජාත්‍යන්තර මට්ටටම් මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීම.
- කපා ඔපදමන ලද හා රළු මැණික් වෙන්දේසි පැවැත්වීමට කටයුතු කිරීම.
- රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය විවෘත කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පාඨමාලා සංවර්ධනය කිරීම හා බඳවාගන්නා පුහුණුලාභීන් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාවය පරිදි නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට කටයුතු කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමග විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ කර්මාන්ත කරුවන් පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීම.
- මැණික් අපනයනය සඳහා නව වෙළඳපොළවල් හඳුනාගැනීම හා ගිවිසුම් ගතවීම.

# 11

# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය

## 11.1 හැඳින්වීම

වේවැල්, පිත්තල,මැටි,ලී බඩු ඇතුළු ග්‍රාමීය කර්මාන්ත අගය වැඩිකිරීමේ කර්මාන්ත ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබා දීම උදෙසා ස්ථාපිත කර ඇති මෙම අංශය විසින් අදාළ කර්මාන්තයන් හි ප්‍රගමනය උදෙසා සංවර්ධන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

## 11.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දිනට)

### ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන

දේශීය කර්මාන්තකරුවන්ට අඛණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අමුද්‍රව්‍ය සැපයීම සහතික කිරීම, විදේශ විනිමය ඉතිරි කිරීම සාධාරණ මිලකට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීමට අවස්ථාව සැලසීම හා ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය අවම කිරීම යන මූලික අරමුණු ඇතිව මෙම වසරේ අක්කර 150ක අමුද්‍රව්‍ය වගා කිරීමට සැලසුම් කර ඇති අතර මේ වන විට අක්කර 46ක් වගා කර අතර දැනට වියදම රු.මි. 41.01 කි.

- මහවැලි බී කලාපයේ අක්කර 36ක හණ පැළ 36000ක් හා බදුල්ල කන්දකැටිය අක්කර 7.5ක පැළ 7000 සිටුවා ඇති අතර ඕපනායක අක්කර 2.5ක වේවැල් පැළ සිටුවා ඇත.
- මහවැලි B කලාපයේ 7Km ක ආරක්ෂිත වැට සම්පූර්ණ කර ඇත.
- මාතර කඹුරුපිටිය වේවැල් හා අනුරාධපුර හණ වගාවේ නඩත්තු කටයුතු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සිදුකරමින් පවතින අතර ගාල්ල බෙන්තොට ගල්ලැහැපන් අක්කර1ක් සඳහා නඩත්තු කටයුතු සිදු කර ඇත.

**මහවැලි බී කලාපයේ හණ වගාව**





## ජාතික අමුද්‍රව්‍ය කළමනාකරණ ඒකකය ස්ථාපිත කිරීම

ජාතික ශිල්ප සභාව යටතේ පළාත් මට්ටමින් අමුද්‍රව්‍ය ගබඩා ස්ථාපිත කර කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඉතා සාධාරණ මිලට ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් මෙම ව්‍යාපෘතිය යටතේ සලසා දී ඇත. (වියදම රු.මි.3.37)

- බුලත්සිංහල අමුද්‍රව්‍ය ගබඩාව සංවර්ධනය කරමින් පවතී.
- නන්නපුරාව හා වරාගොඩ අමුද්‍රව්‍ය ගබඩා සඳහා තෙකලා විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී
- වරාගොඩ පුහුණු මධ්‍යස්ථානයට හා අමුද්‍රව්‍ය කළමනාකරණ ඒකක සඳහා අවශ්‍ය උපකරණ රාජ්‍ය වාණිජ සංස්ථාව (STC) මඟින් ලබා ගෙන ඇත.

## ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන

සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත දේශීය හා විදේශීය වෙළඳපළට භාණ්ඩ සැපයීමට හැකිවන පරිදි ගුණත්වයෙන් යුත් නිෂ්පාදන බිහි කරන කර්මාන්ත ගම්මාන බවට පත් කිරීම හා එම ගම්මාන ආශ්‍රිතව සෘජු හා වක්‍ර රැකියා අවස්ථා පුළුල් කරමින් ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීම, කාන්තාවන් අතර සේවා නියුක්තිය ශක්තිමත් කිරීම හා ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.(වියදම රු.මි.3.75)

- 2021 වසරේ සංවර්ධනය කළ ගම්මාන 21ක නව නිෂ්පාදන හා මෝස්තර පුහුණු වැඩසටහන් සම්පූර්ණ කර ඇත (ප්‍රතිලාභීන් 640)

## දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන

මේ යටතේ, මෙම අංශය විසින් ජාතික ශිල්ප සභාව හරහා හස්ත කර්මාන්ත නිෂ්පාදන අළෙවි වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත. එහි දී, දේශීය හා විදේශීය විශේෂිත දිනයන් හා උත්සව අවස්ථා වල දී අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පළාත් මට්ටමින් මාසිකව හෝ ත්‍රෛමාසිකව අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, තෝරා ගත් සුපිරි වෙළඳසැල් හි විශේෂ අළෙවි කුටි ස්ථාපිත කර භාණ්ඩ අළෙවි කිරීම ආදී වැඩසටහන් සිදු කර ඇත.
(වියදම රු.මි. 24.26)

- බත්තරමුල්ල දියත උයන පරිශ්‍රය කේන්ද්‍ර කර ගනිමින් "Shilpa Thursday" දේශීය අළෙවිපොල අවස්ථා 04 ක් පවත්වා ඇති අතර (ජනවාරි 06,13 හා මාර්තු 24, 31 යන දින) එහි දී, ශිල්පීන් 85 දෙනකු සඳහා අළෙවි අවස්ථා උදා කර දී ඇත.

**දියත උයන පරිශ්‍රයේ අළෙවිපොල අවස්ථා උදා කර දීම (Shilpa Thursday)**



- නාරාහේන්පිට "රජවාසල" පරිශ්‍රය කේන්ද්‍ර කර ගනිමින් හස්ත කර්මාන්ත නිෂ්පාදන අළෙවි වැඩසටහන් 10ක් පවත්වා ඇත.(මාර්තු 25,26,27 හා අප්‍රේල් 1,2,8,9,10,29,30 දිනයන් හි)

එහි දී, ශිල්පීන් 20 දෙනකු සඳහා අළෙවි අවස්ථා උදා කර දී ඇත.

**නාරාහේන්පිට රජවාසල පරිශ්‍රයේ දේශීය වෙළඳපොල අළෙවි අවස්ථා උදා කර දීම**







- වරාගොඩ, පල්ලෙකැලේ සහ සීගිරිය ″ලක් ශිල්ප″ අළෙවි ප්‍රදර්ශනාගාර විවෘත කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරමින් පවතී.
- ඉන්දියාවේ හර්යානා හි පැවති සුරාජ් කුන්ඩ් අන්තර්ජාතික ප්‍රදර්ශනය සඳහා හස්ත කර්මාන්ත ශිල්පීන් 07 දෙනෙකු සහභාගී කරවීම.
- ඉන්දියාවේ පැවති 09 වන ″Edition of EximBazzar-2022″ සඳහා ශිල්පීන් 03 දෙනෙකු සහභාගී කරවා ඇත.
- ඩුබායි හි පැවති ″Expo 2022″ ප්‍රදර්ශනය සඳහා හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ "ලක්ශිල්ප" සන්නාමය යටතේ ඉදිරිපත් කර ඇත
- තායිලන්තයේ බැංකොක් නුවර 55 වැනි රාජ්‍ය තාන්ත්‍රික රතු කුරුස අළෙවි ප්‍රදර්ශනය සඳහා හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිර්මාණ "ලක්ශිල්ප" සන්නාමය යටතේ ඉදිරිපත් කිරීම.
- 67 වන "Diplomatic Charity Bazzar, Thailand" සඳහා නිර්මාණ සාම්පල් ඉදිරිපත් කර ඇත.
- එක්සත් රාජධානියේ "Bed Ford River Side Festival" සඳහා (ජූලි 23,24) නිර්මාණ ඉදිරිපත් කර ඇත.
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ අලෙවිකරණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව අළෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

මෙහිදී, වෙළඳපල විශ්ලේෂණයන් සහ ව්‍යවසායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් නිම කර ඇති අතර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු තවදුරටත් සිදු කෙරෙමින් පවතී.

- රටවල් 26 ක වාණිජ දෙපාර්තමේන්තු සමඟ ඒකාබද්ධව එම රටවල්වල ශ්‍රී ලාංකේය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමට හා එම රටවල් වලට ගැලපෙන පරිදි මෙරට නිෂ්පාදන සිදුකිරීම සඳහා අවශ්‍ය මෝස්තර සහ නිර්මාණ පිළිබඳ තොරතුරු ලබාගැනීමත් සාකච්ඡා කර ඇත.

- ජාතික නවෝත්පාදන නියෝජිතායතනය හරහා කොරියාවේ Korean Intellectual Property Office සහ Korean invention Promotion Association යන ආයතනවලින් ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නඟා සිටුවීම සඳහා අවශ්‍ය තාක්ෂණය සහ නවෝත්පාදන සිදු කිරීමට අවශ්‍ය සහයෝගය ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර ඇත.

- ඩිජිටල් තාක්ෂණය සම්බන්ධයෙන් දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුවත් කිරීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් SME GO Digital නමින් ව්‍යාපෘතියක් හඳුන්වා දී ඇත. ජාතික ශිල්ප සභාවේ ශිෂ්‍යයින් 50 ක් සඳහා අලෙවිකරණය සහ Freelancing සම්බන්ධයෙන් වැඩසටහනක් පැවති අතර නිලධාරීන් 110ක් සඳහා ව්‍යවසායකත්වය පිළිබඳ වැඩමුළු 02 ක් පැවැත්විණි. තෝරාගත් ගම්මාන 11ක මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට තීරණය කර ඇත.

### දැව ආශ්‍රිත මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය පිහිටුවීම

දැව ආශ්‍රිත නිර්මාණයන් හි නිරත වන්නා වූ කර්මාන්තකරුවන් දිරිමත් කරමින් ඔවුන්ට අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වා දීම හා නිර්මාණ නවෝත්පාදනය සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව,

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය විසින් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල ආයතනය) සතුව තිබූ මොරටුව කටුබැද්ද යාන්ත්‍රික පුහුණු පරිශ්‍රය 2022.09.09 දින භාර ගෙන දැව ආශ්‍රිත කර්මාන්තකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරමින් පවතී .

- කොහු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තකරුවන් මුහුණපාන ගැටළු හඳුනා ගැනීම සඳහා වස්කඩුව හා ඇහැලියගොඩ යන කොහු ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන වෙත විෂය ප්‍රවීණයන් සමඟින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර හඳුනා ගත් ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය සමඟින් ඉදිරි කටයුතු ආරම්භ කර ඇත.

### ජාතික ලෝකුරු කර්මාන්ත සංවර්ධන වැඩසටහන

ඊට අදාළව, හඳුනා ගත් තාක්ෂණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන් යටතේ වැබඩ හා ඇහැළියගොඩ ප්‍රදේශයන්හි දැනට භාවිතයෙන් ඉවත් කර ඇති ලෝහ භාණ්ඩ නිෂ්පාදන යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ කටයුතු CINEC විශ්වවිද්‍යාලය මඟින් සිදු කරවා ගෙන ඇත.

## 11.3 අනාගත සැලසුම් - 2023

මෙම අංශය විසින් එයට අදාළව පවරා ඇති කාර්යය හා කර්තව්‍යයන් හි ඇතුළත් කර්මාන්තයන්ගේ ප්‍රගමනය උදෙසා හඳුනාගත් සංවර්ධන වැඩසටහන් 2025 වසර දක්වාම අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට සැලසුම් කර ඇත. ඒ අනුව, 2023 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් පහත පරිදි වේ.

I. ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරීමේ වැඩසටහන (අපේක්ෂිත පිරිවැය රු.මි.20)

II. ජාතික අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපනය කිරීම (අපේක්ෂිත පිරිවැය රු.මි.10)

III. දැව නිෂ්පාදන ආශ්‍රිත මෝස්තර හා ක්‍රියාවලි නව්‍යකරණ මධ්‍යස්ථානය පිහිටුවීම (අපේක්ෂිත පිරිවැය රු.මි.15)

IV. ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල ප්‍රවර්ධන වැඩසටහන (අපේක්ෂිත පිරිවැය රු.මි.38)

V. ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන(අපේක්ෂිත පිරිවැය රු.මි.12)

VI. ජාතික ලෝකුරු කර්මාන්ත සංවර්ධන වැඩසටහන (අපේක්ෂිත පිරිවැය රු.මි.05)

# දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා



# 12

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)

## 12.1 හැඳින්වීම

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ආයතනයකි.

### දැක්ම

සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම.

### මෙහෙවර

සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයාදීම.

### ප්‍රධාන අරමුණු

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම.
- මෙරට ආර්ථිකයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශයන්ට අයත් සියලුම කාර්මික ව්‍යාපාරයන්හි නිසි සම්බන්ධීකරණය සහ එකිනෙකට සබැඳි වර්ධනය සඳහා සහායවීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝජනය කිරීම, කර්මාන්තවලදී භාවිතා කරනු ලබන තාක්ෂණික ක්‍රියාවලීන් සහ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා යෝග්‍ය තාක්ෂණයන් සහ උපකරණ සංවර්ධනය කිරීම සහ නිෂ්පාදන අපද්‍රව්‍ය වඩා යහපත් ලෙස උපයෝජනය කිරීම සඳහා ක්‍රියාවලින් සහ ක්‍රමවේදයන් සකස් කිරීම යන අරමුණු ඇතිව කර්මාන්ත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

- දේශීය කර්මාන්ත නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය වන හෝ හිතකර වන පරිදි අන්තර්ජාතික වෙළඳාම සහ කලාපීය සහයෝගීතාවය යන ක්ෂේත්‍රවලදී ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය දීම.
- ප්‍රාග්ධනය, අලෙවිකරණ, කළමනාකරණ, සහ තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් සපයා දීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම කාර්මික ව්‍යාපාරයක් හෝ කාර්මික ආයතනයකට හෝ ඒ අදාළව අවශ්‍ය කරන සෑම ආකාරයකම පහසුකම් සහ සේවා සැපයීම.

## ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් හා කාර්යයන්

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට නව ව්‍යාපාර ආරම්භය සහ පවත්නා ව්‍යාපාර සංවර්ධනය කෙරෙහි පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි.

- කළමනාකරණ තාක්ෂණික සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ පුහුණු වැඩසටහන් සහ උපදේශන සේවා සැපයීම.
- ඉංජිනේරු සේවා වැඩහල් පහසුකම් වාත්තු සේවා සහ අනෙකුත් ඉංජිනේරු සහායයන් ලබාදීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට නව ව්‍යාපාර ක්ෂේත්‍ර පිළිබඳව දැනුවත් කිරීම.
- කාර්මිකයන්, සේවාදායකයින් සහ කාර්යය මණ්ඩලය සඳහා කාර්මික තොරතුරු බෙදාහැරීම.
- කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම.
- තාක්ෂණික සේවා සැපයීම හා දේශීය ලෝහ කර්මාන්තකරුවන් වෙත අවශ්‍ය පහසුකම් සැලසීම.

## පහසුකම් හා සේවා

1. කාර්මික ජනපද
2. රබර් භාණ්ඩ සංවර්ධන සේවා
3. විද්‍යුත් ලෝහ ආලේපන සේවා
4. ඉංජිනේරු සේවා
5. තාක්ෂණ රසායනාගාර සේවා
6. ආහාර පාන තත්ත්ව වාර්තා ලබාදීම සඳහා රසායනාගාර පහසුකම්
7. සම්භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන සේවා
8. ඉංජිනේරු වාත්තුසේවා
9. ද්‍රව්‍ය පරීක්ෂණ රසායනාගාර සේවා
10. ලක්කම් අලෙවි මධ්‍යස්ථානය (අලෙවි ප්‍රවර්ධනය)
11. ලෝහමය නිෂ්පාදන අබලි ද්‍රව්‍ය ලබාදීම
12. උසස් තාක්ෂණික නිෂ්පාදන සහ උපාංග සංවර්ධන සේවා

## 12.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

2022 වර්ෂය තුළදී කාර්මික සංවර්ධන මණ්ඩලය මෙරට ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ආකාරවලින් සහාය සහ උපකාරක සේවා සපයා දී ඇත. එමෙන්ම, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම සම්බන්ධ ක්‍රමෝපාය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ද මණ්ඩලය බැඳී සිටියි. මෙම අරමුණු මුදුන්පත් කර ගැනීම පිණිස සහ කර්මාන්ත සඳහා දේශීය මෙන් ම විදේශීය වෙළඳ පොළ ද පුළුල් කිරීම පිණිස කාර්මික සංවර්ධන මණ්ඩලය රේඛීය අමාත්‍යාංශය සමග ඒකාබද්ධ වී විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති හඳුන්වා දීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නිරත වී සිටියි.

## 2022 සැප්තැම්බර් මස අවසානයට භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|
| නව කර්මාන්ත බිහිකිරීම සඳහා සහාය (කර්මාන්ත සංඛ්‍යාව) | 103 |
| පවතින කර්මාන්ත සංවර්ධනය සඳහා සහාය (කර්මාන්ත සංඛ්‍යාව) | 302 |
| පවත්වනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන් | 262 |
| ව්‍යවසායකත්ව සංවර්ධන සහ කළමනාකරණ පුහුණු වැඩසටහන් | 51 |
| ලෝහමය අමුද්‍රව්‍ය සහන මිළට ලබාදීම (මෙ.ටොන්) | 956 |
| රබර් සංයෝග රබර් ආශ්‍රිත කර්මාන්තවලට සැපයීම (කි. ග්‍රෑම්)(කර්මාන්තකරුවන් 200කි.) | 21,173 |
| රසායනාගාරය මගින් ආහාර පාන තත්ත්ව වාර්තා ලබාදීම (කර්මාන්තකරුවන් සංඛ්‍යාව) | 233 |
| ලක්කම් අලෙවි මධ්‍යස්ථානය මගින් කර්මාන්තකරුවන්ට අලෙවි පහසුකම්ලබාදීම (කර්මාන්තකරුවන් ගණන) ව්‍යවසායකයින් | 325 |
| කර්මාන්තකරුවන් සඳහා යන්ත්‍ර නිෂ්පාදනය ලෝහ සංයුති වාර්තා, තක්සේරු වාර්තා ලබාදීම CNC වැනි යන්ත්‍ර පහසුකම් ලබාදීම (කර්මාන්තකරුවන් ගණන) | 260 |
| කාර්මික ජනපද වල සංවර්ධිත බිම් කොටස් ලබාදීම(කර්මාන්තකරුවන් ගණන) | 13 |

මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## සේවාවන්හි ප්‍රගතිය

| | සේවාවන් | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 1 | තොරතුරු, උපදෙස් සහ උපදේශනය සේවා | 347 |
| 2 | ඉංජිනේරු සේවාවන් | 489 |
| 3 | අලෙවිකරණ සහාය ලබාදීම | 1347 |
| 4 | මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සහාය ලබාදීම | 187 |
| 5 | තාක්ෂණික සහාය ලබාදීම | 457 |
| | **එකතුව** | **2827** |

මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## කාර්මික ජනපද වල කර්මාන්ත බිහිකිරීම

| කාර්මික ජනපද ලංකා - කාර්මික සංවර්ධන මණ්ඩලය | |
|---|---|
| කාර්මික ජනපද සංඛ්‍යාව | 16 |
| වාණිජ නිෂ්පාදනයේ යෙදෙන කර්මාන්ත ගණන | 277 |
| නිෂ්පාදන ක්ෂේත්‍ර | 20 |
| මුළු රැකියා අවස්ථා ගණන | 8595 |
| අපේක්ෂිත වාර්ෂික ආදායම රු .මි. | 52,818 |

මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## පුහුණු වැඩසටහන්

| | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|---|
| 1 | තාක්ෂණ භූවමාරු වැඩසටහන් | 262 | 4272 |
| 2 | කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන් | 51 | 795 |
| | **එකතුව** | **313** | **5067** |

මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

## වෙනත් ව්‍යාපෘති / වැඩසටහන්

(1) කර්මාන්ත 2022 : ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය



දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා නිෂ්පාදන, සේවා සහ තාක්ෂණයන් ලබාදීම සඳහා දේශීය කර්මාන්තවල පවතින හැකියාවන් ප්‍රදර්ශනය කිරීම අරමුණු කරගනිමින් 'කර්මාන්ත 2022 : ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය' කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේදී හිටපු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ ඇරයුමින් හිටපු ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ සුරතින් විවෘත කෙරිණි.

## (2) ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන



'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශයට ක්‍රියාවට නංවමින් කර්මාන්ත ක්ෂේත්‍රයේ පුනරුදයකට මග පෑදීමේ තවත් ඉදිරි පියවරක් ලෙස හිටපු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මහතාගේ සංකල්පයකට අනුව කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 'ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන 2022', හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී උත්සවය පැවැත්විණි.

## (3) ඒකල කර්මාන්තපුරයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ නියමු ව්‍යාපෘතිය



ඒකල කාර්මික ජනපදයේ කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ නියමු වැඩසටහනෙහි තාක්ෂණික හවුල්කරුවෙකු වීමට එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (USAID) කැමැත්ත පළ කර ඇත.

## (4) පශ්චාත් ඉංජිනේරු තාක්ෂණය භාවිතා කරමින් විදුලි මෝටර් රථයක මූලාකෘති නිෂ්පාදනය



කාර්මික සංවර්ධන මණ්ඩලය පශ්චාත්-ඉංජිනේරු තාක්ෂණය භාවිතා කරමින් ලාභදායීව දේශීයව නිපදවිය හැකි විදුලි මෝටර් රථයක මූලාකෘති නිෂ්පාදනය සඳහා ඩිලන්ගෝ කාර්ස් පෞද්ගලික සමාගමේ සම නිර්මාතෘ ඩිලන්ත මාලගමුව සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී. මෙම නිෂ්පාදනය ජපාන මෝටර් රථ නිෂ්පාදන සමාගමක අනුග්‍රහය යටතේ ඩිලන්ගෝ කාර්ස් පෞද්ගලික සමාගම සමඟ එක්ව සිදු කෙරේ.

## (5) 2022/2023 ජා-ඇල, ඒකල IDB කර්මාන්තපුරයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය

ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) - ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන (2021 මැයි - 2026 මැයි) යටතේ විදුලි ගාස්තුවල පිරිවැය-අවම කිරීම සඳහා පුනර්ජනනීය බලශක්තිය යෙදවීම වැඩි කිරීම; ඉල්ලුම කළමනාකරණය වැඩි දියුණු කිරීම; සහ උසස් තාක්ෂණයන් යෙදවීම අරමුණු කරගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

### (6) IDB සහ Mahindra Ideal Lanka Pvt. Ltd. අවබෝධතා ගිවිසුමක් අත්සන් කරයි



ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මහින්ද්‍රා අයිඩියල් ලංකා පෞද්ගලික සමාගම සමඟ කර්මාන්තයේ සාර්ථක ගමනක් ආරම්භ කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

මෙම වැඩසටහන හරහා මහින්ද්‍රා වාහන උපාංග දේශීයව නිෂ්පාදනය කිරීමටත්, තත්ත්ව පාලන ප්‍රමිතීන් පවත්වා ගැනීමට අවශ්‍ය තාක්ෂණික පරීක්ෂණ සහ තෙවන පාර්ශවීය තත්ත්ව සහතිකයක් ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

### (7).සබන් සාදන ආකාරය පිළිබඳ පුහුණු වැඩමුළුවක්



කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මහතා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි නිරීක්ෂණ චාරිකාවක නිරත වීම.

## 12.3 අනාගත සැලසුම් - 2023

**1) 2022/2023 ජා-ඇල, ඒකල IDB කර්මාන්තපුරයේ නිෂ්පාදන කර්මාන්තවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය මඟින් කර්මාන්ත සඳහා පහත පහසුකම් ලබා දෙනු ඇත.

(i) බලශක්ති විගණන හරහා (තෝරාගත් අධි බලශක්ති තීව්‍ර කර්මාන්ත සඳහා) ඔවුන්ගේ බලශක්ති කාර්යක්ෂමතාව (විදුලිය) වැඩිදියුණු කිරීම සඳහා නොමිලේ උපදේශන සේවා.

(ii)තෝරාගත් සියලුම කර්මාන්තවල අදාළ නිලධාරීන් / කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නොමිලේ බලශක්ති කළමනාකරණ පුහුණුව ලබාදීම.

(iii) කර්මාන්තවල දායකත්වයෙන් බලශක්ති කාර්යක්ෂම විකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා නොමිලේ තාක්ෂණික උපදේශන සහ සහාය ලබාදීම.

(iv) බලශක්ති විගණනයේදී නිර්දේශිත සංවර්ධන කටයුතු සඳහා කර්මාන්ත අමාත්‍යාංශය හරහා මූල්‍ය ආධාර ලබා ගැනීමට සහාය වීම.

(v) නිතිපතා පසු විපරම් සේවා සැපයීම.

**(2) පාරිසරික වෙනස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත දක්වන ප්‍රතිචාරය වේගවත් කිරීම.**

පුනර්ජනනීය බලශක්තිය යෙදවීම වේගවත් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය, ප්‍රතිපත්ති, නියාමනයන් සහ මූල්‍ය මෙවලම් සහ යාන්ත්‍රණ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් පාරිසරික වෙනස්වීම් සඳහා ශ්‍රී ලංකාවේ කර්මාන්ත දක්වන ප්‍රතිචාරය නිර්ණය කිරීම ව්‍යාපෘතියේ විශේෂිත අරමුණයි.

(3) ශ්‍රී ලංකාව තුළ පසු අස්වනු නෙලීමේ කටයුතු ඵලදායී ව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

**2022 සැප්තැම්බර් 30 වන දිනට කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි කාර්මික ජනපද වල සාරාංශය**

| අංකය | කාර්මික ජනපදය | දිස්ත්‍රික්කය | මුළු බිම් කොටස් ගණන | යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය (රු. මි.) | මෙහෙයුම් කර්මාන්ත | පුද්ගලික ආයෝජන (රු. මි.) | වාර්ෂික පිරිවැටුම (රු. මි.) | රැකියා (ගණන) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ඒකල | ගම්පහ | 92 | 89.97 | 56 | 36669.5 | 25779 | 2759 |
| 2 | පල්ලෙකැලේ | මහනුවර | 111 | 97.82 | 65 | 13181.6 | 18750.6 | 2010 |
| 3 | පානළුව | කොළඹ | 29 | 63.9 | 22 | 1154.9 | 1304.2 | 499 |
| 4 | හොරණ | කළුතර | 66 | 14.35 | 14 | 998.51 | 4295.8 | 1469 |
| 5 | වවුලුගල | කළුතර | 14 | 19.9 | 13 | 261.1 | 459 | 195 |
| 6 | පුස්සැල්ල | රත්නපුරය | 29 | 15.21 | 11 | 214 | 126.17 | 135 |
| 7 | ගලිගමුව | කෑගල්ල | 12 | 13.8 | 10 | 132 | 145.5 | 129 |
| 8 | බුත්තල | මොනරාගල | 22 | 20 | 6 | 22.5 | 85 | 78 |
| 9 | කොටගල | නුවරඑළිය | 58 | 4.16 | 8 | 254.7 | 149.6 | 110 |
| 10 | කළුදේවල | මාතලේ | 45 | 45.3 | 14 | 164.8 | 420 | 260 |
| 11 | මිහින්තලේ | අනුරාධපුර | 38 | 5.04 | 3 | 3.7 | 20 | 20 |
| 12 | නාගම්පහ | අනුරාධපුර | 44 | 24 | 0 | 5 | 4.5 | 3 |
| 13 | පන්නල - පළමු අදියර | කුරුණෑගල | 34 | 61.29 | 17 | 365.5 | 579.39 | 285 |
| | පන්නල - 2 වන අදියර | | 9 | | 0* | 25 | 0* | 0* |
| 14 | ලුණුවිල | පුත්තලම | 18 | 4.9 | 12 | 83.9 | 175 | 203 |
| 15 | පුන්තෝඩම් | වවුනියාව | 64 | 30.57 | 18 | 53.5 | 153.5 | 165 |
| 16 | අච්චුවේලි - 1 වන අදියර | යාපනය | 23 | 192 | 7 | 417. | 275 | 235 |
| 17 | අච්චුවේලි - 2 වන අදියර | | 25 | 41.57 | 1 | 120 | 96 | 40 |
| | සමස්ත එකතුව | | **733** | **743.78** | **277** | **54127.61** | **52818.26** | **8595** |

මූලාශ්‍රය - ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

* ඉදි කෙරෙමින් පවතී

# 13

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

## 13.1 හැඳින්වීම

මෙරට ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශයට විශේෂ අවධානයක් යොමු කරමින්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසාය සංවර්ධනය සඳහා සහාය වීම, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම ප්‍රවර්ධනය කරයි. එමගින් ව්‍යවසායකයින්ට සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ට ව්‍යවසායකත්ව සංවර්ධනය, මූල්‍ය පහසුකම් සැපයීම, අලෙවිකරණ සම්බන්ධතා, පර්යේෂණ සහ සංවර්ධන සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සේවාවන් සපයනු ලබයි. තව ද, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකයින්ට ව්‍යවසායකත්වය, අලෙවිකරණය, ව්‍යාපාර සැලසුම්කරණය, ගිණුම්කරණය, වාර්තා තබා ගැනීම සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම යනාදි ධාරිතා සංවර්ධන පුහුණු අවස්ථා ලබාදෙයි.

### දැක්ම

ක්ෂුද්‍ර. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සංවර්ධනය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම යන කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමුඛ නියෝජිතායතනය වීම.

### මෙහෙවර

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ප්‍රවර්ධනය සහ තිරසර භාවය සහතික කිරීම උදෙසා අනෙකුත් පාර්ශ්වයන් සමඟ සම්බන්ධීකරණයෙන් සහ හවුල්කාරිත්වයෙන් යුක්තව එකී ව්‍යවසායයන් කාර්යක්ෂම හා ඵලදායී අන්දමින් සංවර්ධනය, ප්‍රවර්ධනය

## අරමුණු

- ශ්‍රී ලංකාව තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ උන්නතිය, ව්‍යාප්තිය සහ සංවර්ධනය උත්තේජනය කිරීම.
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනතේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා විදේශීය වෙළඳපොළ ජයගැනීමේ හැකියාව ඇති දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම උත්තේජනය කිරීම සහ දිරිගැන්වීම.
- ප්‍රතිපත්ති, සැලසුම්, උපස් කිරීම් දිරිගැන්වීම නිසි ලෙස සැලසුම් කිරීම සහ ඵලදායී ලෙස කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අළෙවිය සහ සංවර්ධනය සඳහා සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ව්‍යවසාය සංවර්ධනයේ අනිවාර්ය අංගයක් ලෙස තාක්ෂණික කුසලතාවයෙන් යුත් මානව ප්‍රාග්ධන සම්පතක් වශයෙන් පුද්ගලයින් සවිබල ගැන්වීම.
- සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සඳහා ප්‍රවේශයට ව්‍යවසායකයින් වෙත පහසුකම් සැළසීම.
- නිශ්පාදන සංවර්ධනය, තාක්ෂණික ප්‍රවර්ධනය සහ වාණිජමය බලපත්‍ර සම්බන්ධයෙන් වන පර්යේෂණ ප්‍රවර්ධනය හා සංවර්ධනය උදෙසා තාක්ෂණික සංවර්ධන අරමුදලක් ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට පහසුකම් සැළසීම.

## ප්‍රධාන වැඩසටහන් -2022

1. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ද්වාරය
2. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ දත්ත පද්ධතිය
3. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය පිරිනැමීම සහ ප්‍රවර්ධනය
4. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ප්‍රදර්ශන
5. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" ලාංඡනය යටතේ බලයලත් වෙළඳසැල් ප්‍රවර්ධනය කිරීම
6. ව්‍යවසායකත්ව සම්මාන උළෙල
7. "උපාධිධාරි ව්‍යවසායක උද්‍යානය" වැඩසටහන
8. ව්‍යාපාර පර්ෂද / ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන
9. සම්බන්ධිත ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන
10. ව්‍යවසායකත්ව සංසදය

## 13.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

### 1. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ද්වාරය

මෙම වැඩසටහන තුළින් ශ්‍රී ලාංකේය නිශ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා උදාකර දීම උදෙසා කාර්යක්ෂම හා ඵලදායී වෙළඳ ද්වාරයක් ස්ථාපිත කිරීමට හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මෙකී වෙළඳ ද්වාරය තුළ ලියාපදිංචි කිරීම මගින් වෙළඳ පොළ අවස්ථා ඉහල නැංවීමට අපේක්ෂා කෙරේ. මෙහි ප්‍රධාන අරමුණ වනුයේ ව්‍යාපාර හා ව්‍යාපාර අතර (B2B), ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ (MSMs) ව්‍යාපාර හා මහා පරිමාණ ව්‍යාපාර මෙන්ම ඔවුන්ගේ හවුල්කරුවන් හා පාරිභෝගිකයින් අතර (B2C) ගණුදෙනු ඉහල කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටුකර ගැනීම සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මගපෙන්වීම යටතේ ඩිජිටල් වේදිකාවක් තනා දීමයි. මෙම වෙළඳ ද්වාරය 2021 දෙසැම්බර් මස ආරම්භ කරන ලද අතර, 2022 සැප්තැම්බර් මස 30 දක්වා විකුණුම්කරුවන් 743ක් ලියාපදිංචි කර ඇත.

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශක KPI | අපේක්ෂිත වාර්ෂික නිමැවුම - 2022 | සපුරාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ද්වාරය | වෙළඳ ද්වාරයෙහි ලියාපදිංචි සැපයුම් කරුවන් සංඛ්‍යාව | අවම වශයෙන් සැපයුම් කරුවන් 1000ක් වෙළඳ ද්වාරයෙහි ලියා පදිංචි කිරීම | සැපයුම්කරුවන් 743 ක් ලියාපදිංචි කර ඇත.<br>වෙළඳ ප්‍රචාරණය සිදු කෙරෙමින් පවතී. (සමාජ මාධ්‍ය, පුවත්පත්, අත්පත්‍රිකා NEDA සංවර්ධන නිලධාරීන් යනාදී). |

### 2. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය දත්ත පද්ධතිය

සියලු දත්ත ඇතුලත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ දත්ත ගබඩාවක් නොමැති වීම කර්මාන්ත අංශයේ උපායමාර්ගික තීරණ සකස් කිරීමේදී සැලකිය යුතු අන්දමේ බලපෑමක් සිදුකරන කරුණකි. මෙමගින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන්ට ව්‍යවසායකයින් පිළිබඳ දත්ත මෘදු පිටපත් කිරීමට හා තොරතුරු වරින් වර යාවත්කාලීන කිරීමට ඉඩ සලසයි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කරන ලද අතර, ඊට ව්‍යවසායකයින් 260,000 ක් පිළිබඳ දත්ත ඇතුලත් කර ඇත.

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශක KPI | අපේක්ෂිත වාර්ෂික නිමැවුම - 2022 | සපුරාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් පිළිබඳ දත්ත පද්ධතිය (DB) | දත්ත පද්ධතිය මගින් ලියාපදිංචි කර ඇති ව්‍යවසායකයින් සංඛ්‍යාව | අවම වශයෙන් ව්‍යවසායකයින් 500,000 ක් දත්ත පද්ධතියෙහි ලියාපදිංචි කිරීම | 260,000 ක්ෂුද්‍ර, සුළු හා ම.ප. ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම |

## 3. “මේඩ් ඉන් ශ්‍රී ලංකා” ලාංඡනය පිරිනැමීම සහ ප්‍රවර්ධනය

දේශීය සම්පත් යොදා ගනිමින් දේශීයව සිදුකරන ව්‍යාපාර කෙතරම් තිබුණද ආනයනික නිෂ්පාදන හා සසඳන විට දේශීය නිෂ්පාදන සඳහා නිසි පිළිගැනීමක් නොතිබුණු බැවින් ආනයනය කරන ලද නිෂ්පාදන සඳහා පාරිභෝගිකයින් ප්‍රමුඛත්වය ලබා දී තිබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය නිශ්පාදනයන්ට වඩා ආනයනික නිශ්පාදන ගුණාත්මකභාවයෙන් ඉහල බවට පිලිගැනීමක් පාරිභෝගිකයින් තුළ ඇති වූ අතර, දේශීය

නිශ්පාදන සඳහා ඇති ඉල්ලුම පහත වැටිණි. එබැවින්, දේශීය නිශ්පාදනයන්හි ගුණාත්මකභාවය නිරූපණය කිරීම උදෙසා ලාංඡනයක් ප්‍රවර්ධනය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් පියවර ගන්නා ලදී. වාර්ෂිකව අවම වශයෙන් ව්‍යවසායකයින් 50 දෙනෙකු සඳහා ලාංඡනය පිරිනැමීම මෙහි ඉලක්කය වන අතර, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2022 වර්ෂය සඳහා ව්‍යවසායකයින් 50 දෙනෙකුට ලාංඡනය පිරිනැමීමට සැලසුම් කර ඇත.

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශක KPI | අපේක්ෂිත වාර්ෂික නිමැවුම - 2022 | සපුරාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය පිරිනැමීම හා ප්‍රවර්ධනය | ලාංඡනය ලබා ගත් ව්‍යවසායකයින් සංඛ්‍යාව | අවම වශයෙන් ව්‍යවසායකයින් 50 දෙනෙකු සඳහා ලාංඡනය පිරිනැමීම | ලාංඡනය ලබාගත් සහ ලාංඡනය සඳහා ඉල්ලුම් කර ඇති ව්‍යවසායකයින් පිළිබඳව දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඇත. අයදුම්පත් 44ක් ලැබී ඇත. ලාංඡනය පිරිනැමීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ අත්පොත සකස් කර ඇත. දෙසැ මාස ලාංඡනය පිරිනැමීමට සැළසුම් කර ඇත. |

## 4. “මේඩ් ඉන් ශ්‍රී ලංකා” වෙළඳ ප්‍රදර්ශන

ක්ෂුද්‍ර, සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ඉහල අගය එකතු කිරීමකින් යුත් අව්‍යාජ ශ්‍රී ලාංකේය නිශ්පාදන ප්‍රවර්ධනය කිරීමේ හා සංවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් **“මේඩ් ඉන් ශ්‍රී ලංකා”** ලාංඡනය එළිදක්වන ලදී. ඊට සමගාමීව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ශ්‍රී ලාංකීය නිශ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට හඳුන්වාදීම සඳහා මේඩ් ඉන් ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම

සැළසුම් කර ඇත. 2022 වර්ෂය තුළ වෙළඳ ප්‍රදර්ශන 03ක් පැවැත්වීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් සැළසුම් කළද රටේ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් එය ප්‍රමාද කිරීමට සිදුවිය. ඊට අමතරව ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් ප්‍රාදේශීය මට්ටමින් සුළු පරිමාණ ව්‍යවසායක වෙළඳ ප්‍රදර්ශන 65 ක් පවත්වා ඇති අතර ක්ෂුද්‍ර පරිමාණ ව්‍යවසායකයින් සඳහා වෙළඳ කුටි ලබා දී ඇත.

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශක **KPI** | අපේක්ෂිත වාර්ෂික නිමැවුම **- 2022** | සපුරාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| “ මේඩ් ඉන් ශ්‍රී ලංකා” වෙළඳ ප්‍රදර්ශනය | පවත්වන ලද වෙළඳ ප්‍රදර්ශන සංඛ්‍යාව සපයන ලද වෙළඳ කුටි සංඛ්‍යාව | “මේඩ් ඉන් ශ්‍රී ලංකා” තේමාව යටතේ අවම වශයෙන් දීප ව්‍යාප්ත වෙළඳ ප්‍රදර්ශන 03ක් පැවැත්වීම (වෙළඳ කුටි180) | වෙළඳ ප්‍රදර්ශන 3ක් පැවැත්වීමට සැළසුම් කළද මූල්‍ය ප්‍රතිපාදන හිඟතාවය මත කල් දැමීමට සිදුවිය. ප්‍රාදේශීය සුළු පරිමාණ වෙළඳ ප්‍රදර්ශන 65ක් ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් විසින් පවත්වන ලදී. |

## 5. “මේඩ් ඉන් ශ්‍රී ලංකා” ලාංඡනය යටතේ බලයලත් වෙළඳසැල් ප්‍රවර්ධනය කිරීම

“මේඩ් ඉන් ශ්‍රී ලංකා” බලයලත් වෙළඳසැල් ප්‍රමුඛ පෙළේ පාරිභෝගිකයන් ආකර්ෂණය කර ගන්නා ස්ථානවල ස්ථාපිත කරනු ලබන අතර, එම වෙළෙඳ කුටි පෞද්ගලික අංශය මගින් පවත්වාගෙන යනු ඇත. මෙම යාන්ත්‍රණය ක්ෂුද්‍ර. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට රට පුරා අලෙවිකරණ සම්බන්ධතා වැඩිදියුණු කරගැනීමට ඉවහල් වනු ඇත. තව ද, “මේඩ් ඉන් ශ්‍රී ලංකා” ලාංඡනය සහිත සැපයුම්කරුවන්ට තම නිෂ්පාදන බලයලත් වෙළඳසැල් තුළ ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සැලසෙන අතර එමඟින් ආදායම් උත්පාදනය වැඩි දියුණු කිරීමට අවස්ථාව සැලසේ. තවද, 2022 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් මාතලේ දිස්ත්‍රික්කයේ බලයලත් අළෙවි සැලක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශක **KPI** | අපේක්ෂිත වාර්ෂික නිමැවුම **- 2022** | සපුරාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| බලයලත් අළෙවි සැල් ප්‍රවර්ධනය | ස්ථාපිත කර ඇති බලයලත් අළෙවි සැල් සංඛ්‍යාව ලියාපදිංචි කර ඇති සැපයුම් කරුවන් සංඛ්‍යාව | අවම වශයෙන් එක් බලයලත් අළෙවි සැලක් ස්ථාපිත කිරීම | මාතලේ දිස්ත්‍රික්කයේ නාවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බලයලත් අලෙවි සැලක් ස්ථාපිත කිරීමේ හැකියාව ඇති බවට හඳුනාගන්නා ලදී. |

## 6. "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන ("ව්‍යාපාරයට බුද්ධිය")

උපාධිධාරීන් ව්‍යාපාර ක්ෂේත්‍රයට සම්බන්ධ කරගැනීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විශ්ව විද්‍යාල හා එක්ව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලද අතර එය "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වශයෙන් නම් කරන ලදී. උපාධිධාරීන් ව්‍යාපාර ලෝකයට අවතීර්ණ වීම දිරිගැන්වීම හා ඔවුන් සාර්ථක ව්‍යාපාරිකයින් වශයෙන් ඉදිරියට ගෙන ඒම මෙම වැඩසටහනේ අරමුණයි. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය 2021 වර්ෂය වනවිට උපාධිධාරී ව්‍යවසායකයින් 200ක් ව්‍යාපාරික ලෝකයට හඳුන්වා දී ඇත. 2022 වර්ෂයේදී කොළඹ, කැලණිය, ශ්‍රීජයවර්ධනපුර, ගිණිකොණදිග හා රජරට යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 79 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇති අතර, ප්‍රතිපාදන නිකුත් කිරීම සඳහා ව්‍යාපාර සැළසුම් 18ක් ලැබී ඇත.

| වැඩසටහන | ප්‍රධාන කාර්ය දර්ශක KPI | අපේක්ෂිත වාර්ෂික නිමැවුම - 2022 | සපුරාගත් ප්‍රමාණය |
|---|---|---|---|
| "උපාධිධාරී ව්‍යවසායකත්ව උද්‍යානය" වැඩසටහන | පුහුණු කර ඇති උපාධිධාරීන් සංඛ්‍යාව<br><br>මූල්‍ය සහාය ලබාදී ඇති උපාධිධාරීන් සංඛ්‍යාව<br><br>ආරම්භ කර ඇති ව්‍යාපාර සංඛ්‍යාව. | උපාධිධාරීන් 100 දෙනෙකු පුහුණු කර ඇති අතර,තෝරාගත් උපාධිධාරීන් 20 දෙනෙකු සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී. | කොළඹ, කැලණිය, ගිණිකොණ දිග හා රජරට යන විශ්ව විද්‍යාලවල විද්‍යාර්ථයින් 79 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබාදී ඇත.<br><br>ප්‍රතිපාදන නිකුත් කිරීම සඳහා ව්‍යාපාර සැළසුම් 18ක් ලැබී ඇත. |

## 7. ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශිෂ්ට දායකත්වයක් සපයා ඇති ව්‍යවසායකයින්ට පිලිගැනීමක් ලබාදීම, ඇගයීම හා දිරිමත් කිරීමේ අරමුණෙන් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පළාත් ව්‍යවසායකත්ව සම්මාන ප්‍රදානෝත්සව පවත්වනු ලැබේ. 2022 වර්ෂය තුළ සම්මාන ප්‍රදානෝත්සව පහක් පැවැත්වීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සැළසුම් කරන ලද නමුත්, පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් එම සම්මාන උළෙල ලබන වසරේදී පැවැත්වීම සඳහා කල් දමන ලදී.

## 8. ව්‍යාපාර පර්ෂද/ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් (MSMEs) ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයේ හා විවිධාංගීකරණයේ පෙර ගමන්කරුවන් වශයෙන් සැලකිය හැක. කෙසේ වුව ද, ශ්‍රී ලංකාවේ. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හුදෙකලා තත්වයකට පත්ව ඇති අතර අගය දාමය තුළ ස්වාධීනව කටයුතු කිරීමට ඔවුන්ට සිදුව ඇත. තරඟකාරීත්ව පීඩනයට අඛණ්ඩව මුහුන දීම සඳහා සිය ධාරිතාව වර්ධනය කරගැනීම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට දුෂ්කර කාර්යයකි.

## 9. සම්බන්ධිත ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

ප්‍රාදේශීය ව්‍යසායකයින්ට ව්‍යවසායකත්වය, අළෙවිකරණය, තාක්ෂණය හා මූල්‍ය කළමනාකරණය යනාදිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිවීමේ ව්‍යාපාරික ගැටලු පවතින බව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරන අතර, ඔවුන් එවැනි ගැටලුවට මුහුන පාන ව්‍යවසායකයින් හඳුනාගනිමින් ඔවුන්ගේ ගැටලුවලට අදාළ විසඳුම් සෙවීමට කටයුතු කරනු ලබයි. 2022 වර්ෂය තුළ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකයින් 14937 දෙනෙකු පුහුණු කර ඇති අතර, අවශ්‍යතා අනුව අනෙකුත් සහයෝගයන් ලබා දී ඇත.

## 10. ව්‍යවසායකත්ව සංසදය

ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංසද තුළ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය සේවා සපයන ආයතනයන්හි නියෝජිතයින් එක්ව කටයුතු කරන අතර, ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රධාන ව්‍යවසායකයින් සහ සියලු ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවර්ධන සේවා සපයනු ලබන්නන් ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංසදය නියෝජනය කරයි. එළෙසම දිස්ත්‍රික් මට්ටමේ නියෝජිතයින් දිස්ත්‍රික් සංසදය නියෝජනය කරනු ලබයි. තව ද, ජාතික මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් උපාය මාර්ගිකව ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම උදෙසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව උපදේශන සභාව ස්ථාපිත කිරීමට කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම, අදාල අමාත්‍යාංශ නියෝජනයන් සහ රාජ්‍ය ආයතන නියෝජිතයන් ඇතුළු පෞද්ගලික අංශය නියෝජනය කරන්නාවූ කිහිපදෙනෙකු ද ඇතුලත්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පහසුකරණ සංසදයක් ස්ථාපිත කිරීමට යෝජනා ඉදිරිපත් කොට ඇත.

### මූල්‍ය ප්‍රගතිය

- මුළු ප්‍රතිපාදන මුදල - රු.මි. 40.00
- සැප්තැම්බර් දක්වා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල - රු.මි. 8.60
- සැප්තැම්බර් 30 දිනට බැඳීම රු.මි. 5.33

## 13.3 අනාගත සැලසුම් - 2023

1. ප්‍රාදේශීය මට්ටමේ කුඩා ව්‍යාපාර පර්ෂද සංගම් ස්ථාපිත කිරීම.

2. රජයේ විශ්ව විද්‍යාල, ව්‍යවසාය සංවර්ධන මණ්ඩලය (IDB), තොරතුරු තාක්ෂණ ආයතනය (ITI), විද්‍යා සහ ජාතික අධ්‍යාපන (NIE) ආයතනය වැනි ආයතන සහ ජාතික හා අන්තර්ජාතික නියෝජිත ආයතන හා දායකත්ව ආයතනයන්හි සහයෝගය සහිතව අගය එකතු කළ නිශ්පාදන ප්‍රවර්ධනය කිරීම.

3. ශ්‍රී ලාංකීය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ නිශ්පාදන එලිදැක්වීම සඳහා නිශ්පාදන ප්‍රදර්ශනාගාර ස්ථාපිත කිරීම.

4. කොස් ආශ්‍රිත අගය එකතු කළ නිශ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ අවම වශයෙන් "Jack Marts" නමින් අළෙවි මධ්‍යස්ථාන 3ක් කොළඹ ආශ්‍රිතව සහ ප්‍රාදේශීයව ස්ථාපිත කිරීම.

**කොස් ආශ්‍රිත අගය එකතු කළ නිශ්පාදන ප්‍රවර්ධනය**



5. "මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ද්වාරය ඵලදායී හා කාර්යක්ෂම අන්දමින් පවත්වාගෙන යාම.

**මේඩ් ඉන් ශ්‍රී ලංකා" වෙළඳ ප්‍රදර්ශනය**




6. ජාතික ව්‍යවසාය සංවර්ධන මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් සම්පාදිත ධාරිතා වර්ධන/උපදේශන ක්‍රියාකාරී සැළැස්ම ක්‍රියාවට නැංවීම.

7. ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන තුළින් නව ව්‍යවසායන් ආරම්භ කිරීම හා ප්‍රවර්ධනය කිරීම. (එක් ප්‍රා/ලේ කොට්ඨාසයකට නව ව්‍යාපාර 5-20).

8. උපාධිධාරී ව්‍යවසායකත්වයන් ගොඩනැගීම හා ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය විශ්ව විද්‍යාල සහ රාජ්‍ය ආයතන සමග සබඳතා ජාලයක්.

9. ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් පිළිබඳ දත්ත පදනම ස්ථාපිත කිරීම.

# 14

# සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

# (PCCL)

## 14.1 හැඳින්වීම

සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන 100%ක් රජය සතු ලාභ උපයන රාජ්‍ය සමාගමකි. සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වේ.

### දැක්ම

ශ්‍රී ලංකාවේ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනයේ හා වෙළෙඳාමේ ප්‍රමුඛයා බවට පත්වීම.

### මෙහෙවර

පාරිභෝගික තෘප්තිය සහතික කිරීම සඳහා ගුණාත්මක, විශ්වාසදායක සහ තත්වයෙන් උසස් රසායනික ද්‍රව්‍ය වෙළඳපොළට නිෂ්පාදනය කිරීම සහ වෙළඳාම් කිරීම.

### සමාගමේ ක්‍රියාකාරකම්

සී/ස පරන්තන් රසායන සමාගමෙහි ප්‍රධාන නිෂ්පාදන කම්හල 1956 සිට 1985 දක්වා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන් හි පිහිටා තිබූ අතර එම කාලසීමාව තුල එහි නිෂ්පාදන ව්‍යාපාර කටයුතු

සාර්ථකව ක්‍රියාත්මක විය. 1985 වර්ෂයේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් මෙම කර්මාන්තශාලාව සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර, මේ වන විට එම කර්මාන්තශාලාව නැවත පරන්තන්හිදී ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක සමාගම නිරතව සිටී. සමාගම විසින් කෝස්ටික් සෝඩා /ක්ලෝරීන් කර්මාන්තශාලාව නැවත ඉදි කිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර සී/ස පරන්තන් රසායන සමාගම විසින් දේශීය වෙළෙඳපොළෙහි ඉල්ලුමට සරිලන පරිදි නිෂ්පාදනයක් ලෙස පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් (Poly Aluminum Chloride (PAC)) සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (Hydrochloric Acid (HCl) නිෂ්පාදන පහසුකම් එම ස්ථානයේ ස්ථාපනය කිරීමට ඉදිරි කටයුතු සැලසුම් කර ඇත.

සී/ස පරන්තන් රසායන සමාගම සේවා වර්ධන වේගයක් සහිතව ක්‍රියාත්මක වන, සාර්ථකව ව්‍යාපාර කටයුතුවලින් ඉදිරියට ගමන් කරන ලාභ ඉලක්ක

කරගත් රාජ්‍ය ආයතනයකි. සමාගම 2022 සැප්තැම්බර් 30 වැනි දිනට මිලියන 200 ක ශුද්ධ ලාභයක් (බදු පෙර ලාභය) වාර්තා කර ඇත. එය 2021 වසරට සාපේක්ෂව 285% ක ලාභයේ වර්ධන වේගයකි.

සමාගම රසායන ද්‍රව්‍ය නිෂ්පාදන අභිලාශය සමඟ ක්‍රියාත්මක වන අතර විභව රසායනික නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය කිරීමට උපාය මාර්ගිකව අවධානය යොමු කර ඇත. සමාගම විසින් හොරණ වගවත්ත ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සහ කළුතර පුලර්ටන් කාර්මික කලාපයේ ස්ථාපිත කර ඇති ව්‍යාපාර ඒකකයන්හිදී කෝස්ටික් දියර හා බ්ලිච්න් දියර නිෂ්පාදනය කිරීමේ කටයුතු සිදු කරයි. සී/ස පරන්තන් රසායන සමාගම දේශීය රසායනික නිෂ්පාදන කර්මාන්ත සඳහා සහායට සහ දියුණුවට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ රසායන ඉංජිනේරු පීඨය සමඟ එක්ව කටයුතු කරනු ලබයි.

සී/ස පරන්තන් රසායන සමාගම, පරන්තන් කර්මාන්ත කලාපයේ රසායනික කර්මාන්ත 30ක් පිහිටුවීමට හැකිවන පරිදි පරිසර හිතකාමී රසායනික කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීමට කටයුතු කරමින් පවතී.

මෙරටින් පිටතට ගලායන විදේශ විනිමය ප්‍රමාණය අවම කර ගැනීම සඳහා සමාගම විසින් මූලික වශයෙන් ආරම්භ කරන ලද ක්ලෝරීන් සිලින්ඩර නඩත්තුව සහ පීඩන පරීක්ෂාව වගවත්ත ඒකකය තුල සිදු කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත. තවද රසායනික අනතුරු වැළැක්වීම සඳහා ආරක්ෂිත උපකරණ මෙවලම් කට්ටලය නිෂ්පාදනය කිරීම ද සමාගම විසින් සිදු කරනු ලබන අතර, රසායනික ආපදා කළමනාකරණය උදෙසා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සමාගම මගින් පවත්වනු ලබයි.

**කර්මාන්තශාලාවේ ක්‍රියාකාරීත්වය**






**රසායනික අනතුරු වැලැක්වීම සඳහා ආරක්ෂිත උපකරණ හා මෙවලම් නිෂ්පාදනය**









- සමාගමේ ලාභය උපරිම කිරීම, අවශ්‍ය කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සහ සමාගමේ සියලුම ක්‍රියාවලීන් විධිමත් කිරීමට සමාගම විසින් ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කර ඇත. ඊට සමගාමීව, සමාජ,ආර්ථික සහ පාරිසරික සාධක මත පදනම්ව (TBL) මානව සම්පත් ධාරිතාව වැඩි දියුණු කිරීමට සමාගම බොහෝ පියවර ගෙන ඇත.

- සී/ස පරන්තන් රසායනික සමාගම සියළුම ආකාරයේ මෙහෙයුම් කටයුතුවල විනිවිදභාවයකින් හා විශ්වසනීයත්වයකින් යුතුව කටයුතු කරන අතර ඒ සඳහා ඊ-ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිවල නිරත වී ඇත. අපගේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා හරිත නාලිකාව භාවිතා කිරීමට හැකි වන පරිදි ශ්‍රී ලංකා රේගුව විසින් ප්‍රදානය කරනු ලබන **"අනුකූල ආර්ථික ක්‍රියාකරු (CEO)"** තත්ව සහතිකය අප සමාගම වෙත ප්‍රදානය කර ඇත. සී/ස පරන්තන් රසායනික සමාගම විසින් වර්ෂ 2021 දක්වා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.

- පෞද්ගලික අංශය සමඟ තරඟකාරී වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා "කාර්ය සාධන දර්ශක " මත පදනම් වූ ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු ආරම්භ කර ඇත. එය 2023 ජනවාරි සිට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබයි.

- පහළ ස්ථරයේදී රුපියල් මිලියන 200ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කරමින් සහ තරඟකාරී වෙළඳ ආයතනයක් ලෙස වෙළඳපල තුලට නව නිෂ්පාදන රැසක් එක් කර අඛන්ඩ වර්ධනයක් තුලින් 2024 වර්ෂයේදී නිෂ්පාදන අංශයට පරිවර්තනය වීමේ මූලික අභිලාශයෙන් යුතුව සමාගම කටයුතු කරනු ලබයි.

## 14.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් 30 දිනට)

මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2022 රු.'000 | 2021 රු.'000 | % |
|---|---|---|---|
| **ආදායම** | **496,494** | **250,517** | **198** |
| විකුණුම් පිරිවැය | (248,247) | (135,279) | 183 |
| **දළ ලාභය** | 248,247 | 115,238 | 215 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 59,000 | 22,500 | 262 |
| **මුළු ආදායම** | **307,247** | **137,738** | **-** |
| **මුළු වියදම** | **(106,750)** | **(68,715)** | **156** |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ලාභය** | **200,497** | **69,023** | 290 |
| අඩුකළා : මූල්‍ය පිරිවැය | (100) | (33) | (67) |
| **බදු පෙර ලාභය (ආසන්න වශයෙන්)** | 200,397 | 68,990 | 290 |
| දළ ලාභ අනුපාතය (%) | 50 | 46 | - |
| ලාභ අනුපාතය (%) | 40.36 | 27.54 | - |

මූලාශ්‍රය **-** සී/ස පරන්තන් කෙමිකල්ස් සමාගම

## අනෙකුත් අංශ වල කාර්යසාධනය

| විෂය | ප්‍රගතිය |
|---|---|
| **ක්ලෝරීන් කෝස්ටික් සෝඩා නිෂ්පාදන කර්මාන්තශාලාව ස්ථාපිත කිරීම.** | ශක්‍යතා අධ්‍යයන ය සිදු කර අවසන් කර ඇත.<br><br>ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත.<br><br>ව්‍යාපෘතියට අවශ්‍ය අරමුදල් සපයා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. මි. 417 ක මුදලක් 2023 අයවැය වැඩසටහන යටතේ වෙන් කර දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |
| **පරිසර හිතකාමී කාර්මික කලාපයක් ඇති කිරීම.** | කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන්හි පැරණි රසායනික කම්හල පිහිටි ඉඩම දිර්ඝකාලින බදු පදනම යටතේ පරන්තන් කෙමිකල් සමාගම වෙත පවරා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. දිර්ඝකාලින බදු ගිවිසුම සකස් කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජෙනරාල් වෙත දැනුම් දී ඇත.<br><br>බිම් කොටස් සඳහා සැලසුම අවසන් කිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) සමඟ එක්ව කටයුතු කරනු ලබයි.<br><br>කර්මාන්ත කලාපය තුල ආරම්භ කිරීමට විභවතාවය පවතින් රසායනික කර්මාන්ත හඳුනා ගැනීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ රසායන ඉංජිනේරු දෙපාර්තමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

| | |
|---|---|
| **ක්ලෝරීන් නොවන කාර්මික රසායනික වෙළඳපොළ සම්බන්ධ කටයුතු** | කැළණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව වෙළඳපල සමීක්ෂණයක් සිදු කිරීම.<br><br>කෝස්ටික් සෝඩා සඳහා මෙට්‍රික් ටොන් 1000ක වාර්ෂික ඉලක්කයක් ලබා දී ඇති අතර මෙ.ටොන් 300ක් දැනටමත් ආනයනය කර ඇත. මෙට්‍රික් ටොන් 50ක් සඳහා ආනයන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. මෙට්‍රික් ටොන් 50ක් සඳහා ආනයන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. |

## 14.3 අනාගත සැලැසුම් - 2023

1. පරන්තන් හි කෝස්ටික් සෝඩා/ ක්ලෝරීන් නිෂ්පාදන කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරීම.

2. පරන්තන් හි රසායනික නිෂ්පාදන කර්මාන්ත සහිත පරිසර හිතකාමී කර්මාන්ත කලාපයක් ඇතිකිරීම.

- කර්මාන්ත කලාපය තුල ස්ථාපිත කිරීමට හැකියාව ඇති විභව රසායනික කර්මාන්ත සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.
- පූර්ව ශක්‍යතා අධ්‍යනය අනුව විභව රසායනික කර්මාන්ත සඳහා අභිලාශය පල කිරීමේ යෝජනා කැඳවීම මඟින් සුදුසු ආයෝජකයින් හඳුනා ගැනීම.

3. දියර ක්ලෝරීන් ගබඩා කරන සිලින්ඩර සිලින්ඩර සඳහා සිලින්ඩර නඩත්තු සහ පීඩන පරීක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම.

4. භාවිතයට නොගත් සම්පත් භාවිතය සඳහා කටයුතු කිරීම.

5. කාබන් විමෝචනය අවම කිරීම.

- වගවත්ත ඒකකයේ වහලය මත සූර්ය පැනල ස්ථාපිත කිරීම . (වර්ග අඩි 4500)
- කළුතර ඒකකයේ වහලය මත සූර්ය පැනල ස්ථාපිත කිරීම. (වර්ග අඩි 3000)

6. ක්ලෝරීන් නොවන නිෂ්පාදන සංවර්ධන ඒකකයක් පිහිටුවීම.

7.ආයතනය C ශ්‍රේණියේ සිට B ශ්‍රේණිය දක්වා පරිවර්තනය කිරීම.

8.කාර්ය සාධන දර්ශක මත පදනම් වූ ඇගයීම් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

- පුහුණුව ආරම්භ කර ඇත.
- ආකෘතිය සංවර්ධනය කරමින් පවතී.

9. 2022 වසර අවසානය වනවිට මෙහෙයුම් ශුද්ධ ලාභය රුපියල් මිලියන 300 ඉක්මවීම.

# 15

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)

## 15.1 හැඳින්වීම

### කහටගහ මිනිරන් පතල

කහටගහ මිනිරන් පතල වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොඩම්ගස්ලන්ද ප්‍රදේශයේ මදුරාගොඩ පිහිටා ඇති අතර එය කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් මඟින් කළමනාකරණය කරනු ලැබේ. එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිහිටුවන ලද පොදු සීමිත සමාගමක් වන අතර එහි හිමිකාරිත්වය සම්පූර්ණයෙන්ම රජය සතුවේ.

කහටගහ පතල සතු භූමි ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 102 කි.

### කහටගහ අනන්‍ය වූ නිෂ්පාදන

ඉහල කාබන් ප්‍රතිශතයක් සහිත ස්ඵටිකරූපී ඉල්ලම් මිනිරන් වාණිජ මට්ටමෙන් සපයන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව වන අතර විශේෂයෙන්ම කහටගහ පතල සම්පූර්ණ ස්ඵටික වශයෙන් පවතින 99%කට වඩා වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත ඉතා පිරිසිදු ස්වභාවික ඉල්ලම් මිනිරන් සැපයීමට සමත්ය. එම මිනිරන් කුරු, කැට, පොකුරු සහ පතුරු ආදී වශයෙන් කැණීම් කරනු ලැබේ. ඉහල කාබන් ප්‍රතිශයක් සහ අඩු භෂ්ම ප්‍රතිශතයක් ඇති ඉල්ලම් මිනිරන් සඳහා ලෝක වෙළඳපොලේ සුවිශේෂී පිළිගැනීමක් පවතී.

### මිනිරන් අපනයනය

කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම යනු අපනයන ඉලක්ක කරගත් සමාගමක් වන අතර වර්ෂ 2021/22 දී එහි ප්‍රධාන අපනයන රටවල් වූයේ ජපානය සහ ඕස්ට්‍රේලියාවයි.

### දැක්ම

"ඉහළ කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වීම."

### මෙහෙවර

“ස්වභාවික මිනිරන් ඛණිජ සම්පත උපරිම ප්‍රයෝජනයට ගෙන, රටට විදේශ විනිමය උපයමින් හා සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ක්‍රියාකාරී කොටස්කරුවෙකු වීම.”

### අරමුණු

“මිනිරන් කැණීම, ශුද්ධ කිරීම, නිර්යාත කිරීම, මිනිරන් කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන ඇතුළු මිනිරන් කර්මාන්තය වැඩි දියුණු කිරීම හා එහි උපරිම අගය වැඩි කිරීම.”

## 15.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස 30 දිනට)

**නිෂ්පාදනය**




**2022/23තොරතුරු 2022 සැප්තැම්බර් 30 දක්වා පමණි*

*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

2022 සැප්තැම්බර් 30 දක්වා මිනිරන් නිෂ්පාදනය (කැණීම් කල ප්‍රමාණය) මෙට්‍රික් ටොන් 176 ක් විය. වර්ෂ 2006 පතල ප්‍රතිසංස්කරණ කටයුතු කිරීමෙන් පසුව මේ දක්වා නිෂ්පාදනය කරනු ලැබූ මුලු මිනිරන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 11,002 කි.

මෙම මූල්‍ය වර්ෂය සඳහා සාමාන්‍යය නිෂ්පාදන ඉලක්කය මසකට මෙට්‍රික් ටොන් 65 – 77.5කි. මෙම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම රඳා පවතිනුයේ එම අවස්ථාව වන විට විවෘතව පවතින ඉල්ලම් වල සරුබව, ඒවා පිහිටා ඇති මට්ටම (ගැඹුර), මිහිතුල කම්කරුවන්ගේ සංඛ්‍යාව සහ පතලේ අනෙකුත් සංවර්ධන කටයුතු යන කරුණු මතය. කෙසේ වෙතත් කොවිඩ්-19 වසංගත රෝගය ආශ්‍රිත ගැටලු හේතුවෙන් විටින් විට පතල වසා දැමීමට සිදු වූ බැවින් අපේක්ෂිත මිනිරන් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.

### අලෙවිය

2021 අප්‍රේල් 1 දින සිට සැප්තැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය තුලදී කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් විසින් මිනිරන් මෙට්‍රික් ටොන් 200 ක් අපනයනය කරන ලදී. පෙර වර්ෂයේ එම කාල පරිච්ඡේදය තුල අපනයන සමඟ සසඳා බලන විට එහි විශාල වෙනසක් නොමැත. එයට අනුරූපීව විකුණුම් ආදායමද පෙර වසරේ (2021/22) එකී කාල පරිච්ඡේදය තුල පැවති රුපියල් මිලියන 59.24 සිට මෙම වසරේදී රුපියල් මිලියන 97.26 දක්වා එනම් රුපියල් මිලියන 38.02 කින් වැඩීවී තිබේ. කෙසේ නමුත් ඕස්ට්‍රේලියාව ෆස්ට් ග්‍රැෆයිට් සමාගම සමඟ කරන ලද සාකච්ඡා සාර්ථක විම නිසා හා බෝගල ග්‍රැෆයිට් ලංකා පීඑල්සී වෙතින් නව දේශීය ඇණවුම් ලැබීම නිසා ඉහළ ශ්‍රේණියේ මිනිරන් අලෙවිය වැඩිවීමක් දක්නට ලැබේ. ඇමරිකා එක්සත් ජනපදයේ ඇස්බරි ග්‍රැෆයිට් මිල්ස් ලිමිටඩ් සමාගම විසින් ඇමරිකා එක්සත් ජනපදයේ COVID 19 ගැටලු හේතුවෙන් උසස් ශ්‍රේණියේ මිනිරන් සඳහා ඇණවුම් ද අත්හිටුවා ඇත.

ජාත්‍යන්තර මිනිරන් වෙළඳපොලෙහි ස්වභාවය වනුයේද අලෙවිය නිතර උච්චාවචනය වීමය. ලෝක වෙළඳපොලට ශ්‍රී ලංකාවෙන් වාර්ෂිකව සැපයෙන ඉල්ලම් මිනිරන් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 7,000 (කහටගහ සහ බෝගල) නොඉක්මවන බැවින් එය මෙට්‍රික් ටොන් 900,000 ක් ඉක්මවන ලෝක නිෂ්පාදනය සමඟ සසඳා බලන කල එතරම් විශාල ප්‍රමාණයක් නොවේ. එබැවින් ලෝක වෙළඳපොලේ හැසිරීම කෙරෙහි ශ්‍රී ලාංකික මිනිරන් නිෂ්පාදකයන්ගේ බලපෑම පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණය කල යුතුව පවතී.

2006 වසරේ කහටගහ පතලේ කටයුතු නැවත ආරම්භ කරනු ලැබූ දිනයේ සිට 2022 සැප්තැම්බර් මස අවසානය

දක්වා සමාගම විසින් මිනිරන් මෙට්‍රික් ටොන් 8,563ක් අපනයනය කර තිබේ.

**අලෙවිය 2008-2022**




**2022/23තොරතුරු 2022 සැප්තැම්බර් 30 දක්වා පමණි*

*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

**ආදායම**

2006 වර්ෂයේ පතල ප්‍රතිසංස්කරණ කටයුතු වල සිට මේ දක්වා කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම විසින් සමස්ත වශයෙන් රුපියල් මිලියන 1,703 ක විදේශ විනිමය උපයා තිබේ.

**ආදායම**




**2022/23තොරතුරු 2022 සැප්තැම්බර් 30 දක්වා පමණි*

*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

**ලාභය**




**2022/23 තොරතුරු 2022 සැප්තැම්බර් 30 දක්වා පමණි*

*මූලාශ්‍රය: කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්*

වර්තමාන මුදල් වර්ෂය (2022/23) තුල 2022 අප්‍රේල් 1 දින සිට සැප්තැම්බර් 30 දක්වා කාලයේදී වාර්තා කරන ලද බදු පෙර ශුද්ධ ලාභය රුපියල් මිලියන 40.9 ක් වූ අතර පෙර වර්ෂයේ අදාල කාලය තුල එය රුපියල් මිලියන 8.93 බදු ගෙවීමට පෙර ලාභයක් විය. කෙසේ වෙතත් ඉහත දත්ත පදනම් වූයේ විගණනය නොවූ ගිණුම් මතය.

2006 දී පතල නැවත විවෘත කිරීමෙන් පසුව කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් විසින් 2022 සැප්තැම්බර් 30 දක්වා කාලය තුල රුපියල් මිලියන 252.12 ක සමුච්චිත බදු පෙර ලාභයක් උපයා තිබේ.

පතල නැවත ආරම්භ කල දිනය පටන් එහි සියලු මෙහෙයුම් වියදම් කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ ඉපැයීම් මඟින් දරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයට බරක් නොවන පරිද්දෙන් වීම ඉතා සුවිශේෂී තත්වයකි.

වාර්තාගත මට්ටමේ ගංවතුර අර්බුද, සේවක වැඩ වර්ජන, කොවිඩ් - 19 රෝග ව්‍යාප්තිය ආදී මිනිරන් වෙළඳපොලෙහි නොසන්සුන්තාවයන් තිබියදීත්, එයට සාර්ථකව මුහුණ දෙමින් සමාගම තම කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යමින් 2021 සැප්තැම්බර් 30 දින අවසන් වන විට රුපියල් මිලියන 16.39 ක මුදල් සහ බැංකු ශේෂයන් පවත්වා ගැනීමටද සමත් වී තිබේ.

**තොගය**

මුදල් සහ බැංකු ශේෂයට අමතරව 2022 සැප්තැම්බර් 30 දිනට ඉතිරි මිනිරන් තොගයේ ආසන්න වෙළඳපල වටිනාකම රුපියල් මිලියන 355 ක් වේ.

**ශ්‍රම බලකාය**

පුහුණු පතල් කම්කරුවන් සහ වෙනත් අදාල තාක්‍ෂණික කාර්යය මණ්ඩලය ඇතුළුව මුළු ශ්‍රම බලකාය 125 ක් වේ.

## 15.3. අනාගත සැලැසුම් - 2023

- නිෂ්පාදන ඉලක්කය - මෙට්‍රික් ටොන් 930 (මසකට මෙට්‍රික් ටොන් 77.5 සාමාන්‍ය බැගින්)
- ඉලක්කගත විකුණුම් ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 844
- ඉලක්කගත විකුණුම් ආදායම - රුපියල් මිලියන 311
- ඉලක්කගත ලාභය - රුපියල් මිලියන 14.7

**වර්තමාන සහ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම්**

**පතල් කැණීම සහ මිහිතුල සංවර්ධනය**

- **ගවේෂණය**

පතල් කර්මාන්තය තුල ඉල්ලම් සම්පත් තිබීම සහ ආර්ථික වශයෙන් ඵලදායී ලෙස ඒවා ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ගවේෂණය අත්‍යවශ්‍ය අංගයක් වන අතර, ඒ අනුව නව ඉල්ලම් සොයා ගැනීම සඳහා දියමන්ති (Diamond) විදුම් වැඩ සටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරනු අතර අඩි 1,132 මට්ටමින් නව ගවේෂණ ව්‍යාපෘතියක් සිදු කෙරෙමින් පවතී . එම තලය තුලම සිරස් ගවේෂණ කටයුතු වැඩිදුරටත් සිදු කරනු ලබන්නේ එම මිනිරන් ඉල්ලම් සංචිත වල ප්‍රමාණයන් නිශ්චය කිරීම සඳහාය. පතලේ විස්තරාත්මක සිතියම් සහ මිනිරන් ඉල්ලම් සම්පත් ඇති ප්‍රදේශ සිතියම් ගත කිරීම ඇතුළුව සවිස්තරාත්මකව සිතියම් ගත කිරීමේ කටයුතු ආරම්භ කොට තිබේ. මෙය පතලේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමට ද ආයෝජන තීරණයන් ගැනීමට ද උපකාරී වේ.

- **දෙවැනි ආවාටය කැණීම**

දෙවන පතුවළ (Second Shaft) සංවර්ධනයන් නැවත ආරම්භ කිරීම සඳහා අලුතින් රේල් පීලි දමා අවශ්‍ය කටයුතු සිදු කර ඇත .

- **වැඩබිම්**

අඩි 1,132 මට්ටමේ සිට අඩි 2,000 මට්ටමත් මිනිරන් නිෂ්කාශණය කිරීමේ නව වැඩපලවල් ආරම්භකර ඇත. අඩි 2,000 මට්ටමත් සංවර්ධන කටයුතු සඳහා ආධාරක පතුවලවල් 2 ක් ආරම්භ කර ඇත.

- **අගය එකතු කිරීම**

කැනීම් කරනු ලබන මිනිරන්වල කාබන් ප්‍රතිශතය වැඩි කිරීම සඳහා පිරිපහදු යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

**වෙනත් සංවර්ධන කටයුතු**

- **කැණීම් උපකරණ**

මිහිතුල නව වායු පංකා සවි කිරීම, පැරණි මළ බැඳුනු වායු මාර්ග ප්‍රතිෂ්ඨාපනය කිරීම, අලාභ හානිවූ යකඩ රැහැන් හා දිරාපත්වූ දැවල වානේ ආධාරක සවිකිරීම යන කටයුතු කිරීමට අපේක්ෂිතය.

- **භූමි උපයෝගීතාවය**

මිහිතුල පතලට අමතරව පොළොව මතුපිට ඇති අක්කර 102 ක් වූ භූමි ප්‍රමාණය සමාගම සතු අගනා වත්කමකි. එම ඉඩමෙන් අක්කර 26 ක භූමි ප්‍රමාණයක් වෙනුවෙන් කුරුණෑගල දිසා අධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතින බැවින් එකී ප්‍රමාණය තුල සංවර්ධන කටයුතු උසාවියේ තීන්දුව ලැබෙන තුරු අත්හිටුවා තිබේ. ඉතිරි අක්කර 76 සමාගම විසින් කළමනාකරණය කරනු ලබන අතර, එම අක්කර 76 න් අක්කර 52 ක් නැවත වගා කර තිබේ. කුරුඳු, කෙසෙල් සහ සමහර සෘතු බෝග වර්ග (ඉඟුරු) වගා කර ඇත.

# 16

# ජාතික ලුණු සමාගම (NSL)

## 16.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ කාලීන ඉතිහාසයක් ජාතික ලුණු සමාගම සතුවේ. මෙම සමාගම විසින් සාමාන්‍ය ලුණු, අයඩින් මිශ්‍රිත ලුණු සහ කාර්මික ලුණු යන ප්‍රභේද නිෂ්පාදනය කරයි. එහි ප්‍රධානත ම ලේවායන් මන්නාරම සහ අලි මංකඩ ප්‍රදේශයන් හි ස්ථානගත වී ඇති අතර ප්‍රධාන කාර්යාලය කොළඹ ස්ථානගත වී ඇත.

1938 වර්ෂයේ දී ආරම්භ වූ ලුණු සංස්ථාව විවිධාකාරී වූ පරිපාලන ව්‍යුහයන්ගේ පාලනයට නතුව පැවත අවසානයේ 2001 වර්ෂයේ දී එය මාන්තායි ලුණු සමාගම බවට පරිවර්තනය වීමෙන් අනතුරුව, 2021 වර්ෂයේ දී ජාතික ලුණු සමාගම වශයෙන් නැවත සංශෝධනය කර ඇත.

ජාතික ලුණු සමාගම ස්වභාවික සම්පත් උපයෝජනය කිරීමේ මධ්‍යස්ථනයක් ලෙස පමණක් නොව උතුරු පළාතේ අවදානමට ලක් වූ පුද්ගල ප්‍රජාවන් සඳහා රැකියා අවස්ථා උදා කර දෙනු ලබන ස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි. අද වන විට ස්ථිර සේවකයන් 52 ක් ද සෘතුමය සේවකයින් 200ක් පමණ ද ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය ආයතනයන් හි නියෝජනයන්ගෙන් ජාතික ලුණු සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සමාගම පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.. එතෙකුදු නොව, සමාගමෙහි ප්‍රමිති තත්ත්වය සහතික කරනු වස් එය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙහි සහතිකලාභී තත්ත්වයට පත් කොට ඇත.

### දැක්ම

"රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් ක්‍රියාවලින් හා සම්බන්ධිත ස්වභාවික සම්පත් ගවේශනය කිරීම

මගින් උතුරු ප්‍රදේශයෙහි ලුණු ආශ්‍රිත ව්‍යාපාර සංවර්ධනය කිරීම සහ එමඟින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම.

**මෙහෙවර**

උතුරු පලාත තුල ලුණු ලේවාය මෙහෙයවීම, ලුණු සහ අතුරු නිෂ්පාදන නිෂ්පාදනය කිරීම, සැකසීම සහ වෙළඳාම.

**ප්‍රධාන පරමාර්ථ**

**අමු ලුණු** (Raw Salt) **නිෂ්පාදනය කොට ඊට අගය එකතු කිරීමක් ලෙස පරිභෝජනය සඳහා වන කැටලුණු සැකසීම සහ අයඩීන් මිශ්‍ර කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.**

## 16.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස 30 දිනට)

### මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | | තත්‍ය (2021/2022) |
|---|---|---|
| 1. | සාමාන්‍ය ලුණු නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | |
| මන්නාරම | | 1647 |
| අලි මංකඩ | | 3027 |
| එකතුව | | 4674 |
| 2.ලුණු විකුණුම් (මෙට්‍රික් ටොන්) | | 853 |
| 3. ලුණු විකුණුම් රුපියල් | | 38,534,370 |
| 3.1 | ලුණු විකුණුම් | 38,534,370 |
| 3.2 | මුළු ආදායම | 43,540,697 |
| 3.3 | විකුණු භාණ්ඩ පිරිවැය (CoGS) | 20,738,003 |
| 34 | දළ ලාභය | 17,796,368 |
| 3.5 | ශුද්ධ ලාභය / (අලාභය) - බදු පසු | 10,264,764 |
| 3.6 | ශුද්ධ ලාභය / (අලාභය) - බදු පෙර | 11,935,773 |
| 3.7 | කොටසකට ඉපැයුම් (රු.) | 34.22 |

මූලාශ්‍රය: **මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලිනි**

සටහන: රට තුල පැවති තිව්‍ර අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ලුණු නිෂ්පාදනයට දැඩි ලෙස බාධා එල්ල විය

## 16.3 අනාගත සැලසුම් - 2023

| | සැලසුම් | සාක්ෂාත් කර ගන්නා වර්ෂය |
|---|---|---|
| 01 | අලි මංකඩ ලුණු ලේවායෙහි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25000ක් දක්වා ඉහල නංවා ගැනීම | 2023<br>2024 |
| 02 | අලි මංකඩ ලුණු ලේවායෙහි මේස ලුණු නිෂ්පාදන යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීම | 2023<br>2024 |
| 03 | මන්නාරම ලුණු ලේවායෙහි මේස ලුණු නිෂ්පාදන යන්ත්‍රාගාරයෙහි දිගුවක් ආරම්භ කිරීම | 2024 |
| 04 | කුරුන්වතිවු ලුණු ලේවායෙහි මෙහෙයුම් කටයුතු සී / ස ජාතික ලුණු සමාගම විසින් සිදු කිරීම | 2023<br>2024 |

# 17

# ජාතික කඩදාසි සමාගම (NPCL)

## 17.1 හැඳින්වීම

ආරම්භයේ දී පැවති ජාතික කඩදාසි සංස්ථාව පසුව 1982 අංක: 17 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව සී/ස ජාතික කඩදාසි සමාගම වශයෙන් සංස්ථාපනය වී ඇති අතර, මේ වන විට 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන අනුව පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

වාලච්චේන කඩදාසි කම්හල හා ඇඹිළිපිටිය කඩදාසි කම්හල සී/ස ජාතික කඩදාසි සමාගම යටතේ පවතී.

## දැක්ම

“ප්‍රචෘත්ති මුද්‍රණයට අවශ්‍ය කඩදාසි, මුද්‍රණයට අවශ්‍ය කඩදාසි, සහ පරිගණක මුද්‍රණයට අවශ්‍ය කඩදාසි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවේ වෙළඳපොල ප්‍රමුඛයා වීම”.

## මෙහෙවර

“පරිසර හිතකාමී සහ පිරිවැය ඵලදායී ක්‍රමවේද අනුගමනය කිරීම තුළ පාරිභෝගික අවශ්‍යතාවන්ට අනුකූලව කඩදාසි නිෂ්පාදනය සහ අලෙවිය සිදු කිරීම”.

## කාර්ය සාධනය

- 2014 දෙසැම්බර් මස සිට නවතා තිබූ වාලච්චේන කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු අංක: අමප/20/0561/224/015 හා 2020.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දී ඇති අනුමැතිය පරිදි 2020 ජූලි මස සිට සී/ස ජාතික කඩදාසි සමාගම විසින් නැවත ආරම්භ කර ඇත.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඇඹිළිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම (අක්කර 111 රූඩ් 02 පර්චස් 33ක) දීර්ඝ කාලීන බදු පදනම මත වසර 30ක කාල සීමාවක් සඳහා සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දීමට අංක: අමප/21/1015/320/032 සහ 2021.07.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව 2021.10.13 දින සිට වසර 30ක කාල සීමාවක් සඳහා ඇඹිළිපිටිය කඩදාසි කම්හල පිහිටි ඉඩම් කොටසට අදාළව දීර්ඝ කාලීන බදු ඔප්පු සකස්කර සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලබා දී ඇත.

- 2012 වර්ෂයේ සිට නවතා දමා තිබූ ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව සී/ස ජාතික කඩදාසි සමාගම හා ආයෝජක සමාගම වන KSPA Embilipitiya Paper Mills (Pvt) Ltd අතර ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් වසර 30ක කාල සීමාවකට අදාළ ගිවිසුම 2022.03.09 දින අත්සන් කර ඇත. කම්හලෙහි විසන්ධි කර ඇති විදුලි සැපයුම නැවත ලබා දීමෙන් පසුව මාස 18ක කාලයක් තුළ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිතය.

## 17.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

**වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදනය හා උපයන ලද ආදායම**

| මාසය | නිෂ්පාදනය (මෙ.ටො.) | ආදායම (රු) |
|---|---|---|
| ජනවාරි | 108.62 | 15,370,620.00 |
| පෙබරවාරි | 175.78 | 23,632,137.00 |
| මාර්තු | 188.77 | 26,976,825.31 |
| අප්‍රේල් | 95.5 | 19,342,380.88 |
| මැයි | 138.46 | 36,192,150.00 |
| ජුනි | 89.70 | 32,457,050.00 |
| ජූලි | 49.71 | 21,564,202.00 |
| අගෝස්තු | 81.61 | 37,103,989.00 |
| සැප්තැම්බර් | 126.76 | 50,510,036.60 |
| **එකතුව** | **1054.21** | **263,149,390.79** |

මූලාශ්‍රය : ජාතික කඩදාසි සමාගම

**ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම මඟින් ලැබෙන ප්‍රතිලාභ**

- ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල : රු.බිලියන 3.5කි.
- සිදු කිරීමට අපේක්ෂිත දෛනික කඩදාසි නිෂ්පාදනය (පල්ප් මත පදනම් වූ කඩදාසි) : මෙ.ටොන් 250 කි.
- සී/ස ජාතික කඩදාසි සමාගම වෙත ලැබෙන වාර්ෂික පිරිවැටුම (Annual Turnover) පහත පරිදි ගණනය කරනු ලබයි.
  වාර්ෂිකව සිදු කරන නිෂ්පාදන X 3%
  (Transfer Price X 3%)

**සී/ස ජාතික කඩදාසි සමාගමේ ප්‍රධාන කාර්යාලය සහ වාලච්චේන කඩදාසි කම්හලෙහි කාර්යාලයේ යටිතල පහසුකම් වැඩිකිරීම.**

## 17.3 අනාගත සැලැසුම් - 2023

- වාලච්චේන කඩදාසි කම්හලෙහි කඩදාසි නිෂ්පාදන යන්ත්‍ර (Paper Machine & Board Machine) අළුත්වැඩියා කර මාසික කඩදාසි නිෂ්පාදනය වැඩි කිරීම.
- වාලච්චේන කඩදාසි කම්හලෙහි වහලය මත සූර්ය පැනල පද්ධතියක් (Solar Power System) ස්ථාපිත කිරීම.
- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමඟ ඒකාබද්ධව එරාවූර් කර්මාන්තපුරය සඳහා පානීය ජලය සැපයීමේ ව්‍යාපෘතිය සිදු කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය යටතේ වාලච්චේන කඩදාසි කම්හල් පරිශ්‍රයෙහි විවිධාංගීකරණ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.

# 18

# ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් (LMSL)

## 18.1 හැඳින්වීම

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික ආඥාපනත යටතේ ස්ථාපිත කර ඇති අතර 1992 වර්ෂයේ දී පූර්ණ රජය සතු සමාගමක් බවට පත්කර ඇත. 2007 අංක07 දරන නව සමාගම් පනත අනුව අංක. පී.බී.587 යටතේ 2008.09.16 වන දින පූර්ණ රජය සතු සමාගමක් ලෙස නැවත ලියාපදිංචිකර ඇත. ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන කාර්යාලය රාජගිරිය ප්‍රදේශයේ පිහිටා ඇති අතර, නිෂ්පාදන කර්මාන්තශාලාව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්යේ පුල්මුඩේ ප්‍රදේශයේ ස්ථාපිතකර ඇත.

### දැක්ම

“ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ නිෂ්පාදකයින් අතරින් ජාතික ආර්ථිකයට ප්‍රමුඛතම දායකත්වය ලබා දෙන්නා බවට පත්වීම ”

### මෙහෙවර

“හරිත සංකල්පය යටතේ දේශීය හා විදේශීය ගැනුම්කරුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කිරීම සඳහා නවීන තාක්ෂණය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට උපරිම දායකත්වය ලබාදීම”

### කාර්යභාරය

- දළ වැලි කැණීම පිරිසැකසීම සහ භෞතික ගුණත්වයන් අනුව ඉල්මනයිට රූටයිල්, සර්කෝන් ගානට් මොනසයිට්,කෲඩ් සර්කෝන්, හයි ටයි ඉල්මනයිට් යනාදී වශයෙන් බර ඛනිජ වැලි වෙන් කිරීම.
- ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම් මඟින් බර ඛනිජ වැලි අපනයනය කිරීම.

- නව බර ඛනිජ වැලි නිධි හඳුනා ගැනීම සහ ගවේශනය කිරීම.
- එම නිධි වල පවතින බර ඛනිජ වැලි ඉවත්කර ගැනීම සඳහා වන මූලික පාරිසරික අධ්‍යයනයන් හෝ පාරිසරික බලපෑම අධ්‍යනයක් සිදු කිරීම.
- එසේ හඳුනාගන්නා බර ඛනිජ වැලි නිධි වල ආර්ථිකමය ශක්‍යතාවය අධ්‍යනය කිරීම.
- ආයතනය සතු බර ඛනිජ වැලි නිධි ප්‍රමාණය පුලුල් කරගැනීමට කටයුතු කිරීම.
- පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නවීකරණ කටයුතු අවසන් කිරීම තුළින් නිෂ්පාදනය ඉල්මනයිට් මෙ.ටො.75,000 ක (2022 දෙසැම්බර් 31වන විට) මට්ටමට පත් කිරීම.

**පුල්මුඩේ කැණීම් සහ පසු පිරවීම් කටයුතු සිදුකර ආකාරය**

**කැණීම්**



**පසු පිරවීම්**



## 18.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

**අලෙවි ආදායම**

| මාසය | අලෙවි ආදායම රු.මි. |
|---|---|
| ජනවාරි | 326 |
| පෙබරවාරි | 254 |
| මාර්තු | 1 |
| අප්‍රේල් | 0 |
| මැයි | 2 |
| ජුනි | 31 |
| ජූලි | 0 |
| අගෝස්තු | 0 |
| සැප්තැම්බර් 30 දිනට | 1,660 |
| එකතුව | 2274 |

මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්




මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්

**නිෂ්පාදනය (මෙ.ටො.)(2022 සැප්තැම්බර් 30 දක්වා)**

| | නිෂ්පාදනය (මෙ.ටො.) | | | |
|---|---|---|---|---|
| මාසය | ඉල්මනයිට් | රූටයිල් | සර්කෝන් | හයි-ටයි ඉල්මනයිට් |
| ජනවාරි | 5052 | 114 | 56 | 278 |
| පෙබරවාරි | 3912 | 140 | 13.2 | 282 |
| මාර්තු | 1798 | 113 | 33.8 | 251 |
| අප්‍රේල් | 1256 | 39 | 20.88 | 116 |
| මැයි | 912 | 0 | 22.16 | 0 |
| ජුනි | 0 | 0 | 24.88 | 0 |
| ජූලි | 0 | 0 | 9.16 | 0 |
| අගෝස්තු | 0 | 0 | 7.48 | 0 |
| සැප්තැම්බර් 30දිනට | 730 | 26 | - | 66 |
| එකතුව | 13660 | 432 | 187.56 | 993 |

මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්

**නිෂ්පාදනය**




මූලාශ්‍රය: ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්

## 18.3 අනාගත සැලැසුම් - 2023

- කෝකිලායි යන්ත්‍රාගාරයේ ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීම හා කෝකිලායි පිරිපහදු යන්ත්‍රාගාරයේ නිශ්පාදන කටයුතු 2023 වර්ෂයේ අඟ භාගයේදී ආරම්භ කිරීම.
- කෝකිලායි කැනීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.
- ජංගම යන්ත්‍රාගාරය පොදුවකට්ටු ප්‍රදේශයේ ස්ථාපිත කිරීම.
- EIA හාIEE වාර්තා අනුව අදාල පාරිසරික නිර්දේශයන් ලබා ගැනීම තුළින් කැණීම් බලපත්‍ර අඛණ්ඩව ලබා ගැනීමට කටයුතු කිරීම.
- මුහුදේ ගවේශන කටයුතු ආරම්භ කිරීම.
- නව ගවේශන බලපත්‍ර අනුව හම්බන්තොට, පානම, නිලාවේලි සහ මුත්තූර් යන ප්‍රදේශ වල ගවේශන කටයුතු ආරම්භ කිරීම.
- ඛනිජ වැලි අගය එකතුකිරීමේ නිෂ්පාදන කර්මාන්තය ස්ථාපිත කිරීම පියවර 2ක් ඔස්සේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.
    i. ආයතනය මඟින් හඳුනාගත් නිෂ්පාදනයන් කිහිපයක් සඳහා අගය එකතු කිරීමේ නිෂ්පාදනයට යොමු වීම.
    ii. කර්මාන්ත අමාත්‍යාංශය මඟින් යෝජිත අගය වැඩි කිරීමේ වැඩපිළිවෙල අනුව සුදුසු ආයෝජකයෙකු සමඟ ඉල්මනයිට් ආශ්‍රිත අගය වැඩි කිරීමේ නිෂ්පාදන කර්මාන්තය සඳහා යොමු වීම.
- ප්‍රධාන කාර්යාලය නව ගොඩනැඟිල්ලේ ස්ථාපිත කිරීම.
- ආයතනය සතු මානව සම්පත නිසි ලෙස කළමණාකරණ කිරීම තුළින් කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කිරීම.

# 19

# ලංකා පිඟන් සංස්ථාව (CCC)

## 19.1. හැඳින්වීම

ජාතික කුඩා කර්මාන්ත සංස්ථාව ගඩොල් සහ ටයිල් ඒකකය 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලදී.

රාජ්‍ය කාර්මික සංස්ථාවේ ගඩොල් සහ ටයිල් ඒකකය 1972 දී ලංකා පිඟන් සංස්ථාවට ස්ථාපිත විය.

1990 ජනවාරි මාසයේ දී සංස්ථාවේ පිඟන් භාණ්ඩ අංශය පෞද්ගලීකරණය කරන ලද අතර සංස්ථාවේ ගඩොල් සහ උළු ඒකකය ''ලංකා පිඟන් සංස්ථාව'' නමින් දිගටම පවත්වාගෙන ගියේය.

### දැක්ම

සෙවිලි උළු, ගඩොල් සහ උසස් තත්ත්වයේ මැටි නිෂ්පාදන නිෂ්පාදනය සහ අලෙවිය යන ක්ෂේත්‍රවල ප්‍රමුඛයා වීම.

### මෙහෙවර

සමාජීය වගකීම් සහගත අයුරින් සහ දීප ව්‍යාප්ත ජාලය හරහා සියලුම පාර්ශවකරුවන්ට උපරිම දායකත්වය ලබාදෙමින් තරඟකාරී මිල ගණන් යටතේ උසස් තත්ත්වයේ නව්‍ය නිෂ්පාදන ලබා දීමෙන් සම්පූර්ණ පාරිභෝගික තෘප්තිය සහතික කිරීම.

**ගඩොල් හා උළු කර්මන්තශලාවන්හි පිහිටීම් හා ධාරිතාවය**

| කර්මාන්තශාලාව | ස්ථානය | දේපළ (අක්කර) | තත්වය |
|---|---|---|---|
| එරගම | අම්පාර | 232 | උපරිම ධාරිතාවයකින් ක්‍රියාත්මක වීම |
| මහියංගණය | මහියංගණය | 94 | මෙහෙයුම්/ ශ්‍රී ලංකා ගුවන් හමුදාව නිලගිරිය සහ දීසවාපිය ගඩොල් නිෂ්පාදනය.EOI ඇමතිමට. |
| උස්වැව | ඇඹිලිපිටිය | 19 | 2021 සැප්තැම්බර් සිට නැවත මෙහෙයුම් ආරම්භ කරන ලදී. දර, විදුලිය සහ ඩීසල් ගැටළුව හේතුවෙන් නැවත මෙහෙයුම් තාවකාලිකව නතර විය. EOI ඇමතිමට. |
| යටියන | මාතර | 06 | කාර්මික රාජ්‍යයක් ආරම්භ කිරීමට සැලසුම් කරමින් දැනට නවතා ඇත. |
| බිංගිරිය | බිංගිරිය | 03 | 2021 මැද භාගය දක්වා සඳහිරු සෑය ගඩොල් නිෂ්පාදනය කර ඇත.දැනට මෙහෙයුම් නතර කර ඇත. |
| වැළඩ | කුරුණෑගල | 09 | කැබිනට් අනුමැතිය ලැබිණි, EOI ක්‍රියාත්මක වෙමින් පවති. |
| ඇලයාපත්තුව | අනුරාධපුරය | 33 | ශ්‍රී ලංකා යුධ හමුදාව නිලගිරිය සහ දීසවාපිය ගඩොල් නිෂ්පාදනය කරමින් කාර්මික රාජ්‍යයක් ආරම්භ කිරීමට සැලසුම් කරයි. |
| ඔඩ්ඩුසුඩාන් | මුලතිව් | 13 | අලුත්වැඩියා කටයුතු සිදුවෙමින් පවති; 80% කට වඩා සම්පූර්ණ කර ඇත. EOI ඇමතිමට. |
| බංගදෙණිය | බංගදෙණිය | 07 | ඉඩම පමණි. |
| එකතුව | | 383 | |

**මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව

## 19.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

1. 2022 ජනවාරි මාසයේදී සියලුම නිෂ්පාදන අලෙවි කරන මිල 10% කින් වැඩි කරන ලදී.
2. 2022 මැයි 01 වන දින සිට ගඩොල් සහ උළු වල විකුණුම් මිල 10% කින් වැඩි කිරීම.
3. එයට අදාලව සුදුසුකම් ලෙස රුපියල් මිලියන 8.0 මාසික විකුණුම් සහ පළමු ශ්‍රේණියේ අවසාන නිෂ්පාදනය 87% ක් මාසික කාර්යක්ෂමතාවයක් වේ.
4. 2022 ජනවාරි අනියම් වැටුප් 10% කින් ද 2022 මැයි අනියම් වැටුප් දිනකට රුපියල් 100 කින් ද වැඩි කරන ලද අතර 2022 ජුනි 01 දින සිට කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දී ඇත.

**ප්‍රධාන ක්‍රියාවලි දර්ශකය - ලංකා පිඟන් සංස්ථාව**

| ක්‍රියාවලිය | 2021 සත්‍ය | 2022 ඉලක්ක |
|---|---|---|
| නිෂ්පාදනය (මසකට කැලි) | 147,841 | 162,625 |
| විකුණුම් (මසකට රු. මි. ) | 6.93 | 7.62 |
| ලාභදායිත්වය (වසරකට රු. මි) | 5.05 | 25 |
| නව නිෂ්පාදන හඳුන්වා දීම | සැකසූ මැටි | හිස්ගඩොල්,වෙරා කොටා, ළමුන් සඳහා මැටි |

**මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව

**ලංකා පිඟන් සංස්ථාවෙහි නිෂ්පාදන**





**මිල ඉහළයාම 2021/2022**

| අයිතම | මිනුම් ඒකකය | 2021 ජූලි සත්‍ය (රුපියල්) | 2022 ජූලි සත්‍ය (රුපියල්) | වැඩි කිරීමේ % |
|---|---|---|---|---|
| ඉන්ධන | ලීටර | 110.85 | 431.78 | 390% |
| මැටි | පිරිවැය/කියුබ් | 500.00 | 1269.09 | 254% |
| දර | පිරිවැය/ යාර්ඩ් | 1636.56 | 2393.71 | 146% |
| විදුලිය | නිෂ්පාදන ඒකක | 1.54 | 2.11 | 137% |
| ශ්‍රම පිරිවැය | පිරිවැය/මිනිස් දින | 958.77 | 1076.42 | 112% |
| නිෂ්. පිරිවැය | පිරිවැය/ ටයිල් | 22.54 | 33.07 | 147% |

**මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව

❖ උස්වැව, මහියංගණය සහ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය සමඟ නැවත මෙහෙයුම් ආරම්භ කිරීම.

උනන්දුවක් දක්වන පාර්ශව - සැමසන් රජරට ටයිල්ස්,විෂන් කෙයාර් ගෲප්, සුවෙන්ද ටයිල්ස් - දංකොටුව.

## 19.3 අනාගත සැලසුම් - 2023

| සැලැස්ම | විස්තරය |
|---|---|
| A | කර්මාන්තශාලා තුන සඳහා ආයෝජකයින් කැඳවීම. (දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත.) |
| B | දැනට පවතින යන්ත්‍ර අලුත්වැඩියා කර මාසික ධාරිතාව 50,000ක් සහිත කැලකට ටයිල් නිෂ්පාදනය ආරම්භ කිරීම |
| C | කුහර ගඩොල්, Terra – Cotta ප්‍රවාහ ටයිල් සහ වයර් කැපූ ගඩොල් නිෂ්පාදනය හඳුන්වා දීම. මාසිකව කැලි 150,000 දක්වා ධාරිතාව වැඩි දියුණු කිරීම. |
| D | ඉතාලිය,ස්පාඤ්ඤය,මැලේසියාවෙන් නව අච්චු මිලදී ගැනීමෙන් යුරෝ ටයිල්, රෝමන් ටයිල් වැනි අගය එකතු කළ නව නිෂ්පාදන හඳුන්වා දීම. |
| E | Glaze ටයිල් සහ Extrusion (Terra – Cotta) බිම් ටයිල් නිෂ්පාදනය කිරීම සඳහා නව යන්ත්‍ර (එකම ස්ථානයේම නව කර්මාන්ත ශාලාව) සමඟ නව නිෂ්පාදන පෙළක් හඳුන්වා දීම. |
| F | මැටි පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සමඟ එක්ව විදේශීය සිසුන් සඳහා පුහුණු මධ්‍යස්ථානය. |

**මූලාශ්‍රය:** ලංකා පිඟන් සංස්ථාව

- කුහර ගඩොල් (සිමෙන්ති ගඩොල් නැවත සැකසීම, නෙරා ඇති බිම් උළු ශ්‍රී ලංකා වෙළඳපොළට හඳුන්වා දීම.)
- ජාතික කලා මණ්ඩලය හරහා කුඹල් ගම්මානවලට සැකසූ මැටි සැපයීම.(අනෙහි ඇණවුම මෙට්‍රික් ටොන් 25)
- ටෙරා - කොටා බිම් ටයිල් මතුපිට දැඩි කිරීම සහ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- "S" වර්ගයේ ටයිල්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ දේශීය වෙළඳපොළට හඳුන්වා දීම.
- නව නිස්සාරණය කරන ටෙරා - කොටා බිම් ටයිල් හඳුන්වාදීම.
- වෙබ් අඩවිය සංවර්ධනය කිරීම, "ඊ" අලෙවිකරණය,ප්‍රවෘත්ති පත්‍ර ප්‍රචාරණය.
- අම්පාර,යටියන, උස්වැව කර්මාන්තශා ලා සඳහා සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම.
- ග්‍රාමීය ගම්මානවල ටැංකි මැටි (Slit Clay) භාවිතයෙන් අතින් සාදන ලද Terra –Cotta, Hollow Bricks & Roof ටයිල් නිෂ්පාදනය කිරීම.
- ඔඩ්ඩුසුඩාන්, වැඋඩ, මහියංගනණය සහ උස්වැව කර්මාන්තශාලා සඳහා සුදුසු ආයෝජකයින් සොයා ගැනීම සඳහා සාකච්ඡා කෙරමින් පවතී.
- අපනයන නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකාවේ මහ පරිමාණ රතු මැටි නිෂ්පාදකයින් වෙත එරගම මැටි සාම්පල ඉදිරිපත් කෙරේ.
- කටුනායක ATG අත්වැසුම් කර්මාන්ශාලාවේ BOI හි ඉහළ මිලක් සහිත බෙන්ටොනයිට් මැටි වෙනුවට එරගම සැකසූ මැටි සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු වෙමින් පවතී.
- HABITAT ව්‍යාපෘති සඳහා රතු මැටි සෙවිලි උළු, කුහර ගඩොල් සහ ටෙරා - කොටා ටයිල් භාවිතා කරමින් අඩු වියදම් නිවාස ඉදිකිරීම
- මල් පෝච්චි සහ එළවළු භාජන නිෂ්පාදන (R&D සිදු වෙමින් පවතී).
- වහලයේ උළු සඳහා අඩු වියදම් ග්ලැසියර හඳුන්වා දීම. (R&D සිදු වෙමින් පවතී)
- පාසල් සඳහා KID –CLAY සංවර්ධනය කිරීම, නියැදි නිෂ්පාදන සහ පරීක්ෂණ අවසන්.
- රතු මැටි/ ඩොලමයිට් සිමෙන්ති සංවර්ධනය, පරීක්ෂණ CEMENTO සමඟ සම්පූර්ණ කර ඇත.

# 20

# බී.සී.සී. ලංකා සමාගම (BCC)

## 20.1 හැඳින්වීම

මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බී.සී.සී. ලංකා සමාගම, එකම රාජ්‍ය පාලිත පාරිභෝගික නිෂ්පාදන සැපයුම්කරු වේ. බී සී සී සමාගම විසින් පිරිසිදු පොල්තෙල්, පිරිපහදු කළ පොල්තෙල්, නාන සබන්, රෙදි සෝදන සබන්, රෙදි සෝදන කුඩු, පිහන් සේදීමේ විෂබීජ නාශක, වායු පවිත්‍රකාරක සහ අත් සේදුම් වැනි උසස් තත්ත්වයේ පාරිභෝගික නිෂ්පාදන නිෂ්පාදනය කර අලෙවි කරයි.

සමාගමේ ප්‍රධාන නිෂ්පාදන කාර්යයට අමතරව රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශය සඳහා කාර්යාල හා ගබඩා පහසුකම් ලබා දීමෙන් බී.සී.සී. ලංකා සමාගම සැලකිය යුතු ආදායමක් උපයා ගනී.

### දැක්ම

"තිරසාරව සංවර්ධිත සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් තුළ, පැරණි වටිනාකම් රැක ගනිමින්, වෙළඳපළ ප්‍රමුඛතම වෙළඳ සන්නාමයබවට පත් වීම"

### මෙහෙවර

"තිරසාර පරිසරයක්, මූලික වටිනාකම් සහ සේවක තෘප්තිය පවත්වා ගනිමින් පාරිභෝගිකයා තෘප්තිමත් කිරීම"

### ප්‍රධාන ඉලක්කය

"දේශීය වටිනාකම් පවත්වා ගනිමින් පුරෝගාමී සහ ස්වයංපෝෂිත රාජ්‍ය සමාගමක් ලෙස ව්‍යාපාරයේ රැඳී සිටීම"

### ප්‍රධාන ක්‍රියාකාරකම්

- පොල්තෙල් පිරිපහදු කරණය
- රෙදි සෝදන සහ ඇඟ ගල්වන සබන් නිෂ්පාදනය
- විෂබීජ නාශක සහ ඩිටර්ජන්ට් නිෂ්පාදනය
- බී සී සී නිෂ්පාදන බෙදාහැරීමේ නියෝජිතයන් මඟින් දේශීය වෙළඳපොළට බෙදා හැරීම

- සුපිරි වෙළඳසැල් ජාල සඳහා ලංසු තැබීමේ ක්‍රියා පටිපාටි හා ගිවිසුම් යටතේ සෘජුව බී සී සී නිෂ්පාදන සැපයීම.
- බී.සී.සී .ලංකා සමාගමට අයත් කාර්යාල සහ ගබඩා අවකාශයන් කුලියට දීම.

## බී සී සී නිෂ්පාදන කළඹ



බී.සී.සී. ලංකා සමාගමෙහි නිෂ්පාදන කළඹ පහත සඳහන් නිෂ්පාදිත වලින් සමන්විත වේ.

- **ආහාරයට සුදුසු තෙල් :** බී සී සී සුදු පොල්තෙල්, කුක්ස් ජෝයි
- **සුවඳ සබන් :** සඳුන්, සුවේන්ද්‍රා ආයුර්වේද, සුවේන්ද්‍රා ෆ්ලෝරල්
- **රෙදි සෝදන සබන් :** සවරින් බාර්, ස්නෝ වයිට්
- **විෂබීජ නාශක :** ෆයිනෝල් , ටොයිලට් බඳුන් පිරිසිදුකාරක
- සෝදන කුඩු : ස්නෝ වයිට් (කි.ග්‍රෑ1, ග්‍රෑ 500, ග්‍රෑ 200)
- ඩිෂ් වොෂ් : දියර සහ පවුඩර
- අත්සේදුම්කාරක
- එයාර් ෆ්‍රෙෂ්නර්

## වෙළඳපල කොටස හා නිෂ්පාදන ධාරිතාවය

### පොල්තෙල් නිෂ්පාදන

බීසීසී වෙළෙඳපොළ කොටස සමස්ථ පොල්තෙල් වෙළෙඳපොළෙන් 2.5%ක් පමණ වේ. කෙසේ වෙතත්, පොල්තෙල්වල පෝෂණ සංයුතිය සහ රසායනික අන්තර්ගතය පිළිබඳ දැවැන්ත සැලකිල්ලත් සමඟ, පසුගිය මාස කිහිපය තුළ බීසීසී නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, සන්නාමගත බෝතල් කල පොල්තෙල් වෙළඳපළ තුළ බීසීසී හි වෙළඳපළ කොටස 15% - 20 % දක්වා වැඩි කර ගැනීමට හැකි වී ඇත.

ඒ සමගම බීසීසී පොල්තෙල් සන්නාමය වෙළඳපොලේ විශ්වාසවන්තම පොල්තෙල් සන්නාමය බවට මේ වනවිට පත්ව ඇත.

### සබන් නිෂ්පාදන

ආකර්ශනීය සබන් නිෂ්පාදන සමඟින් වෙළඳපල අත්පත්කර ගැනීම සඳහා නව යන්ත්‍රෝපකරණ වලින් සමන්විත නවීන සබන් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමට යෝජිතය. වර්ථමාන සබන් වෙළඳපොලේ බීසීසී හි නියෝජනය පහත පරිදි වේ.

### සබන් නිෂ්පාදන වෙළඳපොල කොටස

| සබන් වර්ගය මෙ.ටො. | ඇස්තමේන්තුගත වෙළඳපළ (මෙ.ටො.) | බී සී සී වෙළඳපළ කොටස |
|---|---|---|
| සුවඳ සබන් | 34000 | 1% |
| රෙදි සෝදන සබන් | 30000 | 1.2 % |

*මූලාශ්‍රය: බී.සී.සී. ලංකා සමාගම*

### නිෂ්පාදන ධාරිතාවය

බී.සී.සී. ලංකා සමාගමට අයත් යන්ත්‍රෝපකරණවලින් බහුතරයක් ඉතා පැරණි වන අතර යන්ත්‍රවල ධාරිතාව පහත පරිදි වේ. ඒ අනුව නිෂ්පාදන පිරිවැය අඩු කිරීමේ ඉහළ අභිප්‍රාය ඇතිව, පැරණි යන්ත්‍රෝපකරණ ඉවත් කොට, පූර්ණ ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ ප්‍රතිස්ථාපනය කිරීමට සමාගම සැලසුම් කරයි

**නිෂ්පාදන ධාරිතාවය**

| අයිතමය | නිෂ්පාදන ධාරිතාවය (මෙ. ටොන් ) | සාමාන්‍ය නිෂ්පාදනය (මෙ. ටොන් ) |
|---|---|---|
| පොල්තෙල් | 1500 | 1200 |
| සබන් නිෂ්පාදන | 600 | 150-200 |

**මූලාශ්‍රය:** බී.සී.සී. ලංකා සමාගම

## 20.2. ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

### 1.ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය 2022

2022 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය 2022 පෙබරවාරි මස 2 – 6 ත් අතර දින වලදී, කර්මාන්ත අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

**කාර්මික නවෝත්පාදන ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටිය**




මෙවර මෙම ප්‍රදර්ශනය “සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා කාර්මික නවෝත්පාදනය“ යන මැයෙන් සංවිධානය කොට තිබුණ අතර මෙම ප්‍රදර්ශනය සඳහා මෙරට ප්‍රමුඛතම කර්මාන්ත ක්ෂේත්‍ර 20ක් නියෝජනය කරමින් බී සී සී ආයතනය ඇතුලු ඉදිරිපෙළ කර්මාන්තකරුවන් විසින් ප්‍රදර්ශන කුටි 400ක් ඉදිරිපත් කර තිබුණි.

බී සී සී සන්නාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් බී සී සී ආයතනය මෙම ප්‍රදර්ශනයෙහි ප්‍රධාන මූල්‍ය අනුග්‍රාහකයකු ලෙස සහභාගී වූ අතර, බී සී සී නිෂ්පාදන සම්බන්ධයෙන් විශාල ප්‍රචාරණයක් මෙම ප්‍රදර්ශනය හරහා සිදු කරන ලදී.

### 2 ජාතික කර්මාන්ත විශිෂ්ටතා සම්මාන උළෙල 2022

2022.02.15 වන දින සවස බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී පැවැත්වුන අතර මෙහිදී ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය සාර්ථක කර ගැනීම සඳහා ලබා දුන් මූල්‍ය අනුග්‍රාහකත්වය අගය කරමින් බීසීසී ලංකා ලිමිටඩ් ආයතනය වෙත සමරු තිළිණයක් පිරිනමන ලදී.

**මූල්‍ය අනුග්‍රාහකත්වය අගය කරමින් බීසීසී වෙත පිරිනැමුණු සමරු තිළිණය**



### 3. දෙහිවල ඇග්රෝ ෆ්‍රෙෂ් සුපර්අලෙවි ජාලය

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය විසින් පවතින ආර්ථික අර්බුදය හමුවේ ප්‍රජාවට සහන සැලසීම සඳහා එම මණ්ඩලය සතු අලෙවිසැල් ඇග්රෝ ෆ්‍රෙෂ් සුපර් නමින් නව

මුහුණුවරකින් ආරම්භ කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන යටතේ බීසීසී නිෂ්පාදනද පහසු මිලකට පාරිභෝගිකයන් හට අලෙවි කිරීම සඳහා එම වෙළඳ ජාලය සමඟ 2022 ජුලි මස සිට සම්බන්ධ විය.

**දෙහිවල ඇග්රෝ ෆ්‍රෙෂ් සුපර් අලෙවිසැල**




මූලික අදියර යටතේ දෙහිවල ප්‍රදේශයේ ආරම්භ කරන ලද ඇග්රෝ ෆ්‍රෙෂ් සුපර් වෙළඳසැල වෙත බීසීසී නිෂ්පාදන සපයන ලද අතර ඉදිරියේදී මෙම ජාලය යටතේ ආරම්භ වන සියළු අලෙවිසැල් සඳහා බීසීසී නිෂ්පාදන සැපයීමට අපේක්ෂා කෙරේ.

## 4. නව නිෂ්පාදන සංවර්ධනය සහ ඇසුරුම් සහ ලේබල් නැවත නිර්මාණය කිරීම

### සබන්

බීසීසී ලංකා සමාගම විසින් ස්නෝවයිට් කේයාර් නමින් රෙදි සෝදන සබන් දියර නිෂ්පාදනයක් සාධාරණ සහ දැරිය හැකි අගයකට වෙළඳපළට නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

### පොල් තෙල්

අනෙකුත් තරඟකාරී නිෂ්පාදන සමඟ ගැළපෙන අයුරින් සහ වැඩි පාරිභෝගික ආකර්ෂණයක් ලබා ගැනීමට හැකිවන පරිදි පොල් තෙල් නිෂ්පාදන ඇසුරුම සහ ලේබල් ප්‍රතිනිර්මාණය කිරීමට කටයුතු කරන ලදී.

**අලුතින් නිර්මාණය කරන ලද සුදු පොල්තෙල් ලේබලය /ස්නෝවයිට් කේයාර් රෙදි සෝදන සබන් දියර**




## 5.දිගුකාලීන ණය මුදල් පියවීම

පසුගිය වසරවල ගිණුම් වල සිට එන දීර්ඝ කාලීන ණයවලින් රුපියල් මිලියන 18ක මුදලක් ගෙවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

**2022 වසරේ ණය මුදල් පියවීම්**

| ණයහිමි | ගෙවීම් කල දිනය | ණය මුදල් පියවීම් |
|---|---|---|
| පරන්තන් | 01/ 03/ 2022 | රු. 3,612,661.00 |
| අජන්තා ඔයිල් මිල්ස් | 25/ 03/ 2022 | රු. 4,486,786.00 |
| කළුබෝවිටියාන තේ කම්හල (ප්‍රාග්ධන මුදල) | 21/ 06 / 2022 | රු. 10,000,000.00 |
| මුළු ණය ගෙවීම් | | **රු. 18,099,447.00** |

**මූලාශ්‍රය:** බී.සී.සී. ලංකා සමාගම

## 6.බීසීසී ලංකා ලිමිටඩ්හි ඉඩම මැනීම

කොළඹ 12, මීරණියා වීදියේ බීසීසී ආයතන පරිශ්‍රයට අයත් අක්කර 12 ක ඉඩමෙන් අක්කර 6 ක කොටසක අයිතිය අධිකරණ සංකීර්ණය පුළුල් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත 2019 අප්‍රේල් 11 වන දින පවරා දෙන ලදී.

ඒ අනුව, බීසීසී ගොඩනැගිලි ව්‍යාපෘතිය සහ අනෙකුත් අනාගත සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා, බීසීසී හි ඉතිරි

අක්කර 6 ක භූමි කොටස නැවත මැනීමේ කටයුතු 2022 ජූලි මාසයේදී අවසන් කරන ලදී.

## මූල්‍ය සහ භෞතික කාර්ය සාධන සංසන්දනය

**මූල්‍ය කාර්ය සාධනය**

| | 2021 ජනවාරි - සැප්තැම්බර් (රු. මි.) | 2022 ජනවාරි - සැප්තැම්බර් (රු. මි.) | වර්ධන වේගය |
|---|---|---|---|
| ශුද්ධ විකුණුම් | 373.53 | 534.33 | 43% |
| කුලී සහ වෙනත් ආදායම් | 52.46 | 74.23 | 42% |
| විකුණුම් පිරිවැය | 317.38 | 441.02 | 39% |
| දළ ලාභය | 108.61 | 167.55 | 54% |
| මූළු වියදම | 51.33 | 63.45 | 24% |
| ක්ෂය | 2.2 | 1.84 | -16% |
| ශුද්ධ ලාභය | 55.08 | 102.26 | 86% |

*මූලාශ්‍රය: බී.සී.සී. ලංකා සමාගම*

පසුගිය වසරට සාපේක්ෂව විකුණුම් ආදායම 43% කින් ඉහළ නංවමින්, පරිපාලන සහ අනෙකුත් වියදම් යම් ස්ථාවර මට්ටමක පවත්වා ගනිමින්, අදාළ කාලසීමාව සඳහා 86% ක ලාභ වර්ධනයක් අත්කර ගැනීමට බීසීසී සමාගමට හැකි විය.

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මාසික විකුණුම් අගය වෙනත් ඕනෑම කාල පරිච්ඡේදයකට වඩා වැඩි විය.

රුපියල් මිලියන 12ක් පමණ වූ ශුද්ධ ලාභයක් පවත්වා ගැනීමට බීසීසී ලංකා ලිමිටඩ් හට හැකිව ඇති අතර පෙර වර්ෂවල සාමාන්‍ය මාසික ලාභය රුපියල් මිලියන 10ක් පමණ වේ.

තවද, රුපියල් මිලියන 106.99 ක විකුණුම් වටිනාකමක් ලබා ගනිමින් 2022 මාර්තු මාසයේදී මෑතකදී ලබාගත් ඉහළම විකුණුම් අගය ලබා ගැනීමට සමාගමට හැකි විය. ඊට සමගාමීව, සමාගම එම මාසය තුළදීම රු. මිලියන 16.28 ක් වූ ඉහළ මාසික ලාභයක් ලබා ගත හැකි විය.

පසුගිය වසරවලට සාපේක්ෂව වත්මන් වසරේ වර්ධන මට්ටම

**ලාභ ඉපයීම් ප්‍රවණතාව**




*මූලාශ්‍රය: බී.සී.සී. ලංකා සමාගම*

## භෞතික කාර්ය සාධනය

2021/2022 සහ 2022/2023 ක්‍රියාකාරී සැලසුම් මගින් ස්ථාපිත කරන ලද ඉලක්ක අනුව ඉලක්ක ලඟා කර ගැනීම.

**ප්‍රගතිය ලඟා කර ගැනීම**

| | විස්තරය | භෞතික ප්‍රගතිය (මෙ.ටොන්) | | | මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) | | |
|---|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | තථ්‍ය | ඉලක්ක ලඟා කරගැනීමේ ප්‍රතිශතය | ඉලක්ක | තථ්‍ය | ඉලක්ක ලඟා කරගැනීමේ ප්‍රතිශතය |
| | ප්‍රධාන ක්‍රියාකාරකම් | | | | | | |
| I | සබන් සහ වෙනත් | 316.35 | 43.51 | 14% | 85.37 | 22.12 | 26% |
| II | පොල්තෙල් | 622.66 | 556.49 | 89% | 426.84 | 512.21 | 120% |
| | එකතුව | 939.01 | 600.00 | 63.9% | 512.21 | 534.33 | 104 % |

*මූලාශ්‍රය: බී.සී.සී. ලංකා සමාගම*

නිෂ්පාදන හා අලෙවි දත්ත වලට අනුව, පොල්තෙල් නිෂ්පාදනය හා අලෙවිය පිහිටුවා ඇති ඉලක්ක 120% ක් සපුරා ගැනීමට සමත් වී ඇත.

පොල්තෙල් අලෙවි නිෂ්පාදනය හා සසඳන විට, සබන් සහ අනෙකුත් නිෂ්පාදන අවම ඉලක්ක ලඟා කරගැනීමක් පෙන්නුම් කරයි. (ආනයන සීමා කිරීම සහ COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන්

වෙළඳපොළේ ඇති වූ අමුද්‍රව්‍ය හිඟය එයට ප්‍රධාන වශයෙන් හේතු විය.)

කෙසේ වෙතත්, සබන් නිෂ්පාදනය කාණ්ඩය එහි ඉලක්කයෙන් 40% ක් ලඟා කර ගැනීමට සමත් වී ඇති අතර එය පෙර වසරවලට සාපේක්ෂව හොඳ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

පොල්තෙල් සහ සබන් නිෂ්පාදනය යන දෙකම එක් නිෂ්පාදන ඒකකයක් ලෙස ගත් විට සමාගම, සමස්ථ ඉලක්කයෙන් 104% ක් ළඟා කර ගැනීමට සමත් වී ඇත.

**ඉලක්කගත නිෂ්පාදනය**




*මූලාශ්‍රය: බී.සී.සී. ලංකා සමාගම*

**ඉලක්කගත අලෙවිය**




*මූලාශ්‍රය: බී.සී.සී. ලංකා සමාගම*

## 20.3 අනාගත සැලැසුම් - 2023

### 1. වන්දි මුදල් ලබා ගැනීම

බීසීසී ආයතනය සතුව තිබූ ඉඩමෙන් කොටසක් අධිකරණ පරිශ්‍රයට පැවරීම වෙනුවෙන් වෙනුවෙන් ලැබිය යුතු වන්දි මුදල් ලබා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.

### 2. සමාගමේ නිෂ්පාදන කටයුතු ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රතිසංවිධානය කිරීම තුළින් බී සී සී නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

නවීන තාක්ෂණයෙන් යුතු ස්වයංක්‍රීය යන්ත්‍රෝපකරණ සමඟින් නිෂ්පාදන ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මසකට සබන් සහ සබන් ආශ්‍රිත නිෂ්පාදන ටොන් 25ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇති පූර්ණ ස්වයංක්‍රීය නිෂ්පාදන පෙළක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇත.

**යෝජිත නවීන සබන් නිමවුම් කට්ටල**



### 3.පවතින ගබඩාවන් අලුත්වැඩියා කිරීම සහ කුලියට දෙන බිම් ඉඩකඩ ප්‍රමාණයට නව වටිනාකමක් එක් කිරීම

සමාගම දැනට පවතින වෙළඳසැල් වැඩි ප්‍රමාණයක් කුලියට දී ඉහළ කුලී උපයමින් සිටී. එම ආදායම තවදුරටත් ඉහළ නැංවීම සඳහා වර්ග අඩි 85,000ක ගබඩාව නැවත සැලසුම් කර නවීනතම ගබඩා සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

තවද, යෝජිත ගබඩා සංකීර්ණය ශීත ගබඩා කාමර සහ විශාල වශයෙන් දියර ගබඩා කළ හැකි විශාල ටැංකි වලින් පොහොසත් වන අංග සම්පූර්ණ ගබඩා සංකීර්ණයක් ලෙස සැලසුම් කර ඇත.

**4.බීසීසී ගොඩනැගිලිවල වහලය මත බීසීසී හරිත බලශක්ති ව්‍යාපෘතිය නමින් නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම**

පරිශ්‍රයේ ඇති විශාල ඉඩ ප්‍රයෝජනයට ගනිමින් සූර්ය පැනල පද්ධතියක් සවි කිරීමට සැලසුම් කර ඇති අතර එමගින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය උත්පාදනය කරමින් තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් ආයතනයට නව ආදායම් මාර්ග ළඟා කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

**5.බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සහ නවීකරණය කිරීම**

බීසීසී ලංකා ලිමිටඩ් පරිශ්‍රය යනු ඓතිහාසික වටිනාකම් ඇති යන්ත්‍ර සූත්‍රවලින් සහ ඓතිහාසික උරුමයන්ගෙන් පිරි ගොඩනැගිලිවලින් සමන්විත ස්ථානයකි.

සියවස් පැරණි බීසීසී ගොඩනැඟිලි ඓතිහාසික වටිනාකමක් පවත්වා ගනිමින් මෙම බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෑතදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය සහ නිර්දේශ ලබාගෙන ඇත.

**බීසීසී මිල් බංගලාව**



**6.යකඩ බැරල් නිෂ්පාදනාගාරය ප්‍රතිසංස්කරණය**

මේ වනවිට වසා දමා ඇති යකඩ බැරල් නිෂ්පාදනාගාරය, ඒකාබද්ධ ව්‍යාපාර සහයෝගීතාවයෙන් නැවත ආරම්භ කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම වෙනුවෙන් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් හට ආරාධනා කරමින් පුවත්පත් දැන්වීම් පළකිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය යෝජනා කර ඇත.

**7.යෝජිත බහුකාර්ය වාණිජ ගොඩනැගිල්ල ගොඩනැගීම**

බීසීසී ලංකා ලිමිටඩ් පරිශ්‍රයේ අක්කර 1.7 ක භූමි භාගයක බහුකාර්ය වාණිජ ගොඩනැඟිලි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

මහල් 20 ක ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) අනුමැතිය ලබා ගැනීමට සමාගමට හැකි විය.

ව්‍යාපෘතිය රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

ඒ අනුව, මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී, බීසීසී ලංකා ලිමිටඩ් ආයතනය ඉඩමෙන් දායක වන අතර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පිරිවැය පුද්ගලික අංශයේ ව්‍යාපාරික හවුල්කරුවකු හරහා ලබා ගැනීමට අපේක්ෂිතය.

ඒ අනුව, පහත ක්‍රම මගින් මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාරික හවුල්කරුවකු සොයා ගැනීමට අපේක්ෂා කර ඇත,

- ජාත්‍යන්තර ටෙන්ඩර් හරහා දේශීය සහ ජාත්‍යන්තර ආයෝජකයින් සඳහා උනන්දුව ප්‍රකාශ කිරීම සඳහා ආරාධනා කිරීම
- ආයෝජක සංසද
- විදේශ තානාපති කාර්යාල
- ආයෝජන මණ්ඩලය

# 21

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)

## 21.1 හැඳින්වීම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ඇත.

ඉන්පසුව 1957 අංක 49 දරණ කාර්මික සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01 වන දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නම් කර ඇත. 1980 වර්ෂයේ පලකරන ලද අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් එහි නම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වශයෙන් සංශෝධනය කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පැවති පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාවේ සහ රුහුණු සිමෙන්ති කර්මාන්ත ශාලාව ජනතාකරණය කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව දැනට පවතිනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව පමණක් වන අතර එම ප්‍රදේශයේ පැවති යුදමය වාතාවරණය මත 1990 ජුනි මාසයේ සිට එම කර්මාතශාලාවේ කටයුතු නවතා දමා ඇත.

### දැක්ම

ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශන සහ නායකත්වය ලබා දීම.

### මෙහෙවර

උසස් තත්වයෙන් යුතු සිමෙන්ති සහ අනෙකුත් සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් රටෙහි පවතින අවශ්‍යතාවයට ප්‍රමාණවත් වන පරිදි සැපයීම සහතික කිරීම.

### වර්තමාන තත්ත්වය

2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සංස්ථාවේ සේවයේ යෙදී සිටි සේවකයින් සඳහා ස්වේච්ඡ විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇති අතර දැනට සේවයේ දී සිටින්නේ සේවකයින් 13 දෙනෙකු පමණි. සංස්ථාව සතුව පවතින ක්ලින්කර් නිධි සහිත ඉඩම් බදු පදනම මත ලබා දීම මඟින් උපයන ආදායමෙන් සේවක වැටුප් ගෙවා සංස්ථාවේ කටයුතු පවත්වා ගෙන යන ලෙස මහා භාණ්ඩාගාරය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව සංස්ථාව සතුව පවතින පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි අරුවක්කාලු හුණු ගල් නිධිය සහිත ඉඩම බදු පදනම මත ලබා දීම මඟින් ලැබෙන ආදායමෙන් සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාම සිදු කරයි.

## 21.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස 30 දිනට)

| වර්ෂය | 2022.09.30 දක්වා (රු.මි) |
|---|---|
| වත්කම් කළමනාකරණයෙන් ලැබෙන ආදායම (බදු හා කුලියට) | 51.44 |
| දළ ලාභය/අලාභය | 51.44 |
| වෙනත් ආදායම් | 14.23 |
| **වියදම්** | 21.65 |
| බදු පෙර ලාභය /(අලාභය) | 44.03 |
| ආදායම් බදු | 12.30 |
| ශුද්ධ ලාභය/(අලාභය) | 31.73 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව*

ඉඩම් සහ අනෙකුත් වත්කම් තුලින් උපයන ලද වෙනත් ආදායම් ඇතුලුව මුලු ආදායම රු.මිලියන 65.68කි. මෙම වර්ෂය තුල ප්‍රකාශිත බදු පෙර ලාභය රු.මිලියන 44.03ක් වන අතර එය රු.මිලියන 12.10 කින්අයවැයගත බදු පෙර ලාභය ඉක්මවීමක් වේ.

### මෙහෙයුම් කාර්යසාධනය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ සිමෙන්ති කම්හල සම්බන්ධයෙන් 2021.01.19 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කොට 2021.02.08 දිනැති අංක 21/0175/320/004 අමාත්‍ය මණ්ඩල තීරණය ලබා ගෙන ඇත. එමඟින් කර්මාන්තශාලා භූමිය තුල පවතින ප්‍රයෝජනයට ගත නොහැකි ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, අබලි යකඩ ඇතුළු අනෙකුත් අබලි ලෝහ ටෙන්ඩර් ක්‍රමවේදයක් මඟින් ඉවත් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ඉහත ටෙන්ඩර් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරු තිදෙනෙකුගෙන් යුත් ටෙන්ඩර් කමිටුවක් හා එකී ටෙන්ඩර් කමිටුවට සහාය වීම පිණිස හත්දෙනෙකුගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කොට ඇත.

## 21.3 අනාගත සැලසුම් - 2023

- 2021.02.08 දිනැති අංක 21/0175/320/004 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලා පරිශ්‍රයේ පවතින ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය ටෙන්ඩර් ක්‍රමවේදය මඟින් ඉවත් කිරීම.
- කන්කසන්තුරේ සිමෙන්ති කම්හල පිහිටි ඉඩම සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු අයිතිය තහවුරු කර ගැනීම.
- කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාවෙහි සිමෙන්ති නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ ආරම්භ කිරීමට යෝජනා කැඳවීම.

# 22

# සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම (LAL)

## 22.1 හැඳින්වීම

සී/ ස ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම 1982 වසරේ දී ශ්‍රී ලංකා රජය හා ඉන්දියානු අශෝක් ලේලන්ඩ් සමාගම සමඟ ඇති කර ගන්නා ලද ගිවිසුම අනුව ආරම්භ කරන ලද බද්ධ ව්‍යාපාරයකි.

එම සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනයෙන් 41.77% ක පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් වන ලංකා ලේලන්ඩ් සමාගම සතු වන අතර, 27.85% ක කොටස් ප්‍රමාණයක් ඉන්දීය අශෝක් ලේලන්ඩ් සමාගම සතු වෙයි. ඉතිරි කොටස් 72.15 % ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ජනතාව සතු වේ. මෙම සමාගම 1983 වසරේ දී කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගමක් වශයෙන් ස්ථාපිත කර ඇත.

### ලංකා අශෝක් ලේලන්ඩ් පොදු සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

- වාණිජ වාහන අමතර කොටස් හා විදුලි ජනක යන්ත්‍ර ආනයනය කිරීම සහ අලෙවි කිරීම.
- වාණිජ වාහන දේශීය වශයෙන් එකලස් කිරීම.
- ට්‍රක් රථ සඳහා බවුසර්, බහාලුම් සහ අනෙකුත් වානේ සහ ඇලුමිනියම් බඳ සැකසීම.
- අලින් ප්‍රවාහනය කරන ට්‍රක්රථ, තට්ටු දෙකේ සංචාරක බස්රථ, කැරවෑන්, රේල් බස් වැනි විශේෂ ප්‍රවාහන මාධ්‍යයන් සැපයීම.
- පරණ හා අනතුරුවලට ලක් වූ වාහන අලුත් වැඩියා කිරීම.
- අශෝක් ලේලන්ඩ් වාහන සඳහා වාර්ෂික නඩත්තු කොන්ත්‍රාත් සැපයීම.
- රජයේ හා තෝරාගත් පෞද්ගලික ආයතන සඳහා (ඉපයූ පසු ගෙවීමේ එකගතාව මත) කුලී පදනම අනුව වාහන සැපයීම.
- සමාගම සතුව නවීනතම පහසුකම්වලින් සමන්විත කර්මාන්තශාලාවක් පනාගොඩ ප්‍රදේශයේ පිහිටා ඇති අතර, අලෙවි කාර්යාලය කොළඹ පිහිටා තිබේ.

එමෙන්ම අලෙවිය, සේවා සැපයීම සහ අමතර කොටස් අලෙවිය යන ක්‍රියාකාරකම් ත්‍රිත්වයෙන්ම සමන්විත මධ්‍යස්ථාන දිවයින පුරා අනුරාධපුර, දඹුල්ල, ඇඹිලිපිටිය, යාපනය සහ මහනුවර යන ප්‍රදේශවල පිහිටා

තිබේ. අමතර කොටස් අලෙවිසැල්ද, දිවයින පුරා පිහිටා තිබේ.

පාරිභෝගික අවශ්‍යතා සපුරන, බලයලත් සේවා සැපයුම් මධ්‍යස්ථාන විස්සකට අධික සංඛ්‍යාවක් සමාගම සතුව පවතී.

## 22.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

රු.මි.

| විස්තර | 2021/22 | 2020/21 |
|---|---|---|
| ආදායම | 6,860.96 | 2273.11 |
| දළ ලාභය සහ වෙනත් ආදායම් | 1,181.74 | 676.92 |
| පොදු කාර්ය සහ මූල්‍ය පිරිවැය | (733.09) | (657.83) |
| බදු වලට පෙර ලාභය | 448.65 | 19.09 |
| ආදායම් බදු | (105.67) | (14.57) |
| බදු ගෙවීමෙන් පසු ලාභය | 342.98 | 4.52 |

*මූලාශ්‍රය: අශෝක් ලේලන්ඩ් සමාගම*

- කොවිඩ් වසංගතයෙන් පසු නැවත ආර්ථික ක්‍රියාකාරකම් ආරම්භ කිරීමත් සමඟ සමාගමේ අදායම පසුගිය වසරට සාපේක්ෂව 200%ක් පමණ වර්ධනය වී ඇත. කෙසේ වෙතත් දැඩිලෙස රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිපලයක් ලෙස සමාගමට වසර තුල රු.මි 738.94ක විනිමය පාඩුවක් සිදු විය.

- දැඩි කාරක ප්‍රාග්ධනය කළමනාකරණය සහ සමස්ත පොදු කාර්ය පිරිවැය කළමනාකරණය කිරීමේ ප්‍රතිපලයක් ලෙස පසුගිය වසරට සාපේක්ෂව පොලී හා සමස්ත පොදුකාර්ය හා මූල්‍ය පිරිවැය වැඩිවීම 12% කින් පමණ පාලනය කිරීමට සමාගමට හැකි වූ අතර අදායම 200%කින් වැඩි විය.

- වර්ෂය තුල සමගම විසින් රුපියල් මිලියන 342.98ක ලාභයක් උපයා ගෙන ඇත.

## 22.3 අනාගත සැලැසුම් - 2023

| | |
|---|---|
| **1: බස් රථ දේශීය වශයෙන් එකලස් කිරීම යලි ඇරඹීම** | |
| උපායමාර්ග | |
| 1.1 | දේශීයව එකලස් කිරීම සඳහා අර්ධ වශයෙන් සකස් කරන ලද (Semi Knocked Down) බස් වැසි ආනයනය කිරීම. |
| 1.2 | ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ නිෂ්පාදන සඳහා අනුබද්ධ මධ්‍යස්ථාන පිහිටුවීම. |
| 1.3 | ශ්‍රී ලංකාව තුළ එකලස් කරන වාහන සඳහා අපනයන අවස්ථා පිළිබඳ සොයා බැලීම. |
| 1.4 | විශාල ශ්‍රම බලකායක් සඳහා අතිරේක හා අඛණ්ඩ රැකියා අවස්ථා උදාකරලීම. |
| **2: දේශීය අගය කිරීම් අදියර වශයෙන් වර්ධනය කිරීම.** | |
| උපායමාර්ග | |
| 2.1 | දේශීය අගය එකතුකිරීම් හා ශ්‍රම බලකාය යොදා ගනිමින් රටට වටිනා විනිමය ප්‍රමාණයක් ඉතිරි කිරීම. |
| 2.2 | ආනයන/ විදේශ සැපයුම් මත යැපීම අවම කිරීම. |
| **3: නිෂ්පාදන මාදිලි වැඩි කිරීම සහ ට්‍රක් රථ බඳ එකලස් කිරීම් ධාරිතාවය වැඩි කිරීම.** | |
| උපායමාර්ග | |
| 3.1 | ට්‍රක් බඳ නිෂ්පාදන ධාරිතාව මසකට 50 සිට 100 දක්වා වැඩි කිරීම මගින් ආදායම වැඩි කිරීම. |
| 3.2 | මලනොබැදෙන බවුසර්, අධිශීත කන්ටේනර්, ගලිබවුසර්, ටේලර් ආදි විශේෂ කාර්ය වාහන නිෂ්පාදන පෙළට එක් කිරීම. |
| 3.3 | දේශීය මෙහෙයුම් සඳහා හොඳම දේශීය තාක්ෂණය සංවර්ධනය කිරීම. |
| **4: දීප ව්‍යාප්ත ජාලය තවදුරටත් පුළුල් කිරීම** | |
| උපාය මාර්ග | |
| 4.1 | ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ දීප ව්‍යාප්ත ජාලය විශේෂයෙන් නැගෙනහිර, ඌව, දකුණු පළාත හා උතුරු මැද පළාත තුළ තවදුරටත් පුළුල් කිරීම. |
| 4.2 | අනාගතයේ දී විවෘත කිරීමට නියමිත ශාඛාවන්හි දේශීය උගත් තරුණ පිරිසට රැකියා අවස්ථා උදාකර දීම. |

# 23

# ලංකා ලේලන්ඩ් සමාගම (LLL)

## 23.1. හැඳින්වීම

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) ලිමිටඩ් (සමාගම) යනු 1938 අංක 51 දරන සමාගම් ආඥාපනත යටතේ සංස්ථාපිත කර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සම්පූර්ණයෙන්ම රජය සතු සීමිත වගකීම් සමාගමකි.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම, ඉන්දියානු අශෝක් ලේලන්ඩ් සමාගම සමඟ අත්වැල් බැඳ ගත් අතර සමාගමේ කොටස් වලින් 47 % ක් ලංකා ලේලන්ඩ් සමාගම සතු වන අතර, 41.77 % ක් ඉන්දීය අශෝක් ලේලන්ඩ් සමාගම සතු වෙයි. ඉතිරි 27.5 % කොටස් ප්‍රමාණය ඒකාබද්ධ ව්‍යාපාර ගිවිසුමට අනුව ශ්‍රී ලාංකීය ජනතාව සතු වෙයි.

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම හි ප්‍රධාන පරමාර්ථය වන්නේ අවශ්‍ය උපාංග නිෂ්පාදනය කිරීමයි. එමෙන්ම ලංකා ලේලන්ඩ් පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකාව තුල තාක්ෂණික හුවමාරුව දිරිගැන්විය යුතුයි.

### ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම හි ප්‍රධාන ක්‍රියාකාරකම්

- ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමෙහි වාහන එකලස් කිරීම සඳහා දේශීය උපාංග නිෂ්පාදනය අධීක්ෂණය කිරීම සහ පෙළඹවීම.
- භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය.

**ලංකා ලේලන්ඩ් ආයතනය තුල වාහන එකලස් කිරීම**





# 24

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

## 24.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමග සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

### දැක්ම

දේශීය අනන්‍යතාවය සහ සංස්කෘතියට උචිත පරිදි මෙන්ම දේශීය හා විදේශීය වෙළඳපොල ක්‍රියාකාරීත්වය ජය ගත හැකි පරිදි අත්‍යන්ත්‍ර පේෂකර්ම ක්ෂේත්‍රයෙහි නිර්මාණශීලි සහ තරගකාරී රෙදිපිළි නිෂ්පාදනය සඳහා නිෂ්පාදකයින් යොමු කිරීම.

### මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම. එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම අවශ්‍ය සේවා හා පහසුකම් සැපයීම සහ මෙහෙයවීම හා සම්බන්ධීකරණය තුළින් අත්‍යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම.

### අරමුණු

1) අත්‍යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම .

2) නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම .

- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- මෝස්තර සම්පාදන වැඩසටහන්
- පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
- පේෂකර්මාන්ත විෂය ආශ්‍රිත පුහුණු කිරීමේ වැඩසටහන්
- පේෂ පාසැල් සිසු සිසුවියන්ගේ පෞර්ෂත්ව වර්ධනය කිරීමේ නායකත්ව පුහුණු වැඩමුළු තුළින් අනාගතයේ සාර්ථක ව්‍යවසායකයින් බිහි කිරීම.

3) අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම.

4) ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම.

5) අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)

6) අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම.

7) අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම.

8) ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම.

9) අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු

10) නව තාක්ෂණය හදුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

ඉහත කාර්යයන් අරමුණු කරගත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ දැක්මක් සහ ජාතික මෙහෙවරක් සංගෘහිත වේ.

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ .

- පර්යේෂණ, පුහුණු ,මෝස්තර හා සේවා ආයතනය කටුබැද්ද 01-
- පේෂකර්මාන්ත කෞතුකාගාරය හා මෝස්තර බැංකුව, කටුබැද්ද 01-
- පේෂකර්මාන්ත පුහුණු පාසැල් 1-4
- මෝස්තර පුහුණු පාසැල් 0-2
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති ආයතන -03

පරිපාලන කටයුතු පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයාලය මගින් සිදුවන අතර ඒහි අංශ කිහිපයක් ඇත. පාලන අංශය, ගිණුම් අංශය පුහුණු හා සංවර්ධන අංශය වශයෙනි.

## 24.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

| අනු අංකය | වැඩසටහන | වෙන්කිරීම (රු.මි) | ඉලක්ක | | ප්‍රගතිය | | කාර්යය සාධන දර්ශක | යෙදවුම් | නිමවුම් | ලගා වීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | | | | |
| 1 | පේෂපාසැල් පරිපාලනය | 5.5 | 60% | 100% | 50% | 100% | පේෂපාසැල් 16 සිසු සිසුවියන් 200 යි | පුහුණු සිසුන් 200 | අළුත් පිරිස් ඇතුළත් කර ගැනීම | 50% |
| 2 | සේවාස්ථ පුහුණු | 3.0 | 60% | 60% | 60% | 65% | පාඨමාලා 11 පැවැත්වීම | සාර්ථකව පාඨමාලා පැවත්වීම | මෝස්තර නිර්මාණ හඳුන්වාදීම | 60% |
| 3 | අලෙවි සල්පිළ | 23.5 | 50% | 20% | 25% | 1% | ව්‍යවසායකයන් හදුනාගැනීම | අලෙවි කුටි 80 ක් ලබාදීම | නව නිර්මාණ තුළින් අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | 25% |
| 4 | අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන ක්‍රියාකාරකම් | 31.5 | 60% | 30% | 60% | 21% | අත්යන්ත්‍ර ව්‍යාපෘති 10 ක් ආරම්භ කිරීම මේ යටතේ කාර්මිකයින් 150 පුහුණු කිරීම | ග්‍රාමීය මට්ටමේ කර්මාන්තය දියුණු කිරීම | අත්යන්ත්‍ර පේෂකර්මාන්තය බලගැන්වීම | 60% |
| 5 | විභාග | 0.5 | 100% | 100% | 100% | 100% | විභාග දෙකක් පැවැත්වීම | අත්යන්ත්‍ර පේෂකර්ම අවසන් විභාගය හා උසස් මෝස්තර විභාගය පැවැත්වීම | කුසලතා සංවර්ධනය කිරීම | 100 % |
| 6 | නවෝත්පාදන | 1.0 | 50% | 25% | 20% | - | අත්යන්ත්‍ර උපාංග 03 ක් නවීකරණය කිරීම | නවීකරණය කරන ලද අත්යන්ත්‍ර | සුමට අයුරින් කර්මාන්තය පවත්වාගෙනයාම | 20% |
| 7 | ගොඩනැගිලි අළුත්වැඩියාවන් | 5.0 | 60% | 25% | 20% | - | ගොඩනැගිලි 03 ක් අළුත්වැඩියා කිරීම | පහසුකම් වර්ධනය කිරීම | පාඨමාලා සංවර්ධනය කිරීම | 20% |

*මූලාශ්‍රය: පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව*

## 24.3 අනාගත සැලැසුම් - 2023

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීය පාසල් ගොඩනැගිලි වල අලුත්වැඩියාවන් හා සිදුකල යුතු වැඩිදියුණු කිරීම් සිදු කිරීම.

### අත්යන්ත්‍ර ක්ෂේත්‍රය සඳහා පුහුණුව හා හැකියා වර්ධනය

- පේෂකර්මාන්තය පිළිබද පුහුණු පාසැල් 14 ක් සහ මෝස්තර නිර්මාණය පිළිබද පුහුණු පාසැල් 02 ක් සඳහා සිසුන් පිළිවෙලින් 200 ක් සහ 30 ක් බැගින් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.
- දේශීය හා විදේශීය වෙළඳ පොළ වර්දනය සහ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ හැකියාවන් ඔප් නැංවීම, දිරි ගැන්වීම සහ ඔවුන්ගේ කුසලතා අගය කිරීම සඳහා ජාතික ප්‍රදර්ශනය සහ සම්මාන උළෙල පැවැත්වීම.

### සේවාස්ථ පුහුණු වැඩසටහන් පැවැත්වීම

- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල නිලධාරීන්, පේෂ පාසැල්වල නිලධාරීන් මෙන්ම පළාත් රාජ්‍ය, සමුපකාර හා පෞද්ලික අංශයේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන් හා නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය වන කෙටිකාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු, ආදිය පැවැත්වීම.

### පේෂකර්මාන්ත සංවර්ධන ක්‍රියාකාරකම්

1. අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ව්‍යාපෘති 10ක් ආරම්භ කිරීම.
2. අත්යන්ත්‍ර නව නිපැයුම් වැඩසටහන පැවැත්වීම.

### පේෂකර්මාන්ත ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

1. පේෂ කර්මාන්ත ප්‍රදර්ශනය, අලෙවි සල්පිළ හා සම්මාන ප්‍රදානෝත්සවය 2023 වසර සඳහා පැවැත්වීම.
2. අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිලක් පැවැත්වීම.

# 25

# ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA)

## 25.1 හැඳින්වීම

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA), 2009 අංක 12 දරන පනත යටතේ වර්ෂ 2009 දී ස්ථාපිත කරනු ලැබූ අතර,එම ආයතනය වර්ෂ 2009 ජූනි 15 වැනි දිනසිට ස්වකීය කටයුතු ආරම්භ කර ඇති ආයතනයකි. මෙම ආයතනයේ පරීක්ෂණ රසායනාගාරය, පරීක්ෂණ සඳහා ISO 17025 සහතිකයෙන් පිදුම් ලැබ තිබේ. පේෂකර්ම අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානය (TT & SC) හා රෙදිපිළි කර්මාන්ත පුහුණු ආයතනය (CITI) ඒකාබද්ධ කිරීම මගින් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය ස්ථාපිත කිරීමට ගනු ලැබූ උපාය මාර්ගික තීරණය මගින් කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සඳහා පවතින මානව සම්පත්, උපකරණ හා ඉඩකඩ ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම සහතික කරනු ලබයි.

### දැක්ම

පේෂකර්ම, ඇඟලුම් හා සම්භාණ්ඩ නිෂපාදනයන්හි කර්මාන්ත අංශ සඳහා කාර්ය මණ්ඩල කාර්යක්ෂමතාව ඇති කිරීම සහ උපදේශක සේවා, පරීක්ෂණ, පර්යේෂණ හා සංවර්ධන සහ නවෝත්පාදන සැපයීම පිණිස ගෝලීය වශයෙන් පිළිගත් මධ්‍යස්ථානයක් පවට පත්වීම.

### මෙහෙවර

තිරසාර සංවර්ධනයක් අපේක්ෂා කරමින්, රෙදිපිළි, සම්භාණ්ඩ නිෂ්පාදන, පේෂකර්ම ආශ්‍රිත කර්මාන්තයන්හි ඵලදායිතාව, භාණ්ඩ හා සේවාවන්හි ගුණාත්මකභාවය හා ආයතනික වටිනාකම නැංවීම උදෙසා ප්‍රවීණ, මනා ලෙස පුහුණු කරන ලද මානව ප්‍රාග්ධනය, විශ්වාසනීය විශේෂඥතාව හා නවෝත්පාදක විසඳුම් සැපයීම.

### පරමාර්ථ

පනතට අනුව, පහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂයෙන් ශ්‍රී ලංකාවේ පේෂකර්ම හා ඇඟලුම් අංශය උදෙසා සේවය සලසනු වස්, පේෂකර්ම හා ඇඟලුම් ආයතනය වගකීමෙන් යුක්තව ක්‍රියා කරනු ඇත.

- ජේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය උදෙසා විශේෂඥ ඥානය සැපයීම.
- උද්ගත වෙමින් පවතින තාක්ෂණික සංවර්ධනයන් සාක්ෂාත් කරගැනීම උදෙසා ජේෂකර්ම හා ඇඟලුම් අංශය පාදකකොටගත් දැනුම ඉහළ නැංවීම.
- දේශීය හා විදේශීය ජේෂකර්ම හා ඇඟලුම් නිපැයීම් උදෙසා උපදේශකත්වය හා තාක්ෂණික සේවා සැපයීමෙහිලා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කිරීම.
- ගෘහස්ථ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය උදෙසා තාක්ෂණික විශේෂඥ දැනුම සැපයීම.
- ජේෂකර්ම, ඇඟලුම්, හස්ත කර්මාන්ත හා පාවහන් නිෂ්පාදනයන්හි නිරත ග්‍රාමීය අංශයේ සුළු පරිමාණ ව්‍යවසායකයින් උදෙසා තාක්ෂණික සහය සැපයීමෙහිලා බහු සේවා ප්‍රවේශයක් හඳුන්වා දීම.
- ප්‍රමුඛ පෙළේ පුහුණු සැපයුම්කරුවෙකු වශයෙන් තව දුරටත් කටයුතු කිරීම. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) පිළිබඳ ප්‍රමිතීන් සපුරා ගැනීම උදෙසා ඩිප්ලෝමා /උපාධි වැඩසටහන් පැවැත්වීම මගින් තෘතියික මට්ටම සඳහා ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය ස්වකීය සේවා ඉහළ නංවයි.
- පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

ඉහත පරමාර්ථ වලින් යුක්තව, ජේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය සඳහා ප්‍රමුඛතම සේවා සපයන්නෙකු වශයෙන් ස්වකීය සේවාවන් අඛණ්ඩව සිදුකරගෙන යාම වේගවත් කිරීමට හා දිගුකාලීනව ආර්ථික වශයෙන් ස්ථායි සංවිධානයක් බවට පත්වීමට ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය අපේක්ෂා කරයි.

## 25.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

### මූල්‍ය කාර්යසාධනය (රු. මි.)

| විස්තරය | 2022 (රු. මි.) |
|---|---|
| පරීක්ෂණ | 39.61 |
| පුහුණු | 56.89 |
| උපදේශකත්වය | 3.33 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය

### භෞතික කාර්ය සාධනය

| විස්තරය | 2022 සැප් 30 වැනි දිනට |
|---|---|
| පරීක්ෂණ සංඛ්‍යාව | 23584 |
| අභ්‍යාසලාභීන් සංඛ්‍යාව | 1800 |
| පුහුණු පාඨමාලා සංඛ්‍යාව | 110 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය

### මුළු මෙහෙයුම් ආදායම

| විස්තරය | 2022 (රු. මි.) |
|---|---|
| වෙනත් | 37.68 |
| මුළු මෙහෙයුම් ආදායම | 137.52 |
| මුළු මෙහෙයුම් වියදම | 125.71 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුළු අතිරික්තය/ඌනතාව | 11.81 |
| විලම්බිත ආදායම | 14.22 |
| කාලපරිච්ඡේදය සඳහා වූ මුළු අතිරික්තතය /ඌනතාව | 26.03 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය

**ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**වර්ෂ 2022 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා**

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ වටිනාකම රු. මි. |
|---|---|
| නව තාක්ෂණ භුවමාරු කටයුතු සම්පාදනයකොට ස්ථාපිත කිරීම සහ පුහුණු කාර්යයන් සඳහා පවතින පන්ති කාමර පහසුකම් වැඩිදියුණු කිරීම - 2021( අඛණ්ඩ ව්‍යාපෘතිය) | 48.82 |
| ග්‍රාමීය තරුණ ප්‍රජාව බලගැන්වීම තුළින් ශ්‍රී ලංකා ඇඟලුම් කර්මාන්තය සඳහා ඵලදායී බහු නිපුණතා කාර්ය සාධක බලකායක් ඇති කිරීම - 2021 (අඛණ්ඩ ව්‍යාපෘතිය) | 8 |
| ඵලදායිතාව නැංවීමේ වැඩසටහන - 2021 (අඛණ්ඩ ව්‍යාපෘතිය) | 7 |
| බතික් මධ්‍යස්ථාන 160ක් ස්ථාපිත කිරීම - පළමු අදියර - 2021- (අඛණ්ඩ ව්‍යාපෘතිය) | 69.01 |
| බතික් මධ්‍යස්ථාන 160ක් ස්ථාපිත කිරීම - දෙවන අදියර - 2021 - (අඛණ්ඩ ව්‍යාපෘතිය) | 25.9 |
| රෙදිපිළි හා ඇඟලුම් අංශය සංවර්ධනය කිරීම පිණිස පන්ති කාමර ධාරිතාව සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම - 2022 | 33 |
| මානව සම්පත් පහසුකම් සංවර්ධනය - 2022 | 1 |
| සම්භාණ්ඩ සහ පාවහන් අංශයේ ධාරිතා සංවර්ධනය - 2022 | 1 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය*

## 25.3 අනාගත සැලැසුම් - 2023

- සියලු අංශයන්ගෙන් සමන්විත උපාධි පිරිනැමීමේ ආයතනය- උපාධිධාරීන්/ විශේෂඥ දැනුමැති පුද්ගලයන් බිහිකිරීම.
- බංගලාදේශය, වියට්නාමය හා ඉතියෝපියාව යන රටවල මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- ක්ෂණික ප්‍රතිචාර දැක්වීම පිණිස සහ පුහුණු මධ්‍යස්ථාන වශයෙන් නිදහස් වෙළඳ කලාපය තුළ ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය විමධ්‍යගත කිරීම.
- ඉන්දියාව, බංගලාදේශය , වියට්නාමය සහ බටහිර රටවල පිහිටි නියාමන ආයතන සමඟ සමීප සබඳතා ගොඩනැගීම.
- අන්තර්ජාතික වශයෙන් පිළිගැනීම ලබාගනු වස්, පරීක්ෂණාගාර ක්‍රියාකාරකම් පුළුල් කිරීම.
- පහත සඳහන් ආයතනවලින් මූල්‍ය හා තාක්ෂණික සහයෝගීතාව ලබා ගැනීම.
  - JICA
  - KOICA
  - ADB (ආසියානු සංවර්ධන බැංකුව)- වෙනත් කවර හෝ අරමුදල් ප්‍රභව
- විද්‍යුත් ඉගෙනුම් (E- Learning) පහසුකම් ක්‍රියාත්මක කිරීම.

# 26

# ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)

## 26.1 හැඳින්වීම

ජාතික මෝස්තර මධ්‍යස්ථානය 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා හා අනුබද්ධ ආයතන පනත යටතේ 1983 වර්ෂයේදී ආරම්භ කරන ලද, මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දේශිය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නංවාලීම තුළින් ශිල්පීන්ගේ අභිවෘද්ධිය මූලික අරමුණ කරගත් ව්‍යවස්ථාපිත ආයතනයකි.

### දැක්ම

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය වඩාත් සක්‍රිය ආර්ථික ක්ෂේත්‍රයක් බවට පත් කිරීම.

### මෙහෙවර

ප්‍රවර්ධනය, සංවර්ධනය, හැකියාවන් ගොඩනැංවීම, ප්‍රචලිත කිරීම සහ ප්‍රධාන ප්‍රවාහයට අනුගත කිරීම තුළින් ගෝලීය සහ දේශීය වෙළෙඳපොළ ප්‍රවණතාවලට අනුකූලව වෙළෙඳපොළ පාදක කරගත් නිර්මාණාත්මක මෝස්තර හඳුන්වා දීම.

### ප්‍රධාන වගකීම් ක්ෂේත්‍රය

හස්ත කර්මාන්ත පෝෂණය කිරීම, සංරක්ෂණය කිරීම හා සංවර්ධනය කිරීම.

### ප්‍රධාන අභිමතාර්ථ

- හස්ත කර්මාන්ත ශිල්පීන් විසින් දැනට නිෂ්පාදනය කරනු ලබන අත්කම් භාණ්ඩ සංවර්ධනය කිරීම සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපළෙහි වර්තමාන සහ අනාගත වෙළඳපළ නැඹියාවන්ට අනුව නව නිර්මාණ හඳුන්වා දීම .

- සුදුසු තාක්ෂණය හඳුන්වාදීම සහ තත්ත්ව ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණික ආයතන සමඟ පර්යේෂණ වැඩසටහන් පැවත්වීම සහ ගුණාත්මක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා නිසි තාක්ෂණික හා අමුද්‍රව්‍ය සැකසීමේ ක්‍රම හඳුන්වාදීම .

- ආදායම් වැඩිකර ගැනීම තුළින් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩාත් යහපත් වර්ධනයක් අරමුණු කරගෙන

ශිල්පීන්ට උසස් ශිල්පීය, තාක්ෂණික හා මෝස්තර සංවර්ධන පුහුණු සහාය ලබාදීම.

- හස්ත කර්මාන්ත ශිල්පීන්ට, කුඩා පරිමාණ ව්‍යාවසායකයින්ට සහ මහජනතාවට අවශ්‍ය දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, නව තාක්ෂණික ක්‍රම භාවිතා කිරීමට පහසුකම් සැලසීම සහ පොදු

- හස්ත කර්මාන්ත නිර්මාණ සඳහා වඩාත් කාර්යක්ෂම, නව්‍ය නිෂ්පාදන ක්‍රමවේද හඳුන්වාදීම.

- නව නිර්මාණාත්මක හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳපොළ වැඩිදියුණු කිරීම.

- රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතන වල ඉල්ලීම් වලට අනුව මෝස්තර උපදේශක සේවාවන් ලබාදීම.

- වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් හා පුහුණු කිරීම් හරහා මෝස්තර නිර්මාණාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම.

## 26.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

ජාතික මෝස්තර මධ්‍යස්ථානයට රු.මිලියන 40ක ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කොට තිබෙන අතර ඉන් රුපියල් මිලියන 8.1 ක් 2022 සැප්තැම්බර් මස 30 වන දින වන විට මුදා හැර ඇත. රුපියල් මිලියන 8.1 න් රුපියල් මිලියන 6.326 ක වටිනාකමින් යුතු සංවර්ධන කාර්ය භාරයන් සම්පූර්ණ කොට ඇත. මෙම වසර අවසානය වන විට නවමු සංකල්පයක් ඔස්සේ නව මෝස්තර නිර්මාණය හා වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර ඒහි අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් සිටිමු.

ක්‍රියාකාරී සැලැස්මට අමතරව, ශ්‍රී ලංකා දකුණු ආසියානු හවුල්කාරිත්වය (South Asia Partnership Sri Lanka) සමග ඒකාබද්ධව අප විසින් ගුරු ශිල්පීන් (TOT) සඳහා සාම්ප්‍රදායික හස්තර්මාන්ත සඳහා අගය වැඩිකිරීමේ ව්‍යාපෘතියක් ද සිදු කොට ඇති අතර, වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) සමග ඒකාබද්ධව රෙදි හැඩ ගැන්වීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක්ද පවත්වා ඇත.

**ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ පැවති රෙදි හැඩගැන්වීම පිලිබඳ පුහුණු වැඩසටහන**



(*මූලාශ්‍රය*: ජාතික මෝස්තර මධ්‍යස්ථානය)



ඒ මෙන්ම, රටපුරා විහිදී පැතිරී සිටින අත්කම් නිර්මාණ ශිල්පීන්ගේ පුහුණු අවශ්‍යතාවයන් කෙරෙහි යොමු වෙමින් ජාතික රූපවාහිනියේ (නුගසෙවණ වැඩසටහන) සහාය ඇතිව අප විසින් රූපවාහිනි වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර රට තුළ පවත්නා ඉන්ධන අර්බුදය සහ වර්තමාන අහිතකර ආර්ථික තත්ත්වය හේතු කොට ගෙන මෙය ඔවුන්ට ස්වර්ණමය අවස්ථාවක් විය.

පාසල් ක්ෂේත්‍රය සඳහා අත්කම් සහ කලාව හඳුන්වා දීමේ අරමුණ සහිතව අප විසින් චිත්‍ර තරගයක් පවත්වන ලද අතර, ළමා දිනය ඉලක්ක කර ගනිමින් එහි ත්‍යාග ප්‍රදානෝත්සවයක් පවත්වන ලදී.

**කාර්යසාධනය (2022 සැප්තැම්බර් 30 වන දිනට ප්‍රගතිය)**

| ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මිලියන) | වියදම (රු.මිලියන) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| නව මෝස්තර සහ නව තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීම | 8.65 | 1.246 | 26% |
| මෝස්තර සංවර්ධනය, දැනුම යාවත්කාලීන කිරීම සහ කුසලතා සංවර්ධනය | 1.920 | 0.322 | 35% |
| පර්යේෂණ සහ සංවර්ධනය | 0.55 | 0.073 | 60% |
| නව තාක්ෂණය , නව ක්‍රියාවලි සහ ද්‍රව්‍යමය නවෝත්පාදන හඳුන්වා දීම | 2.065 | 0.055 | 65% |
| දේශීය වෙළෙඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් සහ නව නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම | 1.00 | 0.257 | 50% |
| මෝස්තර උපදේශන සේවා | බාහිර ප්‍රතිපාදන | | 45% |
| අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා හැකියා වර්ධන වැඩසටහන් | 0.472 | 0.146 | 55% |
| මෝස්තර නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම | 0.55 | - | - |

## 26.3 අනාගත සැලැසුම් - 2023

### 1- නිෂ්පාදනය

මෝස්තර නිර්මාණ ශිල්පීන් විසින් භාවිතා කරනු ලබන අදාල මෘදුකාංග / දෘඩාංග හඳුන්වා දීම සහ ඒවායේ තත්වය වැඩිදියුණු කිරීම.

මෝස්තර අංශය සඳහා නවීන ගුණාත්මක මෙවලම් උපකරණ සහ භාණ්ඩ සැපයීම.

### 2 - අලෙවිකරණය

ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් වැඩිදියුණු කරනු ලබන නව හස්ත කර්මාන්ත මෝස්තර නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා නව මෝස්තර නිර්මාණ ප්‍රදර්ශන පැවැත්වීම.

දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපල සඳහා නව හස්ත කර්මාන්ත මෝස්තර නිෂ්පාදන හඳුන්වාදීම සඳහා ඊ කොමර්ස් (විද්‍යුත් වාණිජ) වේදිකාවක් ස්ථාපිත කිරීම සහ එය පවත්වාගෙන යාම.

ප්‍රමුඛපෙලේ හස්ත කර්මාන්ත වෙළඳසැල් සහ මිලදී ගැනීමේ නියෝජිතායතන සමග වෙළඳපොල හා සම්බන්ධ වීමේ වැඩසටහන් පැවැත්වීම.

### 3 - පුහුණු සහ කුසලතා සංවර්ධනය

ප්‍රවීණ සම්පත්දායක පුද්ගලයන්ගේ උපකාරය සහිතව එක් එක් කාණ්ඩය මත පදනම්ව නිෂ්පාදන වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කිරීම.

අවශ්‍යතා සහිත හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන පරිදි රට පුරා ම ගුණාත්මක පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම.

### 4 - පර්යේෂණ සහ සංවර්ධනය

දේශීය විශ්වවිද්‍යාල සහ අනිකුත් අදාල කීර්තිමත් ආයතන සමග සහයෝගීත්වයෙන් පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම.

හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය නගා සිටුවීම සහ දියුණු කිරීම සඳහා නවෝත්පාදන, නව තාක්ෂණයන්, නව යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ මෙවලම් හඳුන්වා දීම.

අත්කම් අමුද්‍රව්‍ය වල හිඟතාවය සහ ඒවා සංරක්ෂණය කිරීම ආශ්‍රිත ගැටලු සඳහා විකල්ප අමුද්‍රව්‍ය සොයාගැනීම සහ වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන පැවැත්වීම.

### 5 - නිර්මාණ සහ නවෝත්පාදන

නවීන ඇසුරුම් සහ සිහිවටන නිර්මාණය

හස්ත නිෂ්පාදන කර්මාන්තය තුලට සහ මෝස්තර නිර්මාණ අධ්‍යාපන අංශය තුලට මෝස්තර නිර්මාණ අංග හඳුන්වා දීම සහ ඇතුලත් කිරීම.

### 6 - ව්‍යාපාරික සැලසුම්

ඩිප්ලෝමා, සහතිකපත්‍ර පාඨමාලා, තෘතීක සහ පශ්චාත් තෘතීක මට්ටමේ උසස් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම සහ ශාස්ත්‍රීය හා වෘත්තීය විශිෂ්ඨ සම්මාන පිරිනැමීම.

අවශ්‍යතාවට ගැලපෙන පරිදි අත්කම් සහ මෝස්තර නිර්මාණ ක්ෂේත්‍රයේ කෙටි පාඨමාලා පැවැත්වීම.

# 27

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)(SLHB)

## 27.1 හැඳින්වීම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය දිවයින පුරා පිහිටා ඇති ප්‍රදර්ශනාගාර දොළහක් (12) හරහා දේශීය හස්ත කර්මාන්ත අලෙවිය ප්‍රවර්ධනය කරයි. මෙම ප්‍රදර්ශනාගාර ජාලය 1964 ආරම්භයේ සිටම සාම්ප්‍රදායික ශිල්පීන්ට තම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අත්‍යාවශ්‍ය වෙළඳපොළ සම්බන්ධතා සපයයි. එම යුගයේ භුක්ති විඳි අතථ්‍ය ඒකාධිකාරී තත්ත්වය හේතුවෙන් සංවෘත ආර්ථිකය යටතේ ලාබ ලබන ආයතනයක් ලෙස ලක්සල පැවති ඇත. 1983 දී, එය 1982 අංක 35 දරන ජාතික ශිල්ප සභාව සහ ඒ ආශ්‍රිත ආයතන පනත යටතට පත් විය.

LAKSALA යනු ස්වයං මූල්‍ය ආයතනයක් වන අතර ශ්‍රී ලංකාව පුරා ගෘහ කර්මාන්ත හරහා නිෂ්පාදනය කරනු ලබන එකම රජය සතු හස්ත කර්මාන්ත අලෙවි කරන ආයතනය වේ.

දැනට ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ (ලක්සල) සමස්ත මෙහෙයුම් ජාතික ප්‍රතිපත්ති රාමුව හා ගැමි පාරම්පරික ශිල්පීන්ගේ පැවැත්මට අනුගත වේ.

ආයතනය සැම විටම කර්මාන්ත අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් යටතේ දක්වා ඇති විශේෂ ප්‍රමුඛතාවලට අනුකූල වන අතර 2030 වසර වන විට සාක්ෂාත් කර ගැනීමට අදහස් කරන ගෝලීය නව ප්‍රමිතියක් වන "තිරසාර සංවර්ධන ඉලක්ක" (SDG's) කෙරෙහි දැඩි උනන්දුවක් දක්වයි.

COVID19 වසංගතය අතරතුර විදේශීය සංචාරකයින් නොපැමිණීම හේතුවෙන් ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) විදේශීය සංචාරකයින් ඉලක්ක කර ගනිමින් තෑගි සහ සිහිවටන අලෙවි කිරීම තුළින් මෙතෙක් උපයා ඇති ආදායම "90% කින් පමණ" පහත වැටී ඇත.

**දැක්ම**

"ශ්‍රී ලංකාවේ තැගි සහ සිහිවටන වෙළඳපොලේ ප්‍රමුඛයා වීමට"

**මෙහෙවර**

"ග්‍රාමීය නිෂ්පාදන සඳහා මෙගා වෙළඳපොළට පිවිසීමට අවස්ථාව උදාකර දෙන, එමගින් තැගි සහ සිහිවටන කාණ්ඩයේ වර්ධන විභවයන් වැඩිදියුණු කර සංචාරක ක්ෂේත්‍රයට වටිනාකමක් එක් කරන වාණිජමය වශයෙන් ශක්‍ය, සමාජ වගකීම් සහිත අලෙවිකරණ සංවිධානයක් වන්න"

**ප්‍රධාන අරමුණු**

(අ) ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම සහ ඒවායේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම ප්‍රවර්ධනය කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත අලෙවිය සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීම.

**ඉලක්ක**

- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මානය කිරීම සහ වටිනාකම් බෙදාහදා ගැනීම
- හොඳම පාරිභෝගික තේරීම් සඳහා බහුවිධ අවස්ථා
- ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය සහ මුදල් සඳහා වටිනාකම
- සේවා විශිෂ්ටත්වය තුළින් අපගේ ගනුදෙනුකරුවන් සතුටු කිරීම

## 27.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

**මූල්‍ය හා භෞතික ප්‍රගතිය**

| සංරචකය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|
| විකුණුම් පිරිවැටුම (රු. මිලියන) | 204.0 |
| ප්‍රදර්ශනාගාර නිෂ්පාදන මිලදී ගැනීම් | 33.3 |
| සැපයුම්කරුගේ ගෙවීම් | 41.2 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)

## 27.3 අනාගත සැලසුම් - 2023

- සුප්‍රසිද්ධ විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම සහ අමතර විකුණුම් ආදායමක් උපයා ගැනීම.
  උදා-GLOBAL VILLAGE, DUBAI EXPO.
- අමතර ආදායමක් ලබා ගැනීම සඳහා JV (ඒකාබද්ධ ව්‍යාපාර) ව්‍යාපාර හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීමෙන් අතිරික්ත සම්පත් සහ අතිරික්ත ඉඩ පරිවර්තනය කර ගැනීම.
- Omni-channel අත්දැකීමක් සහිත e-commerce වේදිකාවක් ක්‍රියාත්මක කිරීම.
- අනෙකුත් ප්‍රමුඛ පෙළේ මාර්ගගත වේදිකා සමඟ අත්වැල් බැඳගෙන LAKSALA නිෂ්පාදන පරාසය ප්‍රවර්ධනය කිරීම.
  උදා- Daraz, ikman
- වෙළඳ භාණ්ඩ/සැපයුම් දාමය ශක්තිමත් කිරීම සහ වෙළඳපොළට නව්‍ය නිෂ්පාදන හඳුන්වා දීම.

# 28

# ජාතික ශිල්ප සභාව (NCC)

## 28.1 හැඳින්වීම

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභසාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

### දැක්ම

“තිරසාර පැවැත්ම උදෙසා හෙළ අත්කම් පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම”

### මෙහෙවර

“සාම්ප්‍රදායික සහ සංස්කෘතික වටිනාකමක් ඇති දේශීය හස්ත කර්මාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, දිරිගැන්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ශිල්පීන්ගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම”

### ප්‍රධාන ඉලක්කය

දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය වැඩිකර හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ජීවන මට්ටම ඉහළ නංවා ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීමට හැකි උපරිමයෙන් දායක වීම.

### අරමුණු / ඉලක්ක

1.දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය 50% කින් ඉහළ නැංවීම.

2.අපනයන අභිමුඛ හස්ත කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිත ව්‍යවසායකයින් 1000ක් බිහි කිරීම.

3.හස්ත කර්මාන්ත නිෂ්පාදන අපනයනය කිරීම තුළින් විදේශ විනිමය රුපියල් මිලියන 2000 කින් ඉහළ නැංවීම හා ආනයන ආදේශක නිෂ්පාදන හඳුන්වා දීම තුළින් විදේශ විනිමය රුපියල් මිලියන 5000 කින් ගලා යෑම අවම කිරීම.

4.හස්ත කර්මාන්ත ශිල්පීන් හා ආධුනිකයින් 7500 කට පුහුණුව ලබා දී, ස්වයං රැකියා 5000 ක් ජනිත කිරීම.

5."දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කිරීම"සඳහා හස්ත කර්මාන්තකරුවන්ට මූල්‍ය, වෙළඳපොල, පුහුණුව, යටිතල සහ අනෙකුත් පහසුකම් සැලසීම.

6.ප්‍රවීණ සහ පාරම්පරික හස්ත කර්මාන්ත ශිල්පීන් ඇගයීම, දිරිගැන්වීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

## 28.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

### ශිල්පීය පුහුණු ව්‍යාපෘතිය

දිස්ත්‍රික් 19ක් ආවරණය වන පරිදි ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 90 ක් ජාතික ශිල්ප සභාව යටතේ ස්ථාපිත කර ඇත. මෙම වසරේ දී එම මධ්‍යස්ථාන හරහා පූර්ණකාලීනව ආධුනිකයින් 623ක් පුහුණුව ලබමින් සිටින අතර නිෂ්පාදන පහසුකම් ලබන ශිල්පීන් සංඛ්‍යාව 280 දෙනෙකු වේ. (වියදම රු.මි. 2.9)

### ශිල්ප සුභසාධන වැඩසටහන

මෙම වැඩසටහන යටතේ වයස්ගත ශිල්පීන්, ආබාධිත මට්ටමේ ශිල්පීන් සඳහා ආධාර ලබා දීම මෙන්ම ඒ ඒ අවස්ථාවල දී ශිල්පීන් විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා (සැත්කම්, හෘදයාබාධ, අක්ෂි රෝග හා විශේෂ සැත්කම් ආදී) ශිල්ප සුභ සාධන ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රතිචාර දැක්වීම සිදු කරනු ලබයි.

මෙම වැඩසටහන යටතේ මෙම වසරේ දී ශිල්පීන් 54දෙනෙකු සඳහා පහසුකම් සලසා ඇත.

(වියදම රු.මි. 1.25)

### හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සහ පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම

හස්ත කර්මාන්ත ශිල්පීන්ට ජාතික ශිල්ප සභා ලියාපදිංචිය ලබා දී නව හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙමගින් අපේක්ෂිතය. (වියදම රු.මි.0.52). මෙහි දී,

- හස්ත කර්මාන්ත ශිල්පීන් 1734 දෙනෙකු ලියාපදිංචි කර ඇත (Google form -1260+474)
- නව හැඳුනුම්පත් 5221ක් නිකුත් කර ඇත.
- සමස්ත ශිල්පීන් සංඛ්‍යාව - 20666

### "ලක් ශිල්ප සිලෝන් හැන්ඩික්‍රාෆ්ට්" අපනයන අභිමුඛ නිර්මාණ තරඟය/ නිෂ්පාදන හා පහසුකම් සැලසීමේ වැඩසටහන

හස්ත කර්මාන්ත ආශ්‍රිත නිර්මාණකරණයේ යෙදෙන කර්මාන්තකරුවන් අපනයන වෙළඳපොල අභිමුඛ නිෂ්පාදන කටයුතු සිදු කරන ග්‍රාමීය කර්මාන්තකරුවන් / ව්‍යවසායකයන් බිහිකිරීමේ මූලික අරමුණ ඇතිව ග්‍රාමීය කර්මාන්ත අංශයෙන් රට තුළට ගලා එන විදේශ විනිමය ප්‍රමාණය වැඩි කිරීම හා කර්මාන්ත අංශයක් ලෙස අපනයන සංයුතිය තුළ ග්‍රාමීය කර්මාන්තවල දායකත්වය ඉහළ නංවා ව්‍යවසායකත්ව හා නිර්මාණශීලී හැකියාවෙන් යුත් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිතය. (වියදම රු.මි.0.6)

## 28.3 අනාගත සැලැසුම් - 2023

- ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත අපනයන අභිමුඛ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදන අලෙවි කිරීම සඳහා විද්‍යුත් අලෙවිකරණ **(E-Commerce)** ක්‍රමවේදයන් හඳුන්වා දීම සහ දේශීය, විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- හස්ත කර්මාන්ත ආශ්‍රිත ආනයනික භාණ්ඩ සඳහා ආදේශන නිෂ්පාදන දිරිමත් කිරීම.

# 29

# සීමාසහිත ලංකා සළුසල (LSL)

## 29.1 හැඳින්වීම

වර්ෂ 1967 ඔක්තෝම්බර් මස 01 වන දින ශ්‍රී ලංකා රජයේ වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව ලෙස ස්ථාපනය වූ සළුසල ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වූයේ දේශීය නිෂ්පාදනය නගා සිටුවීම හා දේශීය රෙදිපිළි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සැපයීමේ පුරෝගාමියා වීම සහ ශ්‍රී ලංකාව තුළ රෙදිපිළි කර්මාන්තයේ නියැළී සිටින කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් ඉහළ තලයකට පැමිණීම සඳහා පූර්ණ සහයෝගය ලබාදීමයි.

මෙහි ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කරගැනීම සඳහා 1991.11.28 වන දින සී/ස ලංකා සළුසල සමාගමක් ලෙස ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් වෙළඳ ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව 1991.12.21 වන දින පලකරන ලද ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (රෙදිපිළි) නීතිගත සංස්ථාව වත්කම්, වගකීම් සහ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු මෙම සමාගමට පවරන ලදි.

### දැක්ම

රාජ්‍ය අංශයේ සහ පුද්ගලික (SME) අංශයේ රෙදි සහ රෙදිපිළි අවශ්‍යතා සැපයීමේ ප්‍රමුඛ ආයතනය වීම සහ පාරිභෝගික වෙළඳපොලේ වඩාත්ම විශ්වාසදායක සන්නාමය වීම.

### මෙහෙවර

දේශීය හා විදේශීය විලාසිතා ප්‍රදර්ශනාගාර ජාලය හරහා ඉතා ඉහළ ගුණත්වයෙන් යුතු හා නවීන විලාසිතාවන්ගෙන් යුතු අත් යන්ත්‍ර රෙදිපිළි, බතික් නිෂ්පාදන තරඟකාරී මිලක් යටතේ කාර්යක්ෂමව හා සඵලදායීව අලෙවි කිරීම තුලින් දේශීය හා විදේශීය පාරිභෝගික ප්‍රජාවට තෘප්තියක් ලබා දීම සහ රාජ්‍ය සහ

පෞද්ගලික අංශවල ආයතනික රෙදිපිළි සහ අනෙකුත් අවශ්‍යතා සපුරාලිය හැකි යාන්ත්‍රණයක් සකස් කිරීම.

### අරමුණු

1. නිෂ්පාදන ආශ්‍රිත යටිතල පහසුකම් සහ සැලසුම් සංවර්ධනය සඳහා පහසුකම් සපයන අග්‍රස්ථ රාජ්‍ය ආයතනය ලෙස ක්‍රියා කිරීමෙන්,දේශීය අත්යන්ත්‍ර, බතික් සහ ඇඟලුම් සඳහා වෙළෙඳපොළ අවස්ථා දියුණු කිරීම තුළින් දේශීය නිෂ්පාදකයින්ට නිෂ්පාදනය ඉහළ නැංවීමට අවස්ථාවක් උදාකර දෙන අතර, එමඟින් ග්‍රාමීය ආර්ථිකයේ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ සංවර්ධනයට දායක වේ.
2. පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කර්මාන්ත ශාලා විවෘත කිරීම මගින් මහා පරිමාණ දේශීය නිෂ්පාදන ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම මගින් නිල ඇඳුම් ආනයනය සහ අනෙකුත් ද්‍රව්‍ය අවශ්‍යතා සඳහා වැය වන රජයේ මුදල් ඉතිරි කිරීම.
3. රාජ්‍ය අංශයේ සංවිධානවල (B2G) සියලුම රෙදිපිළි, රෙදිපිළි සහ අදාළ අවශ්‍යතාවල එකම සැපයුම්කරු වීම.
4. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ශිල්පීන් සඳහා නිෂ්පාදනය සඳහා සහ අනෙකුත් සැපයුම්කරුවන් සඳහාත් කර්මාන්තය තුළ නිෂ්පාදනය සඳහා ඉඩකඩ සැපයීම.
5. දැරිය හැකි මිලකට ගුණාත්මක ද්‍රව්‍ය ලබා දීමෙන් දේශීය සහ විදේශීය වෙළෙඳපොළ තුළ පාරිභෝගිකයන් සඳහා වඩාත්ම විශ්වාසදායක සන්නාමය වීම.
6. දේශීය සහ එතෙර වෙළඳපළ නඟා සිටුවීමට සහ නංවාලීමට රෙදිපිළි, ඇඟලුම් සහ බතික් අත්යන්ත්‍ර කර්මාන්ත නියාමනය කිරීමට පෙරමුණ ගැනීම.
7. රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන වියදම් ඉවත් කිරීම මගින් JV සහ PPP වලට පිවිසීමෙන් කර්මාන්තයේ වෙනසක් ඇති කිරීම.
8. අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා කලාපයේ සහ විදේශීය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත බතික් අත්යන්ත්‍ර සහ ඇඟලුම් ප්‍රවර්ධනය කිරීම තුළින් රටේ ඩොලර් සංචිත ඉහළ නැංවීම.

## 29.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

**ආදායම් ප්‍රකාශනය**
**2022 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා**

| | | | |
|---|---|---|---|
| 1 | පිරිවැටුම | | 47,106,270.41 |
| | **අඩු කළා** | | |
| 2 | විකුණුම් බඩුවල පිරිවැය | | (32,974,389.29) |
| | **දළ ලාභය** | | 14,131,881.12 |
| | | | |
| 3 | වෙනත් ආදායම් | 1,077,200.00 | |
| | කුළී ආදායම් | 2,000,000.00 | 3,077,200.00 |
| | | | 17,209,081.12 |
| | **අඩු කළා : වියදම්** | | |
| 4 | අලෙවි හා බෙදා හැරීම් | (676,646.81) | |
| 5 | පරිපාලන වියදම් | (8,125,300.00) | |
| | මූල්‍ය වියදම් | (10,375.00) | (8,812,321.81) |
| | **ශුද්ධ ලාභය** | | **8,396,759.31** |

මූලාශ්‍රය: සී/ස ලංකා සළුසල

කෙසේ වෙතත්, මේ වන විට ආයතනය සඳහා ප්‍රාග්ධන ගලා ඒමක් අවශ්‍යව ඇති අතර එමඟින් සළුසල මීළඟ මට්ටම දක්වා ඔසවා තැබීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත හැක.

එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සභාපතිවරයාගේ කැපවීම මත මෙන්ම සළුසල ආයතනයේ සේවක

මණ්ඩලයේ කැපවීම මත මෙම ජයග්‍රහණය ලබා ගැනීමට හැකි වූ බව ද විශේෂත්වයකි.

ලංකා සළුසල දැන් පාඩු ලබන සහ සිය මෙහෙයුම් කටයුතු සඳහා භාණ්ඩාගාරය මත යැපෙන රාජ්‍ය ආයතන ලැයිස්තුවෙන් ඉවත් කිරීමට හැකියාව ලැබී ඇත.

## 29.3 අනාගත සැලැසුම් - 2023

1. පේෂකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවයෙන් වසා දැමීමේ මෙහෙයුම් නැවත විවෘත කිරීම - ගලගෙදර සළුසල නිෂ්පාදන මධ්‍යස්ථානය.

2. සළුසල දේපල නැවත පවරා ගැනීම – මුල්ලේරියාව | තලංගම | රත්නපුර | අම්පාර | බේරුවල.

3. දේශීය හා විදේශීය පාරිභෝගිකයින්ගේ පහසුව සඳහා ඊ-වාණිජ්‍යය සක්‍රීය වෙබ් අඩවියක් දියත් කිරීම.

4. ජාවත්ත ප්‍රදර්ශනාගාරය නැවත ආරම්භ කිරීම සහ නුගේගොඩ ප්‍රදර්ශනාගාරය විධිමත් කිරීම.

5. නව මෝස්තර ප්‍රවර්ධනය කිරීම සහ වෙළඳපොලේ ඉහළම තලයේ සළුසල අලෙවි කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික නිර්මාණ මධ්‍යස්ථානය සමඟ සාරි 100 ක ව්‍යාපෘතියක් දියත් කිරීම.

6. උසස් මට්ටමේ සාරි ප්‍රදර්ශන සහ අලෙවි කුටි - මහනුවර, BMICH, LAKSALA, Colombo City Center පැවැත්වීම.

7. සළුසල විසින් විනයානුකූලව සකස් කරන ලද අට පිරිකර හඳුන්වා දීම.

8. රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය රෙදිපිළි සැපයීම - උදා. සන්නද්ධ හමුදා,බෞද්ධ කටයුතු අමාත්‍යාංශය, රෝහල්, විශ්වවිද්‍යාල ආදිය.

9. සමාජ මාධ්‍ය වේදිකා දියත් කිරීම - ෆේස්බුක්, ඉන්ස්ටග්‍රෑම්.

10. එතෙර වරලත් අලෙවි ප්‍රදර්ශනාගාර විවෘත කිරීම - ඉන්දියාව - සිදූ, රෝමය, පැරිස්, මොස්කව් - 2022. ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය - 2023

11. සළුසල සමස්ත ප්‍රතිසංස්කරණ සැලැස්ම සඳහා සංවර්ධන සැලැස්ම දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

12. එරාවුර්හි නැගී එන රෙදිපිළි කලාපයට සහාය වීම සඳහා පුද්ගලික අංශය සමඟ සහයෝගයෙන් අක්කර 20,000 කපු වගා ව්‍යාපෘතිය.

13. ප්‍රමුඛ කාන්තා කාර්ය මණ්ඩලයේ අනුමැතිය සහිතව සළුසල සමාජ මාධ්‍ය නාලිකා දියත් කිරීම.

14.හෝටල් ඉලක්ක කර ගනිමින් ලංකා සළුසල යටතේ අභ්‍යන්තර කටයුතු අංශයක් සංවර්ධනය කිරීම

# 30

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)

## 30.1 හැඳින්වීම

1993 අංක 50 දරණ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරි පනත මඟින් ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය, නියාමනය සහ ප්‍රවර්ධනය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පිහිටුවා ඇත. ඒ අනුව මැණික් නිධි සහ මැණික් පතල් හඳුනාගැනීම, ස්වර්ණාභරණ වෙළඳාම, අගය වර්ධනය, මැණික් වල අගය එකතු කිරීම හා තක්සේරු පහසුකම් සැලසීම යන කාර්යයන් සිදු කරනු ලබයි.

තව දුරටත් මැණික් සහ ස්වර්ණාභරණ සඳහා පර්යේෂණ කිරීම, පර්යේෂණාගාර සේවා, තත්ත්ව මුද්‍රා තැබීම, ස්වර්ණාභරණ වල මුද්‍රා තැබීම, අපනයනය කිරීම සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොලවල් කරා යොමු වෙමින් අලෙවිකරණ ප්‍රවර්ධනය යන කාර්යයන් ද සිදු කරනු ලබයි. මීට අමතරව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි නියුතු සහ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් දෛර්යමත් කිරීම, පහසුකම් සැපයීම, ඒ සඳහා අදාල වන්නා වූ දැනුම වර්ධනය කිරීම යන ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ කාර්යයන් වල ද නිරතව සිටී. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ ව්‍යාපාරික ආකෘතිය, ස්වාධීනව නැගීසිට ස්වයං මූල්‍ය ස්ථාවරත්වය සහ රජය තුල තිරසාර බවින් යුත් අධිකාරිය යන සංකල්පය මත පදනම් වී ඇත.

### දැක්ම

ශ්‍රී ලංකාව ලෝකයේ නිල් මැණික් අගනුවර බවට පත් කිරීම.

### මෙහෙවර

ජාතික ධනය සහ කර්මාන්තයේ කොටස්කරුවන්ගේ ප්‍රසාදය ඇති කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රවර්ධනය සහ නීතිගත කිරීම තුලින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ලඟා කර ගැනීම.

### ප්‍රධාන අරමුණු

- මැණික් සහ ස්වර්ණාභරණ අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් බිලියන 1.6 ක් දක්වා වැඩි කිරීම.

- සාධාරණ මැණික් පතල් කැණීමේ සහ වෙළඳාම් ක්‍රමවේදය සංවර්ධනය කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල රන් ප්‍රමාණය නිශ්චය කිරිමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- මැණික් පරික්ෂා කිරිමේ සහ සහතිකරණය
- සඳහා ශක්තිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය මිණුම් ලක්ෂයට ගෙන ඒම.
- තරු පංතියේ ආයතනයක් බිහි කිරිම සහතික කිරිම.

## 30.2 ප්‍රගතිය (2022 සැප්තැම්බර් මස අවසානයට)

### මූල්‍ය ප්‍රගතිය

| විස්තරය (රු.මි) | ප්‍රගතිය |
|---|---|
| ආදායම | 546.9 |
| වියදම | 331.9 |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | 215.0 |

මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

### ආදායම

| විස්තරය (රු.මි) | ආදායම (රු.මි) |
|---|---|
| අපනයන ආදායම | 194.16 |
| මැණික් ගැරීම් බලපත්‍ර | 30.10 |
| වෙළඳ බලපත්‍ර | 50.62 |
| මැණික් කැපුම් බලපත්‍ර | 0.21 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 1.02 |
| වැටලීම් | 6.63 |
| ඉඩම් වෙන්දේසි | 38.27 |
| ර.ප්‍ර.නි | 15.12 |
| මැණික් රසායනාගාරය | 6.34 |

මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

### අපනයන ආදායම්

| මුළු අපනයන (ඇ.ඩො .මි) | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් | 132 | 350 |
| ස්වර්ණාභරණ | 9 | 28 |
| දියමන්ති ප්‍රතිඅපනයන | 144 | 170 |
| රළු ආනයන ප්‍රතිඅපනයන (මැණික්) | 3.40 | 5.67 |
| දියමන්ති එබ්බවූ ස්වර්ණාභරණ | 1.21 | 5.67 |
| ගෙවුඩ/ගෙවුඩ කට්ට | 0.05 | 0.01 |
| මුළු අපනයන | 290 | 560 |

මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

### බලපත්‍ර නිකුත් කිරීම

| බලපත්‍ර වර්ගය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් ගැරීම් බලපත්‍ර | 3648 | 4,295 |
| වෙළඳ බලපත්‍ර මැණික් | 4912 | 4,550 |
| කැපුම් බලපත්‍ර මැණික් | 125 | 215 |
| වෙන්දේසි බලපත්‍ර | 467 | 485 |
| වැටලීම් | 524 | 585 |

මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

### වෙනත් ආදායම්

| | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| මැණික් රසායනාගාරය | 5,897 | 10,450 |
| රන් ප්‍රමාණය නිශ්චය කිරීම | 19,367 | 69,750 |

මූලාශ්‍රය: ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

